75 වන කාණ්ඩය
11 වන කලාපය

සඳුද
1967 නොවැම්බර් 20

# පාර්ලිමේන්තු විවාද

(හැන්සාඩ්)

## නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ

## නිල වාර්තාව

### අන්තර්ගත ප්‍රධාන කරුණු

අග්‍රාණ්ඩුකාරතුමාගෙන් ලත් සන්දේශය [තී. 2289]

ප්‍රශ්නවලට වාචික පිළිතුරු [තී. 2292]

ශෝක ප්‍රකාශය : ඩී. ඒ. රාජපක්‍ෂ මහතා [තී. 2325]

පළමුවන වර කියවන ලද පනත් කෙටුම්පත් [තී. 2334] :
- ලංකා ගුවන් සේවා (සංශෝධන) පනත් කෙටුම්පත
- සාමාන්‍ය හා කාර්මික අධ්‍යාපන පනත් කෙටුම්පත
- ව්‍යාපාර ලියාපදිංචි කිරීමේ (අධිකාරයෙන් නිදහස් කිරීම) පනත් කෙටුම්පත

ලංකා (පාර්ලිමේන්තු මැතිවරණ) රාජාඥාව පිළිබඳ විශේෂ කාරක සභාව [තී. 2336]

කල් තැබීමේ යෝජනාව [තී. 2365] :
- විශ්ව විද්‍යාලවල පවතින නොසන්සුන් තත්ත්වය

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

தொகுதி 75
இல. 11

திங்கட்கிழமை
20 நவம்பர் 1967

# பாராளுமன்ற விவாதங்கள்

(ஹன்சாட்)

## பிரதிநிதிகள் சபை

அதிகார அறிக்கை

பிரதான உள்ளடக்கம்

மகாதேசாதிபதியிடமிருந்து வந்த செய்தி [ப. 2289]

வினாக்களுக்கு வாய்மூல விடைகள் [ப. 2292]

அனுதாபத் தீர்மானம் : திரு. டீ. ஏ. ராஜபக்ஷ [ப. 2325]

முதல்முறை மதிப்பிடப்பட்ட மசோதாக்கள் [ப. 2334] :
இலங்கை வானூர்திச் சேவை (திருத்த) மசோதா
பொதுக்கல்வி, தொழில்நுட்பக் கல்வி மசோதா
வியாபாரப் பதிவு (மேலதிகக் கட்டணத்திலிருந்து விலக்களித்தல்) மசோதா

இலங்கை (பாராளுமன்றத் தேர்தல்கள்) அரசவைக் கட்டளை மீதான தெரிகுழு [ப. 2336]

ஒத்திவைப்புப் பிரேரணை [ப. 2365] :
பல்கலைக் கழகங்களில் நிலவும் அமைதியின்மை

---

Volume 75
No. 11

Monday
20th November 1967

# PARLIAMENTARY DEBATES

(HANSARD)

## HOUSE OF REPRESENTATIVES

OFFICIAL REPORT

PRINCIPAL CONTENTS

MESSAGE FROM THE GOVERNOR-GENERAL [Col. 2289]

ORAL ANSWERS TO QUESTIONS [Col. 2292]

VOTE OF CONDOLENCE : MR. D. A. RAJAPAKSA [Col. 2325]

BILLS READ THE FIRST TIME [Col. 2334]
Air Ceylon (Amendment) Bill
General and Technical Education Bill
Business Registration (Exemption from Surcharge) Bill

SELECT COMMITTEE ON CEYLON (PARLIAMENTARY ELECTIONS) ORDER IN COUNCIL [Col. 2336]

ADJOURNMENT MOTION [Col. 2365] :
Prevailing unrest at Universities

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

# නියෝජිත මන්ත්‍රී මණ්ඩලය

## பிரதிநிதிகள் சபை

## *House of Representatives*

**1967 නොවැම්බර් 20 වන සඳුදා**

திங்கட்கிழமை, 20 நவம்பர் 1967

*Monday, 20th November 1967*

---

**අ. භා. 2 ට මන්ත්‍රී මණ්ඩලය රැස් විය. කථානායක තුමා [ගරු එස්. සී. ෂර්ලි කොරයා] මූලාසනාරූඪ විය.**

சபை, பி. ப. 2 மணிக்குக் கூடியது. சபாநாயகர் அவர்கள் [கௌரவ எஸ். சி. ஷேளி கொறயா] தலைமை தாங்கினார்கள்.

*The House met at 2* P.M., MR. SPEAKER [THE HON. S. C. SHIRLEY COREA] *in the Chair.*

---

## අග්‍රාණ්ඩුකාර තුමාගෙන් ලත් සන්දේශය

## மகா தேசாதிபதியிடமிருந்து வந்த செய்தி

## MESSAGE FROM THE GOVERNOR-GENERAL

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)

I have received the following Message from His Excellency the Governor-General :

" අග්‍රාණ්ඩුකාර කාර්‍යාලය

රජ වාසල,
කොළඹ,
ශ්‍රී ලංකාව,
1967 නොවැම්බර් 17.

ගරු කථානායක,

1959 අංක 8 දරන පනතින් සංශෝධනය කරනු ලැබූ (40 වෙනි අධිකාරය වන) මහාජන ආරක්ෂක ආඥා පනතේ 2 වෙනි වගන්තිය යටතේ 1967 ක්වූ නොවැම්බර් 17 වැනි දාතමින් නිකුත් කරනු ලැබූ ප්‍රකාශනය මගින් ඉහත කී ආඥාපනතේ II වෙනි කොටසේ විධිවිධාන 1967 නොවැම්බර් 18 වැනි දින ක්‍රියාත්මක විය යුතු බව මවිසින් ප්‍රකාශ කරන ලදී.



Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

අග්‍රාණ්ඩුකාර තුමාගෙන් ලත් සන්දේශය

ප්‍රකාශනය නිකුත් කිරීමට හේතුව මහාජන සාමය ආරක්ෂා කිරීම හා ජනතාවගේ ජීවිතයට අත්‍යවශ්‍ය වූ සැපයීම් හා සේවාවන් පවත්වාගෙන යාම සඳහාවූ බව නියෝජිත මන්ත්‍රී මණ්ඩලය වෙත මම මෙයින් දැනුම් දෙමි.

ඩබ්ලිව්. ගොපල්ලව,
අග්‍රාණ්ඩුකාරවරයා.

නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ
ගරු කථානායකතුමා."

" மகா தேசாதிபதியின் கந்தோர்

இராணி மாளிகை,
கொழும்பு, இலங்கை.
1967, நவம்பர் 17.

கௌரவ சபாநாயகர் அவர்களே,

1959 ஆம் ஆண்டின் 8 ஆம் இலக்கச் சட்டத்தினால் திருத்தப்பட்டபடியான (40 ஆம் அத்தியாயமான) பொதுசனப் பாதுகாப்புக் கட்டளைச் சட்டத்தின் 2 ஆம் பிரிவின் கீழ் வெளியிடப்பட்ட 1967 நவெம்பர் 17 ஆம் திகதிப் பிரசித்தத்தின் மூலம் மேற்கூறப்பட்ட கட்டளைச் சட்டத்தின் II ஆம் பிரிவில் சொல்லப்பட்ட ஏற்பாடுகள் 1967 நவெம்பர் 18 ஆம் திகதி அமுலுக்கு வருமென்று நான் பிரகடனப்படுத்தியிருக்கிறேன்.

இப்பிரசித்தத்தை வெளியிட்டதற்கு நியாயம் பொதுசன ஒழுங்கை நிலைநாட்டுவதற்கும் சமுதாயத்தின் சீவியத்திற்கு அத்தியாவசியமான வழங்குதல்களையும் சேவைகளையும் பாதுகாப்பதற்கு மென்பதை இத்தால் பிரதிநிதிகள் சபைக்கு வெளிப்படுத்துகிறேன்.

டபிள்யூ. கொபல்லவ,
மகாதேசாதிபதி.

கௌரவ பிரதிநிதிகள் சபை சபாநாயகர் அவுர்கட்கு. "

" Governor-General's Office

Queen's House,
Colombo,
Ceylon,
17th November, 1967.

MR. SPEAKER,

By PROCLAMATION dated 17th November, 1967, and issued under Section 2 of the Public Security Ordinance (Cap. 40), as amended by Act No. 8 of 1959, I have declared that the provisions of Part II of the aforesaid Ordinance shall come into operation on 18th November 1967.

I do hereby communicate to the House of Representatives that the reason for issuing the Proclamation is for the preservation of public order and for the maintenance of supplies and services essential to the life of the community.

W. GOPALLAWA,
GOVERNOR-GENERAL.

The Honourable the Speaker of the House of Representatives. "

## ලිපි ලේඛනාදිය පිළිගැන්වීම

சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்

PAPERS PRESENTED

Regulation made under Section 49 of the Registration of Documents Ordinance (Cap. 117).—[*The Hon. D. P. R. Gunawardena on behalf of the Minister of Home Affairs.*]

සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.

சபாபீடத்தில் இருக்க கட்டளையிடப்பட்டது.

*Ordered to lie upon the Table.*

1. 1967 මාර්තු 31 වැනිදායින් අවසන් වන අවුරුද්දේ ලංකා සංවර්ධන මුදල් සංස්ථාවේ වාර්ෂික වාර්තාව සහ ගිණුම්.

2. ලංකා සංවර්ධන මුදල් සංස්ථාවේ එකොළොස් වන වාර්ෂික මහා සභා රැස්වීමේ වාර්තාව.—[ගරු යූ. බී. වන්නිනායක.]

සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.

சபாபீடத்தில் இருக்க கட்டளையிடப்பட்டது.

*Ordered to lie upon the Table.*

Estimates of Income and Expenditure of the Ceylon Tea Propaganda Board for 1967 (revised) and 1968.—[*Mr. S. A. Peeris.*]

සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.

சபாபீடத்தில் இருக்க கட்டளையிடப்பட்டது.

*Ordered to lie upon the Table.*

By-laws made under Sections 152 and 156 of the Town Councils Ordinance (Cap. 256).—[*Mr. R. Premadasa.*]

සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.

சபாபீடத்தில் இருக்க கட்டளையிடப்பட்டது.

*Ordered to lie upon the Table.*

## 51 (4) වන ස්ථාවර නියෝගය යටතේ පිළිගන්වන ලද වාර්තාව

நிலையற்கட்டளை இல. 51(4) இன்படி சமர்ப்பிக்கப்பட்ட அறிக்கை

REPORT PRESENTED UNDER STANDING ORDER No. 51 (4)

"Bill to incorporate the Galle Municipal Staffs Benevolent Association" නමැති කෙටුම්පත් පනත පිළිබඳ වාර්තාව—[ආර්. ප්‍රේමදාස මයා.]

පනත් කෙටුම්පත 1967 නොවැම්බර් 21 වන අඟහරුවාදා දෙවන වර කියවිය යුතුයයි නියෝග කරන ලදී.

மசோதா, 1967 நவம்பர் 21, செவ்வாய்க்கிழமை இரண்டாம் முறை மதிப்பிடப்படக் கட்டளையிடப்பட்டது.

*Bill ordered to be read a Second time upon Tuesday, 21st November 1967.*

## ප්‍රශ්නවලට වාචික පිළිතුරු

வினாக்களுக்கு வாய்மூல விடைகள்

ORAL ANSWERS TO QUESTIONS

### අගලවත්තේ පහළහෙවෙස්සට වෛද්‍ය පහසුකම්

பஹல ஹேவஸ்ஸ, அகலவத்த : வைத்திய வசதி

PAHALA HEVESSA, AGALAWATTA : MEDICAL FACILITIES

1. ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා (අගලවත්ත)
(கலாநிதி கொல்வின் ஆர். டி சில்வா—அகலவத்த)
(Dr. Colvin R. de Silva—Agalawatta)

සෞඛ්‍ය ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) අගලවත්ත කොට්ඨාශයේ පහළහෙවෙස්ස ගමේ බෙහෙත් දීම කරගෙන ගිය පුරුද්ද මෙයට අවුරුදු 3 කට පමණ පෙර අත්හැරිය බව එතුමා දන්නේද? (ආ) ඉන්පසුව බෙහෙත් ගැනීමට පහළහෙවෙස්සේ ජනයාට සැතපුම් 5ක් 6ක් දුරින් පිහිටි මීගහතැන්නේ රෝහලට යන්ට සිදු වුනු බව එතුමා දන්නේද? (ඉ) මීගහතැන්න රෝහලෙන් බෙහෙත් ගැනීමට සමහර දින වල උදේ සිට සවස් වනතුරු සිටීමට සිදුවී තිබෙන බව පහළහෙවෙස්සේ ජනතාව 25.8.67 දින දරණ පෙත්සමකින් එතුමාට දැනුම්දී තිබේද. (ඊ) පෙර පැවතුනු ක්‍රමයට පහළහෙවෙස්සේ බෙහෙත් දීමට වැඩ පිළිවෙළ ආපසු යොදන්ට එතුමා සූදානම් ද? (උ) එසේ ආරම්භ කරනවා නම් බලාපොරොත්තු වෙන්ට පුළුවන් කවදාද?

சுகாதார அமைச்சரைக் கேட்ட வினா: (அ) அகலவத்த தொகுதியில் பஹல ஹேவஸ்ஸ கிராமத்தில் மருந்து வழங்குவதற்குப் பின்பற்றப்பட்டுவந்த வழக்கம், கடந்த 3 ஆண்டுகளுக்கு முன் கைவிடப்பட்டதை அவர் அறிவாரா? (ஆ) அதன் பிறகு பஹல ஹேவஸ்ஸ மக்கள் மருந்து வாங்க 5, 6 மைல் தூரத்திலுள்ள மீகாதென்னை மருத்துவ மனைக்குப்

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

போகவேண்டியிருப்பதை அவர் அறிவாரா? (இ) மீகாதென்னை மருத்துவமனையில் மருந்து பெறுவதற்கு சில தினங்களில் காலையிலிருந்து மாலை வரை இருக்க வேண்டி நேரிடுகிறதென பஹலஹேவஸ்ஸ மக்கள் 25.8.67 எனத் தேதியிடப்பட்ட மனுவின் மூலமாக அவருக்குத் தெரிவித்திருக்கிறார்களா? (ஈ) முன் பின் பற்றப்பட்ட முறையில் பஹலஹேவஸ்ஸ கிராமத்திலேயே மீண்டும் மருந்து வழங்க அவர் தயாராயிருக்கிறாரா? (உ) அவ்விதம் ஆரம்பிக்கிறரெனில், அந்நடவடிக்கையை எப்பொழுது எதிர்பார்க்கலாம்?

asked the Minister of Health: (*a*) Is he aware that the practice of providing medical treatment at the Pahala Hevessa village in the Agalawatta electorate was abandoned about 3 years ago? (*b*) Is he aware that thereafter the people of Pahala Hevessa were compelled to go to the Meegahatenne Hospital situated 5 or 6 miles away, to obtain treatment? (*c*) Have the people of Pahala Hevessa informed him by petition dated 25.8.67 that on certain days they have to wait at the Meegahatenne Hospital from morning till evening to obtain treatment? (*d*) Is he prepared to make arrangements for medical treatment to be provided again at Pahala Hevessa itself, in the manner in which it was done earlier? (*e*) If so, when would this be started?

**ගරු එම්. ඩී. එච්. ජයවර්ධන (සෞඛ්‍ය ඇමති)**

*(கௌரவ எம். டீ. எச். ஜயவர்த்தன—சுகாதார அமைச்சர்)*

(The Hon. M. D. H. Jayawardena—Minister of Health)

(අ) එසේය. (ආ) නැත. පහළ හෙවෙස්ස ගම්වැසියන්ට සේවය පිණිස පැලවත්ත හන්දියේ ශාඛා බෙහෙත් හලක් ඇත. ඊට ඇත්තේ සැතපුම් දෙකක් පමණි. (ඉ) මේ කරුණ පිළිබඳ දුක්ගැනවිලි කිසිත් ලැබී නැත. (ඊ) මේ පෙදෙසට සැතපුම් දෙකක් එහායින් පිහිටි පැලවත්ත මැදි බෙහෙත් හලේ සේවය ලැබෙන හෙයින් මෙවැනි වැඩ පිළිවෙලක් වුවමනා නැත. (උ) (ඊ) යටතේ මා දුන් පිළිතුර මෙයටද අදාළ වේ.

## ගුරුවරුන්ගේ විශ්‍රාම වැටුප් ප්‍රමාද

ஆசிரியர் : இளைப்பாற்றுச் சம்பளத் தாமதம்

**TEACHERS : PENSION DELAYS**

2. **බී. වයි. තුඩාවේ මයා.** (මාතර)

*(திரு. பி. வை. துடாவ—மாத்தறை)*

(Mr. B. Y. Tudawe—Matara)

අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) විශ්‍රාම යන ඇතැම් ගුරුවරුන්ගේ විශ්‍රාම වැටුප් ලබා ගැනීමේදී අවුරුදු තුන හෝ හතර තරමේ ප්‍රමාදයක් ඇති වන බව එතුමා දන්නවාද? (ආ) එසේ නම් 1968.1.1 දින සිට එබඳු ප්‍රමාදයක් වලක්වා විශ්‍රාමගෙන තෙමසක් ඇතුළත ගුරුවරයෙකුට විශ්‍රාම වැටුප් ලබා ගැනීමට හැකි වන සේ නොවරදින වැඩ පිළිවෙලක් යොදනවාද? (ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

கல்வி, கலாசார விவகார அமைச்சரைக் கேட்ட வினா: (அ) இளைப்பாறும் சில ஆசிரியர்களின் இளைப்பாற்றுச் சம்பளத்தைப் பெறுவதற்கு மூன்று அல்லது நான்கு ஆண்டு காலதாமதம் ஏற்படுவதை அவர் அறிவாரா? (ஆ) அப்படியெனில், 1.1.1968 முதல் அவ்விதக் காலதாமதம் ஏற்படாது, இளைப்பாறி மூன்று மாதத்துக்குள் ஆசிரியர் இளைப்பாற்றுச் சம்பளத்தைப் பெறக்கூடியதாக, பிழை ஏற்படாதவொரு திட்டத்தை வகுப்பாரா? (இ) அப்படியின்றேல், ஏன்?

asked the Minister of Education and Cultural Affairs: (*a*) Is he aware that a delay of about three or four years occurs before certain teachers who go on retirement could get their pension? (*b*) If so, will he implement with effect from 1.1.68 a system to avoid such delays and to ensure the payment of pensions to teachers within three months of their retirement? (c) If not, why?

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ගාමණී ජයසූරිය මයා. (අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු ලේකම්)**

*(திரு. காமனி ஜயசூரிய—கல்வி, கலாசார விவகார அமைச்சரின் பாராளுமன்றக் காரிய தரிசி)*

(Mr. Gamani Jayasuriya—Parliamentary Secretary to the Minister of Education and Cultural Affairs)

(අ) ඔව්. (ආ) විශ්‍රාම වැටුප් ගෙවා බේරුම් කිරීමේ පමාවීම් වළක්වාලීම සඳහා දැනටමත් පියවර ගෙන තිබේ. (ඉ) උද්ගත නොවේ.

**තුඩාවේ මයා.**

*(திரு. துடாவ)*

(Mr. Tudawe)

ඒ ගෙන ඇතැයි කියන පියවරවල් මොනවාද කියා කරුණාකර කියන්නට පුළුවන්ද ?

**ජයසූරිය මයා.**

*(திரு. ஜயசூரிய)*

(Mr. Jayasuriya)

යම් යම් පියවරවල් අරගෙන තිබෙනවා. ඒවා දැනගන්නට කැමති නම් හමු වුණොත් විස්තර කර දෙන්නම්.

**තුඩාවේ මයා.**

*(திரு. துடாவ)*

(Mr. Tudawe)

කරුණාකර ලියවිල්ලකින් එය දැනුම් දෙන්න පුළුවන්ද ?

**ජයසූරිය මයා.**

*(திரு. ஜயசூரிய)*

(Mr. Jayasuriya)

පුළුවන්.

**ටී. බී. එම්. හේරත් මයා.** (වලපනේ)

*(திரு. ரி. பி. எம். ஹேரத்—வலப்பனை)*

(Mr. T. B. M. Herath—Walapane)

විශ්‍රාම වැටුප් ප්‍රමාද වන ගුරුවරුන්ට ඒ කාලය තුළ ජීවත්වීම සඳහා පූර්ව දීමනාවක් දෙන්නට ගරු ඇමතිතුමා කටයුතු කරනවාද ?

**ජයසූරිය මයා.**

*(திரு. ஜயசூரிய)*

(Mr. Jayasuriya)

ඒ අන්දමට වැඩ පිළිවෙළවල් යොදා තිබෙනවා.



## ගුරුවරුන්ගේ වැටුප් ප්‍රමාද

*ஆசிரியர் : வேதனத் தாமதம்*

**TEACHERS : SALARY DELAYS**

3. **තුඩාවේ මයා.**

*(திரு. துடாவ)*

(Mr. Tudawe)

අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය : (අ) ස්ථාන මාරු ලැබුණු විට, ගුරුවරුනට තම වැටුප් ලබා ගැනීමට ඇතැම් විට මාස ගණනක් ගත වන බව දන්නවාද ? (ආ) මෙම ප්‍රමාදයන් වළක්වා ස්ථාන මාරුව ලැබ යන ගුරුවරුනට එම මාසය තුළම ඔවුනට නියමිත වැටුප් ලබාදීමට නොවරදින වැඩ පිළිවෙලක් එතුමා යොදනවාද ? (ඉ) නොඑසේ නම්, ඒ මන්ද ?

*கல்வி, கலாசார விவகார அமைச்சரைக் கேட்ட வினா: (அ) மாற்றம் நிகழும் பொழுது, ஆசிரியர்கள் தமது வேதனத்தைப் பெறுவதற்கு சிலவேளைகளில் பல மாதங்களாகிவிடுகின்றன என்பதை அவர் அறிவாரா? (ஆ) இவ்வித காலதாமதத்தை அகற்றி மாற்றம் பெற்றுச் செல்லும் ஆசிரியர்களுக்கு அந்த மாதத்துக்குள்ளேயே, கிடைக்க வேண்டிய வேதனத்தைப் பெற்றுக் கொடுக்க, பிழையேற்படாத வேலைத்திட்டத்தை அவர் கொண்டு வருவாரா? (இ) அப்படியின்றேல், ஏன்?*

asked the Minister of Education and Cultural Affairs: (*a*) Is he aware that when teachers are transferred it sometimes takes months for them to draw their salary ? (*b*) Will he introduce a system to prevent this delay and to ensure the payment of their proper salary to teachers who go on transfer within the very month in which the transfer is made ? (c) If not, why ?

**ජයසූරිය මයා.**

*(திரு. ஜயசூரிய)*

(Mr. Jayasuriya)

(අ) මෙවැනි තත්ත්වයක් තිබුණු බව දනිමි. (ආ) වැඩ පිළිවෙල යොදා ඇත. (ඉ) ඉහත (ආ) පිළිතුර අනුව පැන නොනඟී.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**තුඩාවේ මයා.**
*(திரு. துடாவ)*
(Mr. Tudawe)
එතැනත් යොදා තිබෙනවා යයි කියන වැඩ පිළිවෙළවල් මොනවාද කියා කියන වාද ?

**ජයසූරිය මයා.**
*(திரு. ஜயசூரிய)*
(Mr. Jayasuriya)
මන්ත්‍රීතුමා ඉල්ලීමක් කළොත් දනුම් දෙන්නම්.

**තුඩාවේ මයා.**
*(திரு. துடாவ)*
(Mr. Tudawe)
ලියවිල්ලකින් දනුම් දෙන්නට පුළු වන්ද ?

**ජයසූරිය මයා.**
*(திரு. ஜயசூரிய)*
(Mr. Jayasuriya)
පුළුවන්.

## ගුරු මාරු මණ්ඩල
ஆசிரியர் மாற்றச் சபைகள்
**TEACHERS' TRANSFER BOARDS**

4. **තුඩාවේ මයා.**
*(திரு. துடாவ)*
(Mr. Tudawe)
අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) ගුරු නියෝජිතයන් සහිත ගුරු මාරු මණ්ඩල පිහිටුවිය යුතුයයි මෙම ගරු සභාව ඒකච්ඡන්දයෙන් සම්මත කළ බව එතුමා දන්නවාද? (ආ) අධ්‍යාපන දෙපාර්තමේන්තුව මගින් එබඳු මාරු මණ්ඩල දැනට පිහිටුවා තිබේ දැයි එතුමා ප්‍රකාශ කරනවාද? (ඉ) එසේ නම් එම මණ්ඩලවල නියෝජිතයෝ කවර හුදැයි එතුමා එළි කරනවාද? (ඊ) මාරු මණ්ඩල විසින් සම්මත කොට ඇති මාරු ක්‍රමය කුමක්දැයි එතුමා සඳහන් කරනවාද? (උ) නොඑසේ නම්, ඒ මන්ද?

*கல்வி, கலாசார விவகார அமைச்சரைக் கேட்ட வினா: (அ) ஆசிரியர் மாற்றச் சபைகளில் ஆசிரியர்களின் பிரதிநிதிகளும் அங்கத்தவர்களாயிருக்க வேண்டுமென்ற பிரேரணை இக் கௌரவ சபையில் ஏகமனதாக ஏற்றுக் கொள்ளப்பட்டதென்பதை அவர் அறிவாரா? (ஆ) கல்வித்திணைக்களத்தினால் அவ்வித மாற்றச் சபை இப்போது நிறுவப்பட்டுள்ளதா வென்பதை அவர் அறிவிப்பாரா? (இ) அப்படியெனில் அச்சபைகளிலுள்ள பிரதிநிதிகள் யாவர் என்பதை அவர் வெளியிடுவாரா? (ஈ) மாற்றச் சபைகளினால் நிறைவேற்றப்பட்டுள்ள மாற்றத்திட்டம் யாது என்பதை அவர் குறிப்பிடுவாரா? (உ) அப்படியின்றேல், ஏன்?*

asked the Minister of Education and Cultural Affairs: (*a*) Is he aware that this House resolved unanimously that teachers' transfer boards which include representatives of teachers should be set up? (*b*) Will he state whether the Education Department has now set up such transfer boards? (*c*) If so, will he disclose who the representatives on these boards are? (*d*) Will he state what the transfer scheme adopted by the transfer boards is? (*e*) If not, why?

**ජයසූරිය මයා.**
*(திரு. ஜயசூரிய)*
(Mr. Jayasuriya)
(අ) ඔව්. (ආ) නැත. (ඉ) ඉහත (ආ) පිළිතුර අනුව පැන නොනගී. (ඊ) පැන නොනගී. (උ) ගුරු මාරුවීම් හුදු පාලනමය කටයුත්තක් ලෙස සළකන බැවිනි.

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)
6 වන ප්‍රශ්නය.

**විජයපාල මෙන්ඩිස් මයා. (රජයේ වැඩ, තැපැල් හා විදුලි සන්දේශ ඇමතිගේ පාර්ලිමේන්තු ලේකම්—ස්වදේශ කටයුතු ඇමති වෙනුවට)**
*(திரு. விஜயபால மெண்டிஸ்—அரசாங்கக் கட்டுவேலை, தபால் தந்திப் போக்குவரத்து அமைச்சரின் பாராளுமன்றக் காரியதரிசி—உள்நாட்டு அமைச்சர் சார்பாக)*
(Mr. Wijayapala Mendis—Parliamentary Secretary to the Minister of Public Works, Posts and Telecommunications—on behalf of the Minister of Home Affairs)
ඒ ප්‍රශ්නයට පිළිතුරු දීමට මාසයක් කල් ඉල්ලනවා.

**ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.**

*வினாவை மற்றொரு தினத்துக்குச் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*

***Question ordered to stand down.***

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

## නාල්ල උප තැපැල් කාර්යාලය : ලිපි බෙදීමේ සේවය

*நால்ல உபதபால் நிலையம் : தபால் விநியோகச் சேவை*

**NALLA SUB-POST OFFICE : MAIL DELIVERY SERVICE**

7. **ලක්ෂ්මන් ජයකොඩි මයා.** (දිවුල පිටිය)

*(திரு. லக்ஷ்மன் ஜயக்கொடி—திவுலு பிட்டிய)*

(Mr. Lakshman Jayakody—Divulapitiya)

රජයේ වැඩ, තැපැල් සහ විදුලි සංදේශ ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) කොළඹ දිස්ත්‍රික්කයේ නාල්ල උප තැපැල් කාර්යාලයට ස්වාධීන ලිපි බෙදා දීමේ සේවයක් ආරම්භ කිරීමට 1965 සිට දෙපාර්තමේන්තුවට දන්වන ලදුවත්, එය පැහැර හැර ඇති බව එතුමා දන්නවාද? (ආ) නාල්ල උප තැපැල් කාර්යාලයට එය නොදෙන්නේ මන් ද? (ඉ) ඉහත සඳහන් සම්ප්‍රදායට පටහැනිව ස්වාධීන ලිපි බෙදාදීම දී ඇත්නම් නාල්ලට නොදෙන හේතු මන් ද?

*அரசாங்கக் கட்டுவேலை, தபால், தந்திப் போக்குவரத்து அமைச்சரைக் கேட்ட வினா (அ) கொழும்பு மாவட்டத்திலுள்ள நால்ல உபதபால் நிலையத்திற்கு தனியான தபால் விநியோகிக்கும் சேவையைத் தொடக்குவதற்கு 1965 ஆம் ஆண்டிலிருந்து திணைக்களத்திற்கு வேண்டுகோள்கள் விடுக்கப்பட்ட போதிலும் அவை புறக்கணிக்கப்பட்டிருப்பதை அவர் அறிவாரா? (ஆ) நால்ல உபதபால் நிலையத்திற்கு அச்சேவையை ஏன் கொடுக்கவில்லை? (இ) மேற்குறிப்பிட்ட வழக்கத்துக்கு மாறாகத் தனித்தபால் விநியோக சேவை கொடுக்கப்பட்டிருப்பின் நால்லைக்குக் கொடாதிருக்கும் காரணமென்ன?*

asked the Minister of Public Works, Posts and Telecommunications: (*a*) Is he aware that requests made since 1965 for a separate mail delivery service for the Nalla Sub-Post Office in the Colombo District have been ignored by the department? (*b*) Why is this not granted to the Nalla Sub-Post Office? (*c*) If delivery mails has been permitted contrary to practice referred to above, why is it not granted to Nalla?



**විජයපාල මෙන්ඩිස් මයා.**

*(திரு. விஜயபால மெண்டிஸ்)*

(Mr. Wijayapala Mendis)

(අ) නැත. (ආ) දෙපාර්තමේන්තුවේ අත්දැකීම අනුව, නාල්ලේ දැනට පවත්නා සේවය සතුටුදායක බව සළකා ඇත. එසේකුදු වුවත්, නගා ඇති ප්‍රශ්නය හේතු කොටගෙන නාල්ල උප තැපැල් කාර්යාලයෙහි තිබෙන සේවය ප්‍රතිශෝධනය කරලීම අවශ්‍යවේද යනවග සොයාබැලීම පිණිස පරීක්ෂණ කටයුතු කෙරෙනු ඇත. (ඉ) කලින් දුන් පිළිතුරු හේතුකොටගෙන මෙය පැන නොනඟියි.

## "බැක්ටීරියා ලීෆ් බ්ලයිට්" වී රෝගය

*இலைச்சுருள் நெற்பயிர் நோய்*

**PADDY DISEASE "BACTERIAL LEAF BLIGHT"**

8. **ජයකොඩි මයා.**

*(திரு. ஜயக்கொடி)*

(Mr. Jayakody)

කෘෂිකර්ම හා ආහාර ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) "බැක්ටීරියා ලීෆ් බ්ලයිට්" නමැති ඉතා දරුණු පැළෑටි රෝගයක් ලංකාවේ දේශීය හා දෙමුහුන් වීවලට වැළැඳී ගෙන යන බව එතුමා දන්නවාද? (ආ) එය මර්දනය කිරීමට බලාපොරොත්තු වන්නේ කෙසේ දැයි එතුමා සඳහන් කරනවා ද? (ඉ) නො එසේ නම් මන් ද?

*விவசாய, உணவு அமைச்சரைக் கேட்ட வினா: (அ) இலங்கையில் உள்ளூர் நெற்பயிரையும் கலப்பு நெற் பயிரையும் நுண்ணிய கிருமியினால் ஏற்படும் இலைச்சுருள் நோய்* (Bacterial Leaf Blight) *தாக்கிவருவதை அறிவாரா? (ஆ) இந் நோயை எப்படிக் கட்டுப்படுத்தப்போகிறார் என்று கூறுவாரா? (இ) இல்லையெனில், ஏன்?*

asked the Minister of Agriculture and Food: (*a*) Is he aware that a very serious disease known as "Bacterial Leaf Blight" is attacking the Ceylon indigenous and hybrid paddies? (*b*) Will he state how he intends to control this? (*c*) If not, why?

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**පී. සී. ඉඹුලාන මයා. (කෘෂිකර්ම හා ආහාර ඇමතිගේ පාර්ලිමේන්තු ලේකම්)**

*(திரு. பீ. சீ. இம்புலான—விவசாய, உணவு அமைச்சரின் பாராளுமன்றக் காரியதரிசி)*

(Mr. P. C. Imbulana—Parliamentary Secretary to the Minister of Agriculture and Food)

(අ) ඔව්. කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් නිර්දේශ කර ඇති ඇතැම් දේශීය වී ප්‍රභේද සහ දෙමුහුන් ප්‍රභේද මෙම රෝගයට වඩා ඔරොත්තු දෙන අතර, ඇතැම් විදේශීය ප්‍රභේද අධික ලෙස රෝගයට ගොදුරුවන සුළුය. (ආ) වෙනත් රටවල විකාශනය කරගෙන ඇති රසාය නික මර්ධන ක්‍රමවලට ප්‍රතිජීවකයන් භාවිත කිරීම ඇතුළත් වන අතර, ඒවා නිර්දේශ කිරීමට නොහැකි තරම් වියදම් අධික වේ. කෘෂිකර්ම දෙපාර්තමේන්තුවද, මෙම ගොයම් රෝගය පිළිබඳ ගැටළුව පවතින වී වගා කරන වෙනත් රටවල්ද රෝගයට වඩාත් ඔරොත්තු දෙන ප්‍රභේද බෝකර ගැනීමෙන් සහ ලාභදායී රසායනික මර්ධන ක්‍රම සොයාබැලීමෙන් මේ රෝගය මර්ධනය කිරීම උදෙසා කටයුතු කරගෙන යත්. (ඉ) අදාළ නොවේ.

**ජයකොඩි මයා.**

*(திரு. ஜயக்கொடி)*

(Mr. Jayakody)

පිටරටින් ගෙන්වන සමහර වීවලට මෙ වැනි රෝගයක් හටගෙන තිබෙන නිසා ඒ කුමන වීවලටදැයි කියන්න පුළුවන්ද?

**ඉඹුලාන මයා.**

*(திரு. இம்புலான)*

(Mr. Imbulana)

පිටරටින් ගෙන්වන වීවලින් වැඩි වශයෙන් මේ රෝගයට භාජන වන්නේ "තයි-චුන්-නේටිව් I" කියන වී වර්ගයයි.

**ජයකොඩි මයා.**

*(திரு. ஜயக்கொடி)*

(Mr. Jayakody)

ඒ කොයි රටකින් ගෙනා වී වර්ගයක්ද?

**ඉඹුලාන මයා.**

*(திரு. இம்புலான)*

(Mr. Imbulana)

ඒවා පෙරදිග රටවල තිබෙනවා.



**ජෝර්ජ් රාජපක්ෂ මයා. (මුල්කිරිගල)**

*(திரு. ஜோர்ஜ் ராஜபக்ஸ—முல்கிரிகல)*

(Mr. George Rajapaksa—Mulkirigala)

අර 4 දෙනා ගිය රටෙන් ද?

**ඉඹුලාන මයා.**

*(திரு. இம்புலான)*

(Mr. Imbulana)

නැහැ. මුලින්ම ගෙනාවේ කොයි රටින්ද කියා කියන්න දන්නේ නැහැ.

## ලංකා ඛනිජ තෙල් සංස්ථාවට අමුතෙල් සැපයීමේ ටෙන්ඩර් දැන්වීම්

இலங்கைப் பெற்றோல்கூட்டுத்தாபனம் : சுத்திகரிக்கப்படாத எண்ணெய்க் கேள்விப்பத்திர விளம்பரங்கள்

CEYLON PETROLEUM CORPORATION : CRUDE OIL TENDER NOTICES

12. **ටී. බී. ඉලංගරත්න මයා. (කොළොන්නාව)**

*(திரு. ரீ. பி. இலங்கரத்ன—கொலொன்னாவ)*

(Mr. T. B. Ilangaratne—Kolonnawa)

ජනසතු සේවා ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) ලංකා ඛනිජ තෙල් සංස්ථාවට අමුතෙල් සැපයීමේ ටෙන්ඩර් දැන්වීම් බටහිර සමාගම් තුන සම්බන්ධ රටවලට හා සෝවියට් රුසියාවට පමණක් සීමාකර ඇති බව එතුමා දන්නේද? (ආ) ඉරානය, මිසරය, ඉන්දුනීසියාව ආදී රටවල එම දැන්වීම් ප්‍රසිද්ධ නොකළේ මන්ද? (ඉ) මෙම සංස්ථාවේ විශෙෂඥයන් අමෙරිකානුවන් නිසා අමෙරිකා ආණ්ඩුවට ප්‍රතිවිරුද්ධ අදහස් දරණ රටවල ආනයනයන් ඔවුන් හෙළාදකිතියි බියක් එම රටවල පැතිරී ගොස් තිබෙන බව එතුමා දන්නේද?

*தேசியமயச் சேவை அமைச்சரைக் கேட்ட வினா: (அ) இலங்கைப் பெற்றோல் கூட்டுத் தாபனம் சுத்திகரிக்கப்படாத பெற்றோலை வழங்குவதற்கு மேற்கத்திய மூன்று கம்பெனிகள் சம்பந்தப்பட்ட நாடுகளுக்கும், சோவியத் ருஷியாவுக்கும் மாத்திரம் கேள்விப்பத்திர விண்ணப்பங்களைக் கோரும் உரிமையைக் கட்டுப்படுத்தியுள்ள தென்பதை அவர் அறிவாரா? (ஆ) ஈராக், ஐக்கிய அராபியக் குடியரசு, இந்தோனேஷியா ஆகிய நாடுகளில்*

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ඉලංගරත්න මයා.]

*இக்கேள்விப்பத்திர விளம்பரங்கள் வெளியிடப்படாததேன்? (இ) இக் கூட்டுத்தாபன நிபுணர்கள் அமெரிக்கர்களாகையால் அமெரிக்க அரசாங்கத்திற்கெதிரான கருத்துள்ள நாடுகளின் இறக்குமதிகளை அவர்கள் எதிர்க்கிறார்கள் என்ற பயம் இந் நாடுகளில் பரவியிருப்பதை அவர் அறிவாரா?*

asked the Minister of Nationalized Services: (*a*) Is he aware that the tender notices for the supply of crude oil to the Ceylon Petroleum Corporation have been restricted to the countries associated with the three Western oil companies and to Soviet Russia? (*b*) Why were these notices not published in countries such as Iraq, Egypt and Indonesia? (*c*) Is he aware that these countries have begun to fear that, since the experts to this corporation are Americans, they would look down upon imports from those countries which are ideologically opposed to the Government of America?

**එස්. ද එස්. ජයසිංහ මයා. (කම්කරු, රැකීරක්ෂා හා නිවාස ඇමතිගේ පාර්ලිමේන්තු ලේකම්—ජනසතු සේවා ඇමති වෙනුවට)**

*(திரு. எஸ். டி எஸ். ஜயசிங்ஹ—தொழில், தொழில் வசதி, வீடமைப்பு அமைச்சரின் பாராளுமன்றக் காரியதரிசி—தேசியமய சேவை அமைச்சர் சார்பாக)*

(Mr. S. de S. Jayasingha—Parliamentary Secretary to the Minister of Labour, Employment and Housing—on behalf of the Minister of Nationalized Services)

(අ) නැත. අමුතෙල් සැපයීමේ ටෙන්ඩර් දැන්වීම් බටහිර තෙල් සමාගම් තුනට සම්බන්ධ රටවලට සහ රුසියාවට පමණක් සීමා කර තුබුනේ නැත. (ආ) අමුතෙල් අපනයනය කරන හා එම වෙළඳාම ගැන සැලකිල්ලක් දක්වන සංවිධානයන්ට නිකුත් කිරීම පිණිස ලංකා තානාපති කාර්යාලයන්ට ටෙන්ඩර් දැන්වීම් යැවූ රටවල් අතර ඉරාකය සහ මිසරයද විය. (ඉ) නැත. ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ උපදේශකයින් වන සීමාසහිත යුනිවර්සල් ඔයිල් ප්‍රොඩක්ස් සමාගම වනාහි අමුතෙල් විශ්ලේෂනය කිරීම පිළිබඳ ලෝකයේ පිළිගත් විශේෂඥ සංවිධානයකි. ඔවුන් ගෙන් ලබන උපදෙස් අමුතෙල් හා සම්බන්ධ විද්‍යාත්මක හා කාර්මික කරුණුවලට පමණක් සීමාවී ඇත.

**ඉලංගරත්න මයා.**

*(திரு. இலங்கரத்ன)*

(Mr. Ilangaratne)

ඉස්සර මේ විශෙෂඥයන් පත් කර තිබුණේ ස්වාධීන ප්‍රංශ ජාතික සංවිධානයක් මගින් නොවේද? එසේ නම් එය වෙනස් කෙළේ මන්ද?

**එස්. ද එස්. ජයසිංහ මයා.**

*(திரு. எஸ். டி எஸ். ஜயசிங்ஹ)*

(Mr. S. de S. Jayasingha)

ඒ ගැන පසුව පිළිතුරු දෙන්නම්.

## ලංකා ඛනිජ තෙල් සංස්ථාවට තෙල් ආනයනය

### இலங்கைப் பெற்றோல் கூட்டுத்தாபனம்: எண்ணெய் இறக்குமதி

### CEYLON PETROLEUM CORPORATION: OIL IMPORTS

13. **ඉලංගරත්න මයා.**

*(திரு. இலங்கரத்ன)*

(Mr. Ilangaratne)

ජනසතු සේවා ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) ඛනිජ තෙල් ආනයනයන් උවමනා තරම් කලට වේලාවට මෙරටට ලඟා නොවන්නේ අවශ්‍යතා අනුව සංස්ථාව මගින් කලින් ඇනවුම් නොකරන නිසා බව එතුමා දන්නේද? (ආ) එසේ කලින් ඇනවුම් නොකිරීමෙන් ඇතිවන පාඩු පිරිමැසීමේ ආවරණයෙන් තෙල් සමාගම් මගින් භාණ්ඩ සැහෙන ප්‍රමාණයක් ආනයන කිරීමට සිදුවන බව එතුමා දන්නේද? (ඉ) තිරිකුණාමලේ තෙල් ටැන්කිවල හය මාසයක උවමනාවන් ගබඩා කළ හැකි බව එතුමා දන්නේද? (ඊ) ඒ ටැංකි මැනවින් පාවිච්චි නොකරන්නේ මන්ද? (උ) සංස්ථාවෙන් ආනයන නොකර සමාගම් මගින් ආනයන කිරීමෙන් දරන්නට සිදුවන අධික වියදම සියයට කොපමණද? (ඌ) 1965 මාර්තු මාසයෙන් පසු තෙල් සමාගම් මගින් සංස්ථාවෙන් බෙදා දීම පිණිස ආනයන කරන ලද ඛනිජ තෙල් භාණ්ඩවල වටිනාකම කොපමණද?

*தேசியமயச் சேவை அமைச்சரைக் கேட்ட வினா: (அ) பெற்றோல் கூட்டுத்தாபனத்திற்குத் தேவையான இறக்குமதிகள் காலாகாலத்தில் இந்நாட்டுக்கு வராமலிருப்பது, தேவைக் கிணங்க கூட்டுத்தாபனம், முன்னேற்பாடு செய்யாமலிருப்பதனால் என்பதை அவர் அறி*

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

*வாரா? (ஆ) அவ்விதம் முன்னேற்பாடு செய்யாமல் விடுவதனல் ஏற்படும் தட்டுப்பாட்டைச் சமாளிக்கும் போர்வையில், பெற்ரேல் கம்பெனிகள் மூலமாகப் போதியளவு பொருள்களை இறக்குமதி செய்ய நேரிடுகிறதென்பதை அவர் அறிவாரா? (இ) திருக்கோணமலை பெற்ரேல் தாங்கிகளில் ஆறு மாதத்திற்குத் தேவையான பெற்ரேல் பொருள்களைச் சேமித்து வைக்க முடியுமென்பதை அவர் அறிவாரா? (ஈ) அத்தாங்கிகளை நன்கு பயன்படுத்தாமலிருக்கக் காரணமென்ன? (உ) கூட்டுத்தாபனம் இறக்குமதி செய்யாது கம்பெனிகள் மூலமாக வரவழைப்பதால் ஏற்படும் மேலதிகச் செலவு நூற்றுக்கெவ்வளவு? (ஊ) 1965 மார்ச் மாதத்தின் பின் பெற்ரேல் கம்பெனிகள் மூலம் கூட்டுத்தாபனம் விநியோகிக்க இறக்குமதி செய்யப்பட்ட பெற்ரேல் பொருள்களின் பெறுமதி யாது?*

asked the Minister of Nationalized Services: (*a*) Is he aware that it is because the corporation does not place orders sufficiently in advance so as to meet its requirements, that imports of petroleum do not reach this country in time? (*b*) Is he aware that the shortages that occur due to the failure to place timely orders, provide a cover for the import of a considerable volume of goods from the oil companies? (c) Is he aware that six months' requirements of oil can be stored in the storage tanks at Trincomalee? (*d*) Why are these tanks not properly utilized? (c) What is the extra percentage cost involved in importing through companies, instead of importing directly through the corporation? (*f*) What is the value of petroleum products imported through oil companies since March 1965, for distribution through the Petroleum Corporation?

**එස්. ද එස්. ජයසිංහ මයා. (ජනසතු සේවා ඇමති වෙනුවට)**

*(திரு. எஸ். டி எஸ். ஜயசிங்க—தேசியமய சேவை அமைச்சர் சார்பாக)*

(Mr. S. de S. Jayasingha—on behalf of the Minister of Nationalized Services)

(අ) නැත. ඇත්ත වශයෙන් මසකට ආනයන කරන තොග ගණන් අඩු වශයෙන් දවස් 45 කට කලින් අප විසින් බඩු සපයන්නන්ට දෙනු ලබන්නේය. සෑම කල්හිම ආනයන කරනලද ඛනිජ තෙල් අපේ වැඩ සටහන පරිදි මෙහි ලඟා වී ඇත. එසේ ලඟා නොවූයේ සූවස් අරගලයෙන් ඇති වූ කලබලය නිසා නැව් ගමනාගමනය හුදෙක් කඩාකප්පල් වීම නිසා ජූලි, අගෝස්තු සහ සැප්තැම්බර් මාස වලදීය. (ආ) සූවස් අරගලය ඇතිවූ කල හිඟයක් ඇතිවූයේ නොහොත් හිඟයක් ඇතිවීමට ආසන්නව තිබුනේ කල්වේලා ඇතිව ඇනවුම් ඉදිරිපත් නොකිරීම නිසා නොවේ. එයට හේතු මෙසේය: (1) එක් නියමිත සපයන්නෙකු විසින් නැව් ගත කරන ලද බඩුතොග කෝප් තුඩුව වටා ඒම නිසා ද, (2) තවත් නියමිත බඩු සපයන්නෙකු කොන්ත්‍රාත්තුව යටතේ තමා විසින් පිළිපැදිය යුතු යුතුකම් 'ෆෝස් මැජුවර්' නිසා යැයි පැහැර හැරීම හේතුකොට ගෙන බඩු පැටවීමට නැව් යෙදීමේ කටයුතු ලංකා ඛනිජ තෙල් සංස්ථාවට පැවරීමය. සූවස් අරගලයෙන් ඇතිවූ දුෂ්කර කාලය මග හැරීමට උවමනා කළ හුදෙක් බඩු ද්‍රව්‍ය මිලයට ගනු ලැබුවේ විදේශ පුද්ගලික සමාගම් වලින් නොවේ. එය මිලයට ගනු ලැබුවේ ඉන්දියානු තෙල් සංස්ථාවෙන්ය (එනම් ලංකා ඛනිජ තෙල් සංස්ථාව වැනි සංස්ථාවකින්ය.) (ඉ) ත්‍රිකුණාමලේ පිහිටි ගබඩා ටැංකි රෙපයාර් කළ සහ සුද්ධ කළ පසු 6 මසක් නොව 12 මසකට වුවත් උවමනා කරන ඛනිජ තෙල් ද්‍රව්‍ය ගබඩා කළ හැකි බව මම දන්නෙමි. (ඊ) ත්‍රිකුණාමලේ ටැංකි දැන් පාවිච්චි කරණ තරමට වැඩිය පාවිච්චි කළ නොහැකිය. එනම් එහි දැනට ඇත්තේ නැව්වලට සපයන තෙල් තොග ප්‍රමාණ සහ ත්‍රිකුණාමලය අසළ පාවිච්චි කරන්නන්ට උවමනා කරන තෙල් ද්‍රව්‍ය පමණය. මෙම ටැංකි හුදෙක් පාවිච්චි කිරීමේ ප්‍රශ්නය ලංකා ඛනිජ තෙල් සංස්ථාවේ ව්‍යාපාරය පටන් ගත් දවස්වලම සම්පූර්ණයෙන් සෝදිසි කරණ ලදී. නමුත් එකළ අධ්‍යක්ෂ මණ්ඩලය එය ප්‍රතික්ෂේප කරන ලදී. මම ද එම තීරණයට එකඟ වන්නෙමි. එසේ එකඟ වීමට තවත් හේතුවක් වශයෙන් තෙල් සුද්ධ කිරීමේ මධ්‍යස්ථානය කොළඹ අසළ පිහිටුවීමට (1964 දී) ගන්නා ලද තීරණය මතක් කිරීමට කැමැත්තෙමි. (උ) නැව්වලට උවමනා දැවි තෙල් සහ අහස්යානා තෙල් හැර සමාගම්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[එස්. ද එස්. ජයසිංහ මයා.]

මගින් කිසියම් ඛනිජ තෙල් ද්‍රව්‍යයක් ආනයන කර නොමැත. එයට හේතුව අන් සියලුම ඛනිජ තෙල් වර්ග ආනයන කිරීමට හැක්කේ ලංකා ඛනිජ තෙල් සංස්ථාවට පමණක් හෙයිනි. පහත සඳහන් දැවි තෙල් ෂෙල් කොම්පැනිය මාර්ගයෙන් මිළ යට ගෙන ඇත. එසේ ගැනීමට හේතුව රුසියාවෙන් ගෙන්වන ලද ගොරෝසු සහිත දැවිතෙල් සමග ගොරෝසු අඩු තෙල් මිශ්‍ර කිරීමට උවමනා වූ නිසාය.

| දිනය | | තොග ප්‍රමාණය | | මිළ ගණන් රු. |
|---|---|---|---|---|
| 1967.4.25 | ... | ... 1,001 ටොන් | ... | 70,398 |
| 1966.5.28 | ... | ... 3,879 ටොන් | ... | 2,66,410 |

මෙම මිළ ගණන් රුසියාවෙන් ගෙන්වන ලද ගොරෝසු සහිත දැවිතෙල් මිළ ගණන් වලට වඩා 2%ක් පමණ වූහ.

(ඌ) ඉහත කී (උ) හේතු කොට ගෙන පහත සඳහන් ද්‍රව්‍ය විදේශික සංවිධාන මගින් නැව් ශාස්තු සහ රක්ෂණ ශාස්තු සහිතව මිලයට ගෙන ඇත. එසේ මිලට ගැනීමට හේතු වූයේ සූවස් අරගලයෙන් ඇතිවූ රුසියාවෙන් එවන ලද නැව් පැමිණීමේ ප්‍රමාද දෝෂ හේතු කොට ගෙනය.

| දිනය | | තොග ප්‍රමාණය | | මිළ ගණන් රු. |
|---|---|---|---|---|
| 67.6.30 | ... | ... 3,749 ටොන්—කළු තෙල් | ... | 5,02,410 |
| | | 3,157 ටොන්—කළු තෙල් | ... | 4,29,508 |
| 67.6.20 | ... | ... 17,889 ටොන්—සුදු තෙල් | ... | 18,61,099 |

**ඉලංගරත්න මයා.**
*(திரு. இலங்கரத்ன)*
(Mr. Ilangaratne)

සූවස් අරබුදය ඇති වන්නට පෙර ග්‍රිස් ඔයිල් සහ ලුබ්රිකේටිං ඔයිල් තෙල් තොග ගණනාවක්ම කොම්පැනි මාර්ගයෙන් ගෙන්වා ගෙන තිබෙන බව ඔබතුමා දන්නවාද ?

**එස්. ද එස්. ජයසිංහ මයා.**
*(திரு. எஸ். டி எஸ். ஜயசிங்க)*
(Mr. S. de S. Jayasingha)

දන්නේ නැහැ.

**ඉලංගරත්න මයා.**
*(திரு. இலங்கரத்ன)*
(Mr. Ilangaratne)

කරුණාකර ඒ ගැන සොයා බලනවාද ?

**එස්. ද එස්. ජයසිංහ මයා.**
*(திரு. எஸ். டி எஸ். ஜயசிங்க)*
(Mr. S. de S. Jayasingha)

සොයා බලන්නම්.

## කිරි මණ්ඩලය : කොළඹ කිරි සපයන්නන්ට වැඩි මිළක්

பாற்சபை : கொழும்பு விநியோகத்தர்க்கு உயர்விலை

MILK BOARD : HIGHER PRICE FOR COLOMBO

14. **ඉලංගරත්න මයා.**
*(திரு. இலங்கரத்ன)*
(Mr. Ilangaratne)

කෘෂිකර්ම හා ආහාර ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය : (අ) 1965 මාර්තු මාසයට පෙර, (1) කොළඹ මධ්‍යස්ථානයට කිරි සපයන්නන්ට කිරි පයින්ට් එකකට ගෙවන ලද මුදල කොපමණද ? (2) පිටිසර පළාත්වල කිරි සපයන්නන්ට ගෙවන ලද මිළ කීයද? (ආ) කොළඹ කිරි සපයන්නන්ට වැඩි මිළක් ගෙවන ලද්දේ ඒ අයට ගව පට්ටි නඩත්තු කිරීමට වැඩි වැයක් වන නිසා බව එතුමා දන්නේද ? (ඉ) කොළඹ කිරි සපයන්නන්ට නැවතත් විශේෂ මිළක් හෝ ආධාරයක් දෙන්නේද ?

விவசாய, உணவு அமைச்சரைக் கேட்ட வினா : (அ) 1965 ஆம் ஆண்டு மார்ச் மாதத்திற்கு முன்னர், (i) கொழும்பு நிலையங்களுக்குப் பால் கொடுப்பவர்களுக்கு ஒரு பைந்து

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

பாலுக்குக் கொடுக்கப்பட்ட விலையென்ன? (ii) வெளியூர் நிலையங்களுக்குப் பால் கொடுப்பவர்களுக்கு ஒரு பைந்து பாலுக்குக் கொடுக்கப்பட்ட விலையென்ன? (ஆ) கொழும்பில் பால் கொடுப்பவர்களுக்கு உயர்ந்த விலை கொடுக்கப்பட்டமை அவர்கள் பண்ணைகளை நடத்தும் செலவு உயர்ந்ததாக இருப்பது தான் என்பதை அவர் அறிவாரா? (இ) கொழும்பில் பால் கொடுப்பவர்களுக்கு ஒரு விசேட விலை அல்லது வேறு உதவி மீண்டும் கொடுக்கப்படுமா?

asked the Minister of Agriculture and Food: (*a*) What was the price per pint of milk paid before March 1965 to: (i) suppliers of milk to the Colombo Centre; (ii) suppliers of milk in the outstations? (*b*) Is he aware that a higher price was paid to the suppliers of milk in Colombo because the costs of maintaining dairies were higher? (*c*) Will the suppliers of milk in Colombo be given a special price or other assistance again?

**ඉඹුලාන මයා.**

*(திரு. இம்புலான)*

(Mr. Imbulana)

ගරු කථානායකතුමනි, පිළිතුර දිග එකක් හෙයින් එය සභාමේසය මත තබන්නට අවසර ඉල්ලනවා.

**සභාමේසය මත තබන ලද පිළිතුර මෙසේ යි:**

*சபா பீடத்தில் வைக்கப்பட்ட விடை வருமாறு :*

*The Answer tabled is as follows:*

(අ) 1965 මාර්තු මාසයට කලින් කිරි පයින්ටුවකට ගෙවූ මිල ගණන් පහත දැක්වේ:

| | (I) කොළඹ සපයන්නෝ | | (II) පිට පළාත්වල සපයන්නෝ | |
|---|---|---|---|---|
| | 1962.5.31 වැනි දිනට ප්‍රථමයෙන් ලියාපදිංචිවූ අයට ශත | 1962.6.1 දින සිට ලියාපදිංචිවූ අය ශත | 1962.5.31 දිනට ප්‍රථමයෙන් ලියාපදිංචිවූ අය ශත | 1962.6.1 දිනසිට ලියාපදිංචිවූ අය ශත |
| මේධ සියයට 4.5 සහ ඊට වැඩි ... | 45 | 35 | 35 | 30 |
| මේධ සියයට 3.5 සහ ඊට වැඩි ... | 40 | 30 | 30 | 25 |
| මේධ සියයට 3.25 සිට 3.5 දක්වා ... | 30 | 25 | 25 | 20 |
| මේධ සියයට 3 සිට 3.25 දක්වා ... | 25 | 20 | 20 | 15 |

(ආ) කොළඹ ප්‍රදේශයේ සැපයුම්කරුවන්ට "කොළඹ සමුපකාර කිරි සංගමය" මගින් ගෙවනු ලැබුව වූ ගාස්තු ප්‍රමාණය එසේම ගෙවාගෙන යාමට මණ්ඩලයට සිදුවිය. මොවුන්ට ඉහළ ගාස්තුවක් ගෙවන්නට වූයේ කොළඹ ප්‍රදේශයේ කිරි පට්ටි නඩත්තු කිරීමට යන වියහියදම් අන් ඒවාට වඩා වැඩියැයි සැලකූ හෙයින් නොවේ. 1962.6.1 වැනිදා සිට ලියාපදිංචිවූ සැපයුම්කරුවන්ට ගෙවූ මිළ ඔවුන් හැම දෙනාටම බලපානසේ පයින්ටුවකට ශත 05 බැගින් 1962 වර්ෂයේදී අඩුකරනු ලැබීය.

(ඉ) කිරිවලට වැඩි මිලක් ගෙවන්නැයි ඉල්ලමින් කිරි නිපදවන්නන් උද්ඝෝෂණය කළ නිසා ගව ආහාරවල සහ කිරිවල මිළ ගණන් සොයා බලා වාර්තා කරනු පිණිස ආර්. එච්. ද මැල් මහතාගේ ප්‍රධානත්වයෙන් කාරක සභාවක් 1965 වර්ෂයේ දී පත්කරනු ලැබිය. දිවයින පුරා ඇති කිරි සඳහා සම්මත මිලක් ගෙවන්නැයි කාරක සභාව නිර්දේශ කළාය. මේ නිර්දේශයන් ක්‍රියාත්මක කිරීමේ දී කොළඹ සම්පාදනාගාරයට කිරි සපයන සැපයුම් කරුවන්ට අළුත් මිළ ගණන් භාරගැනීමට හෝ ඔවුනට කලින් ගෙවූ මිළ ගණන් තවදුරටත් ලබා ගැනීමට හෝ ඔවුන්ගේ කැමැත්ත පරිදි ඉඩ දුනි. අනිකුත් කිරි නිෂ්පාදකයින්ට දෙන්නාවූ ආධාර හැර කොළඹ කිරි සැපයුම්කරුවන්ට විශේෂ මිලක් හෝ වෙනත් ආධාර හෝ දෙනු නොලැබේ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ඉඹුලාන මයා.]

(அ) (1) ம், (2) ம்—

1965 மார்ச்சு மாதத்திற்கு முன் ஒவ்வொரு பைந்து பாலுக்கும் கொடுக்கப்பட்ட விலை பின்வருமாறு;—

| | கொழும்பில் வழங்கியோர் | | வெளியூர்களில் வழங்கியோர் | |
|---|---|---|---|---|
| | 1962.5.31 க்கு முன் பதிவு செய்யப்பட்டோர் சதங்கள் | 1962.6.1 இல் இருந்து பதிவு செய்யப்பட்டோர் சதங்கள் | 1962.5.31 க்கு முன் பதிவு செய்யப்பட்டோர் சதங்கள் | 1962.6.1 இல் இருந்து பதிவு செய்யப்பட்டோர் சதங்கள் |
| 4.5% வெண்ணெய்ச் சத்தும், அதற்கு மேலும் | 45 | 35 | 35 | 30 |
| 3.5% வெண்ணெய்ச் சத்தும், அதற்கு மேலும் | 40 | 30 | 30 | 25 |
| 3.25%3.5% வெண்ணெய்ச் சத்து | 30 | 25 | 25 | 20 |
| 3.0% 3.25% வெண்ணெய்ச் சத்து | 25 | 20 | 20 | 15 |

(ஆ) கொழும்பு வட்டாரத்திலுள்ள பால் வழங்குவோருக்குக் கொழும்பு கூட்டுறவுப் பால் சங்கத்தினால் கொடுக்கப்பட்ட அதே வீதத்தைப் பால் சபையும் தொடர்ந்து அவர்களுக்குக் கொடுக்கவேண்டி இருந்தது. இவ் வதிகப்படியான வீதங்கள் கொடுக்கப்பட்டது, கொழும்பு வட்டாரத்தில் பண்ணைகளைப் பராமரிப்பதற்கு அதிக செலவாகும் எனக் கருதியதாலல்ல. 1962.6.1 இல் இருந்து பதிவுசெய்யப்பட்ட பால் வழங்குவோருக்கு எலலாத் தரப் பாலுக்கும் கொடுக்கப்பட்ட விலையில் பைந்துக்கு 5 சதம் வீதம் 1962 ஆம் வருடத்தில் குறைக்கப்பட்டது.

(இ) பாலுக்கு அதிக விலை கோரி பால் உற்பத்தியாளர்கள் பொதுவாக வற்புறுத்திக் கேட்டுக்கொண்டதால், திரு. ஆர். எச். டி மெல் அவர்களின் தலைமையில் கால்நடை உணவு, பால் ஆகியவற்றின் விலைகளை ஆராய்ந்து அறிவிக்க 1965 இல் ஒரு குழு நியமிக்கப்பட்டது. இக்குழு, தீவு பூராவிலும் பாலுக்கு ஒரே நிலையான விலையைக் கொடுக்குமாறு ஆலோசனை கூறிற்று. இந்த ஆலோசனைகளை நடைமுறைக்குக் கொண்டு வருவதற்கு கொழும்புத் தொழிற்சாலைக்குப் பால் வழங்குவோர், புது விலைகளை ஏற்றுக்கொள்ள, அல்லது தங்களுக்குக் கொடுக்கப்பட்ட பழைய விலைகளைத் தொடர்ந்து பெற அனுமதிக்கப்பட்டனர். மற்றப் பால் உற்பத்தியாளருக்குக் கொடுக்கப்படும் உதவியைத் தவிர்த்து வேறு எந்த உதவியோ விசேட விலையோ கொழும்பில் பால் வழங்குவோருக்குக் கொடுக்கப்படமாட்டாது.

(*a*) The prices paid per pint of milk before March 1965 were as follows:

| | COLOMBO SUPPLIERS | | OUTSTATION SUPPLIERS | |
|---|---|---|---|---|
| | *Those registered prior to 31.5.1952 Cents* | *Those registered from 1.6.1962 Cents* | *Those registered prior to 31.5.1962 Cents* | *Those registered from 1.6.1962 Cents* |
| 4.5 per cent fat and above | 45 | 35 | 35 | 30 |
| 3.5 per cent fat and above | 40 | 30 | 30 | 25 |
| 3.25 per cent–3.5 per cent fat | 30 | 25 | 25 | 20 |
| 3 per cent to 3.25 per cent fat | 25 | 20 | 20 | 15 |

(*b*) The board had to continue to pay the milk suppliers in the Colombo area the same rates they had been paid by the Colombo Co-operative Milk Union. This higher rate was paid not because it was considered that the costs of maintaining dairies in the Colombo area were higher. In 1962, an all round reduction of 5 cents per pint was made in the price paid to suppliers registered from 1.6.1962.

(*c*) As there was a general agitation from milk producers for a higher price for milk, a committee headed by Mr. R. H. de Mel was appointed in 1965 to examine and report on the prices of cattle feed and milk. The committee recommended the payment cf a standard price for milk all over the Island. In implementing these recommendations the suppliers of milk to Colombo Factory were given the option of accepting the new prices or continuing to receive the earlier prices paid to them. No special price or assistance other than the assistance given to other milk producers will be given to the suppliers of milk in Colombo.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

## යෝජිත පාසැල්

## உத்தேச பாடசாலைகள்

## PROPOSED SCHOOLS

15. ප්‍රින්ස් ගුණසේකර මයා. (හබරාදුව)
*(திரு. பிறின்ஸ் குணசேக்கர—ஹபருதுவ)*
(Mr. Prins Gunasekera—Habaraduwa)

අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) රජයට මෙතෙක් පවරා නොගත් යෝජිත මුළු පාසැල් ගණන කීයද? (ආ) ඒවා පිළිබඳව රජයේ පිළිවෙත කුමක් ද?

*கல்வி, கலாசார விவகார அமைச்சரைக் கேட்ட வினா: (அ) அரசாங்கத்தால் பொறுப்பேற்கப்பட்ட உத்தேசிக்கப்பட்ட பாடசாலைகளுள் இன்னமும் பொறுப்பேற்கப்படாத பாடசாலைகளின் எண்ணிக்கை என்ன? (ஆ) இப்படியான பாடசாலைகள் சம்பந்தமாக அரசாங்கத்தின் கொள்கை என்ன?*

asked the Minister of Education and Cultural Affairs: (*a*) What is the total number of proposed schools not yet taken over by the State? (*b*) What is the policy of the Government in regard to such schools?

**ජයසූරිය මයා.**
*(திரு. ஜயசூரிய)*
(Mr. Jayasuriya)

(අ) 194 යි. (ආ) මෙම පාසැල් දෙපාර්තමේන්තුවේ රෙගුලාසිවලට අනුකූල වේ නම් ඒවා අයත් කර ගැනීම සඳහා සලකා බලනු ලැබේ.

**තුඩාවේ මයා.**
*(திரு. துடாவ)*
(Mr. Tudawe)

අතුරු ප්‍රශ්නයක් අහන්නට තිබෙනවා. "මෙම පාසල්, දෙපාර්තමේන්තුවේ රෙගුලාසිවලට අනුකූල වේ නම්" කියන්නේ, ඉදිරියටත් මෙවැනි පාඨශාලා මේ රටේ ඇති වීමට අනුබල දීමක් වශයෙන් ද?

**ජයසූරිය මයා.**
*(திரு. ஜயசூரிய)*
(Mr. Jayasuriya)

ප්‍රශ්නය තිබෙන්නේ, මීට පෙර යෝජනා කළ පාසල් ගැනයි.

**තුඩාවේ මයා.**
*(திரு. துடாவ)*
(Mr. Tudawe)

මේ පාඨශාලා 194 සම්බන්ධයෙන් අනුගමනය කරන ප්‍රතිපත්තිය මොකක් ද? ඒවා රජයට ගන්නවා ද නැද්ද?

**ජයසූරිය මයා.**
*(திரு. ஜயசூரிய)*
(Mr. Jayasuriya)

ඒ පාසල් 194 රජයට ගෙන ඉවරයි.

**තුඩාවේ මයා.**
*(திரு. துடாவ)*
(Mr. Tudawe)

ප්‍රශ්නය තිබෙන්නේ මෙතෙක් රජයට පවරා නොගත් පාඨශාලා ගැනයි. උත්තර දෙන්නේ වෙන එකකට.

**ජයසූරිය මයා.**
*(திரு. ஜயசூரிய)*
(Mr. Jayasuriya)

සමා වන්න. ඒ පාසල් 194 රජයට ගෙන නැහැ.

**තුඩාවේ මයා.**
*(திரு. துடாவ)*
(Mr. Tudawe)

අප අහන්නේ ඒ පාසල් 194 රජයට ගන්නවා ද නැද්ද කියායි.

**ගරු අයි. එම්. ආර්. ඒ. ඊරියගොල්ල (අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු පිළිබඳ ඇමති)**
*(கௌரவ ஐ. எம். ஆர். ஏ. ஈரியகொல்ல—கல்வி, கலாசார விவகார அமைச்சர்)*
(The Hon. I. M. R. A. Iriyagolle—Minister of Education and Cultural Affairs)

ව්‍යවස්ථානුකූලව කරුණු සැලැසී ඇත් නම් රජයට ගන්නවා; එහෙම නැත්නම් නැහැ.

**තුඩාවේ මයා.**
*(திரு. துடாவ)*
(Mr. Tudawe)

කවදා ද ගන්නේ?

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ගරු ඊරියගොල්ල**
*(கௌரவ ஈரியகொல்ல)*
(Mr. Iriyagolle)

මේකෙ තිබෙන ඒවා කීවොත් මන්ත්‍රීතුමා පුදුම වේවි.

## කාර්මික උසාවි සාමාජික ඇන්ඩෘ ද සිල්වා මහතා

*திரு. அன்று த சில்வா, கைத்தொழில் நீதிமன்ற அங்கத்தவர்*

MR. ANDREW DE SILVA, MEMBER, INDUSTRIAL COURTS

5. **ලෙස්ලි ගුණවර්ධන මයා.** (පානදුර) (ආචාර්ය එන්. එම්. පෙරේරා—යටියන්තොට—වෙනුවට)
*(திரு. லெஸ்லி குணவர்தன—பாணந்துறை—கலாநிதி என். எம். பெரேரா—யட்டியாந்தோட்டை—சார்பாக)*
(Mr. Leslie Goonewardene—Panadura—on behalf of Dr. N. M. Perera—Yatiyantota)

කම්කරු, රැකීරක්ෂා හා නිවාස ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) කොළඹ නාගරික සභාවේ මට්ටක්කුලිය කොට්ඨාශය වෙනුවෙන් සිටි එක්සත් ජාතික පාක්ෂික නාගරික සභිකයකු හා එක්සත් ජාතික පක්ෂයේ ක්‍රියාකාරී සාමාජිකයකුද වූ ඇන්ඩෘ ද සිල්වා මහතා, කාර්මික උසාවි සාමාජිකයකු වශයෙන් පත්කර තිබෙන බව එතුමා දන්නවාද? (ආ) "වැවිලිකරුවකු සම්බන්ධයෙන් අවඥ සහගත ප්‍රකාශයන්" කළේය යන චෝදනාව උඩ සීමාසහිත ජෝර්ජ් ස්ටුවට් හා සමාගම නමැති සේවා යෝජකයා විසින් සේවකයකු සේවයෙන් පහ කිරීම සම්බන්ධයෙන් ඇතිවූ නඩුවක් විනිශ්චය කිරීමෙහි මොහු යෙදී සිටින බව එතුමා දන්නවාද? (ඉ) ක්‍රියාකාරී දේශපාලනඥයකු අධිකරණ විනිශ්චය මණ්ඩලයක සාමාජිකත්වය දැරීම ඉතාම නුසුදුසු හෙයින් කාර්මික උසාවි සාමාජික මණ්ඩලයෙන් මොහු ඉවත් කිරීමට එතුමා ක්‍රියා කරනවාද?

*தொழில், தொழில் வசதி, வீடமைப்பு அமைச்சரைக் கேட்ட வினா: (அ) ஐக்கிய தேசியக் கட்சியின் உறுப்பினரும், கொழும்பு மாநகர சபையின் மட்டக்குழி வட்டாரத்தின் ஐக்கிய தேசியக்கட்சியைச் சார்ந்த முன்னை நாள் மாநகர சபை உறுப்பினருமான திரு. அன்று த சில்வா, கைத்தொழில் நீதிமன்றத்தின் அங்கத்தவராகத் தெரிவு செய்யப்பட்டிருப்பதை அவர் அறிவாரா? (ஆ) ஜோர்ஜ் ஸ்டுவர்ட் கம்பெனியின் முதலாளி "ஒரு தோட்டத்துரையை பழித்துரைத்ததாக" குற்றஞ் சாட்டி ஒரு தொழிலாளியை வேலை நீக்கஞ் செய்ததன்பேரில் எழுந்த வழக்கில், தற்பொழுது தீர்ப்பளிக்கும் நீதவானாக இவர் இருக்கிறாரென்பதையும் அவர் அறிவாரா? (இ) ஓர் அரசியல்வாதி நீதிவழங்கும் ஒரு நீதிமன்றத்தில் உறுப்பினராகவிருப்பது மிகவும் முறையற்றதாகையால், கைத்தொழில் நீதிமன்ற நீதவான்கள் பட்டியலிலிருந்து இவரை அகற்ற அவர் நடவடிக்கை எடுப்பாரா?*

asked the Minister of Labour, Employment and Housing: (*a*) Is he aware that Mr. Andrew de Silva, ex-U.N.P. M.M.C. for Mattakkuliya and an active member of the United National Party has been appointed a member of Industrial Courts? (*b*) Is he also aware that at the moment, he is sitting in judgement in a case where the employer, George Steuart & Co., Ltd., dismissed an employee for allegedly making certain "disparaging remarks regarding a planter." (*c*) In view of the fact that it is most improper for an active politician to be a member of a judicial tribunal, will he take steps to have him removed from the panel of Industrial Courts?

**එස්. ද එස්. ජයසිංහ මයා.**
*(திரு. எஸ். டி எஸ். ஜயசிங்க)*
(Mr. S. de S. Jayasingha)

(අ) ඇන්ඩෘ ද සිල්වා මහතා දැනට ඇති කාර්මික අධිකරණ විනිශ්චය මණ්ඩලයේ සාමාජිකයෙකි. 1960 වර්ෂයේ සිට ඔහු දේශපාලන කටයුතු අත හැර දමා ඇත. (ආ) කාර්මික ආරාවුල් පනතේ 3 (1) (ඩී) වගන්තිය යටතේ ලංකා වෙළෙඳ සේවක සංගමය සහ සීමාසහිත ජෝර්ජ් ස්ටුවට් සහ සමාගම වෙනුවෙන් ලංකා සේවායයන්ගේ සම්මේලනයත් එක්ව කරන ලද නාම යෝජනාවක් අනුව සේවකයෙකුගේ සේවය හමාර කිරීම පිළිබඳ කාර්මික ආරාවුල බේරුම් කිරීම

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

සඳහා ඇත්ඩෘ ද සිල්වා මහතා බේරුම් කරුවකු හැටියට දැනට කටයුතු කරයි. (ඉ). (අ) සහ (ආ) හි දී ඇති පිළිතුර අනුව මෙම ප්‍රශ්නය පැන නොනඟී.

## ඉංගිරියේ බෞද්ධ පාසල : ගොඩනැගිලි

இங்கிரிய பௌத்த பாடசாலை : கட்டடங்கள்

INGIRIYA BUDDHIST SCHOOL : BUILDINGS

9. **එම්. පී. ද සොයිසා සිරිවර්ධන මයා.** (මිනුවන්ගොඩ) (රත්නසිරි වික්‍රමනායක මයා.—හොරණ—වෙනුවට)

*(திரு. எம். பீ. டி சொய்சா சிறிவர்தன—மினுவாங்கொட—திரு. ரத்னஸிரி விக்ரம நாயக்க—ஹொறணை—சார்பாக)*

(Mr. M. P. de Zoysa Siriwardena—Minuwangoda—on behalf of Mr. Ratnasiri Wickramanayaka—Horana)

අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) ක/ඉංගිරියේ බෞද්ධ පාසැලට අක්කර 5 ක ඉඩම් ප්‍රමාණයක් අත්පත් කරගෙන ඇති බව එතුමා දන්නවාද ? (ආ) මෙම ස්ථානයට මෙම පාසැල ගෙනයෑම පිණිස අවශ්‍ය ගොඩනැගිලි තවම ඉදිකර නැති බව එතුමා දන්නවා ද ? (ඉ) මෙම ගොඩනැගිලි ඉදිකිරීම පිණිස අවශ්‍ය මුදල් නව මුදල් වර්ෂයේදී වෙන් කරනවා ද ? (ඊ) නැතහොත්, ඒ මන් ද ?

*கல்வி, கலாசார அமைச்சரைக் கேட்ட வினா : (அ) க/இங்கிரிய பௌத்த பாடசாலைக்கு 5 ஏக்கர் காணியைச் சுவீகரித்திருப்பதை அவர் அறிவாரா ? (ஆ) அந்தக் காணிக்கு இப்பாடசாலையைப் புடைபெயரச் செய்வதற்கு, அவசியமான கட்டடங்கள் இன்னும் எழுப்பப்படவில்லையென்பதை அவர் அறிவாரா ? (இ) இக்கட்டடங்களை எழுப்புவதற்கு அவசியமான பணத்தை புதிய நிதி ஆண்டில் ஒதுக்குவாரா ? (ஈ) இன்றேல் ஏன் ?*

asked the Minister of Education and Cultural Affairs : (*a*) Is he aware that five acres of land have been acquired for the ක/Ingiriya Buddhist School ? (*b*) Is he aware that the necessary buildings have not yet been erected for the school to be shifted to this place ? (*c*) Will he provide during the new financial year the funds necessary for constructing these buildings ? (*d*) If not, why ?

**ජයසූරිය මයා.**

*(திரு. ஜயசூரிய)*

(Mr. Jayasuriya)

(*a*) Extent of land acquired is four acres. (*b*) Yes. (*c*) Will be considered with the other priorities. (*d*) Does not arise.

## කුලියාපිටිය නගර සභාව : ජල යෝජනා ක්‍රම කොන්ත්‍රාත්තුව

குளியாப்பிட்டி பட்டினசபை : தண்ணீர் விநியோகத் திட்ட ஒப்பந்தம்

KULIYAPITIYA TOWN COUNCIL : CONTRACT FOR WATER SCHEME

10. **ලෙස්ලි ගුණවර්ධන මයා.** (ආචාර්ය එන්. එම්. පෙරේරා වෙනුවට)

*(திரு. லெஸ்லி குணவர்தன—கலாநிதி என். எம். பெரேரா சார்பாக)*

(Mr. Leslie Goonewardene—on behalf of Dr. N. M. Perera)

පළාත් පාලන ඇමතිගේ සහ ප්‍රවෘත්ති හා ගුවන් විදුලි ඇමතිගේ පාර්ලිමේන්තු ලේකම්ගෙන් ඇසූ ප්‍රශ්නය : (අ) කුලියාපිටිය නගර සභාව සඳහා ජලයෝජනා ක්‍රමයක් පිළිබඳ කොන්තරාත්තුවක් ටැන්ඩර මගින් දුන් බව එතුමා දන්නවාද ? (ආ) එසේ නම්, ටැන්ඩර බාරගත් අවසාන දිනය කවදා ද ? (ඉ) අඩුම ටැන්ඩරකරුට කොන්තරාත්තුව දෙන ලද්දේද ? (ඊ) අවසානයේදී කොන්තරාත්තුව දෙන ලද්දේ කාටද ?

*உள்ளூராட்சி அமைச்சரினதும், தகவல், ஒலிபரப்பு அமைச்சரினதும் பாராளுமன்றக் காரியதரிசியைக் கேட்ட வினா : (அ) குளியாப்பிட்டி பட்டின சபைக்கு ஒரு தண்ணீர் விநியோகத்திட்டத்திற்கான ஒப்பந்தம் கேள்விப் பத்திர முறையில் கொடுக்கப்பட்டதை அவர் அறிவாரா ? (ஆ) அப்படியாயின், கேள்விப் பத்திரங்களை ஏற்பது எப்போது முடிவுற்றது ? (இ) ஆகக் குறைந்த கேள்விப்பத்திர தாரருக்குத்தான் இந்த ஒப்பந்தம் கொடுக்கப்பட்டதா ? (ஈ) இறுதியில் யாருக்கு இவ்வொப்பந்தம் கொடுக்கப்பட்டது ?*

asked the Parliamentary Secretary to the Minister of Local Government and to the Minister of Information

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ලෙස්ලි ගුණවර්ධන මයා.]

& Broadcasting: (a) Is he aware that a contract for a water scheme for the Kuliyapitiya Town Council was given out on tender? (b) If so when did the tenders close? (c) Was the contract given to the lowest tenderer? (d) To whom was the contract eventually given?

**ආර්. ප්‍රේමදාස මයා. (පළාත් පාලන ඇමතිගේ සහ ප්‍රවෘත්ති හා ගුවන් විදුලි ඇමතිගේ පාර්ලිමේන්තු ලේකම්)**

*(திரு. ஆர். பிரேமதாச—உள்ளூராட்சி அமைச்சரதும், தகவல், ஒலிபரப்பு அமைச்சரதும் பாராளுமன்றக் காரியதரிசி)*

(Mr. R. Premadasa—Parliamentary Secretary to the Minister of Local Government and to the Minister of Information & Broadcasting)

කුලියාපිටිය ජල යෝජනා ක්‍රමය ගැන කොන්ත්‍රාත් 5 ක් අඩංගුයි. අහන්නේ කොයි කොන්ත්‍රාත් ක්‍රමය ගැනදැයි පැහැදිලිව සඳහන් කර නැති නිසා, අසා තිබෙන විස්තර ඒ කොන්ත්‍රාත් 5 සම්බන්ධයෙන්ම සපයන්නට කැමැතියි. පිළිතුර දිග වැඩි නිසා එය සභාගත කරනවා.

**සභාමේසය මත තබන ලද පිළිතුර මෙසේ යි:**

*சபாபீடத்தில் வைக்கப்பட்ட விடை வருமாறு:*

*The Answer tabled is as follows:*

**1. කුලියාපිටිය ජලසම්පාදන ක්‍රමය—පොම්ප මූලිකය සහ බෙදාහැරීමේ ක්‍රමය.**

(අ) ඔව්. (ආ) ටැන්ඩර භාරගත් අවසාන දිනය, 65.4.19 වැනි දිනය. (ඇ) ඔව්. (ඈ) මෙය දෙනු ලැබුවේ සීමාසහිත සැමුවෙල් සහ පුත්‍ර සමාගමටය.

**2. කුලියාපිටිය ජලසම්පාදන ක්‍රමය—ජල පවිත්‍රීකරණ යන්ත්‍රය සැපයීම සහ සවිකිරීම.**

(අ) ඔව්. (ආ) ටැන්ඩර භාරගත් අවසාන දිනය 66.6.18 වැනි දිනය. (ඇ) නැත. එය දෙනු ලැබුවේ අඩුම හා සතුටුදායක ටැන්ඩර්කරුවය. (ඈ) සීමාසහිත වෝකර් ඇන්ඩ් ග්‍රිග් ව්‍යාපාර සමාගමට මෙම කොන්ත්‍රාත්තුව දෙනු ලැබිය.

**3. කුලියාපිටිය ජලසම්පාදන යෝජනා ක්‍රමය—ජලය ඇතුල්කර ගන්නා කාමරය සහ පොම්ප ගෙය දිය කුළුණ සහ නිවාස.**

(අ) ඔව්. (ආ) ටැන්ඩර භාරගත් අවසාන දිනය 66.5.13 වැනි දිනය. (ඇ) ඔව්. (ඈ) සීමාසහිත ඉක්විප්මන්ට් ඇන්ඩ් කන්ස්ට්‍රක්ෂන් ව්‍යාපාර සමාගමට කොන්ත්‍රාත්තුව දෙනු ලැබිය.

**4. කුලියාපිටිය ජලසම්පාදන යෝජනා ක්‍රමය—දිය කුළුණේ ටැම් පදනම—කුළුණු කලාප අංක 1.**

(අ) ඔව්. (ආ) ටැන්ඩර භාරගත් අවසාන දිනය 67.2.26 වැනි දිනය. (ඇ) ඔව්. (ඈ) සීමාසහිත කලම්බු කොමර්ෂල් සමාගමට මෙකී ටෙන්ඩරය දෙනු ලැබිය.

**5. කුලියාපිටිය ජලසම්පාදන යෝජනා ක්‍රමය—දිය කුළුණේ ටැම් පදනම.**

(අ) ඔව්. (ආ) ටැන්ඩර භාරගත් අවසාන දිනය 64. 12. 24 වැනි දිනය. (ඇ) ඔව්. (ඈ) සීමාසහිත කලම්බු කොමර්ෂල් සමාගමට ටැන්ඩරය දෙනු ලැබිය.

**(1) குளியாப்பிட்டி நீர்வழங்கல் திட்டம் :—பிரதான பம்புதலும் பங்கீடுமுறையும் ;** (அ) ஆம் ; (ஆ) கேள்விப்பத்திரங்களை ஏற்பது 19.4.65 இல் முடிவுற்றது ; (இ) ஆம் ; (ஈ) இது (வரையறுக்கப்பட்ட) சாமுவேல் சன்ஸ் அன் கூட்டு நிலையத்தாருக்கு வழங்கப்பட்டது.

**(2) குளியாப்பிட்டி நீர்வழங்கல் திட்டம் :—நீர்ச்சுத்திகரிப்பும் பொறியை வழங்கலும் நிறுவுதலும் ;** (அ) ஆம் ; (ஆ) கேள்விப்பத்திரங்களை ஏற்பது 18.6.66 இல் முடிவுற்றது ; (இ) இல்லை. குறைந்த திருப்திகரமான கேள்விப்பத்திரதாரருக்குத்தான் இது வழங்கப்பட்டது ; (ஈ) இது (வரையறுக்கப்பட்ட) வாக்கர் அன் கிறெய்க் நிலையத்தாருக்கு வழங்கப்பட்டது.

**(3) குளியாப்பிட்டி நீர்வழங்கல் திட்டம் :—நீரை உள்ளிழுக்கும் கூடமும், பம்பி மனையும், நீர்த்தூபியும் குடிமனையும் ;** (அ) ஆம் ; (ஆ) கேள்விப்பத்திரங்களை ஏற்பது 13.5.66 இல் முடிவுற்றது ; (இ) ஆம் ; (ஈ) இந்த ஒப்பந்தம் (வரையறுக்கப்பட்ட) ஈகியூப்மென்ற் அன் கொன்ஸ்றக்ஷன் கூட்டு நிலையத்தாருக்கு வழங்கப்பட்டது.

**(4) குளியாப்பிட்டி நீர்வழங்கல் திட்டம் :—நீர்த்தூபி வலயம் எண் 1, நீர்த்தூபிக்கான முளைக்கோல் அத்திவாரம் ;** (அ) ஆம் ; (ஆ) கேள்விப்பத்திரங்களை ஏற்பது 26.2.67 இல் முடிவுற்றது ; (இ) ஆம் ; (ஈ) இது (வரையறுக்கப்பட்ட) கொழும்பு கொம்மேஷல் கூட்டுநிலையத்தாருக்கு வழங்கப்பட்டது.

**(5) குளியாப்பிட்டி நீர்வழங்கல் திட்டம் :—நீர்த்தூபிக்கான முளைக்கோல் அத்திவாரம் ;** (அ) ஆம் ; (ஆ) கேள்விப்பத்திரங்களை ஏற்பது 24.12.64 இல் முடிவுற்றது ; (இ) ஆம் ; (ஈ) இது (வரையறுக்கப்பட்ட) கொம்மேஷல் கூட்டு நிலையத்தினருக்கு வழங்கப்பட்டது

1. *Kuliyapitiya Water Supply Scheme—Pumping Main and Distribution System.*

(a) Yes.

(b) Tenders closed on 19.4.65.

(c) Yes.

(d) This was awarded to Messrs. Samuel Sons & Co. Ltd.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

2. *Kuliyapitiya Water Supply Scheme—Supply and Installation of Purification Plant.*

(*a*) Yes.

(*b*) Tenders closed on 18.6.66.

(*c*) No. It was awarded to the lowest satisfactory tenderer.

(*d*) This contract has been awarded to Messrs. Walker & Greig Ltd.

3. *Kuliyapitiya Water Supply Scheme—Intake Chamber and Pump House, Water Tower and Quarters.*

(*a*) Yes.

(*b*) Tenders closed on 13.5.66.

(*c*) Yes.

(*d*) The contract was awarded to Messrs. Equipment & Construction Co. Ltd.

4. *Kuliyapitiya Water Supply Scheme—Pile Foundation for Water Tower, Tower Zone No. 1.*

(*a*) Yes.

(*b*) Tenders closed on 26.2.67.

(*c*) Yes.

(*d*) This tender was awarded to Messrs. Colombo Commercial Co. Ltd.

5. *Kuliyapitiya Water Supply Scheme—Pile Foundation for Water Tower.*

(*a*) Yes.

(*b*) Tenders closed on 24.12.64.

(*c*) Yes.

(*d*) Tender has been awarded to Messrs. Colombo Commercial Co. Ltd.

## ජාඇල ලංගම ඩිපෝව ඉදිකිරීමේ ටෙන්ඩර්

*ஜாஎலேயில் இ. போ. ச. சாலே : கேள்விப்பத்திரங்கள்*

**C. T. B. DEPOT FOR JA-ELA : TENDERS**

11. **ලෙස්ලි ගුණවර්ධන මයා.** (ආචාර්ය එන්. එම්. පෙරේරා වෙනුවට)

*(திரு. லெஸ்லி குணவர்தன—கலாநிதி என். எம். பெரேரா சார்பாக)*

(Mr. Leslie Goonewardene—on behalf of Dr. N. M. Perera)

ජනසතු සේවා ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය : (අ) ලං.ග.ම. ඩිපෝවක් ජාඇල ඉදිකිරීමට යෝජනා කර තිබේද? (ආ) ලං.ග.ම. ඩිපෝව ඉදිකිරීම සඳහා ටෙන්ඩර් කැඳවන ලද්දේද? (ඉ) ටෙන්ඩර් භාර ගැනීම අවසන් කරන ලද්දේ කවදාද? (ඊ) අඩුම ටෙන්ඩරය පිළිගන්නා ලද්දේද? (උ) ටෙන්ඩරය දෙන ලද්දේ කාටද?

*தேசியமயச் சேவை அமைச்சரைக் கேட்ட வினா : (அ) ஜாஎலேயில் இலங்கைப் போக்குவரத்துச் சபைச் சாலே ஒன்றைக் கட்டுவதற்கு உத்தேசிக்கப்பட்டுள்ளதா? (ஆ) இச்சாலேயைக் கட்டுவதற்குக் கேள்விப் பத்திரங்கள் கோரப்பட்டனவா? (இ) கேள்விப் பத்திரங்கள் பெற்றுக்கொள்ள வேண்டிய கடைசி நாள் எது? (ஈ) மிகக் குறைந்த கேள்விப் பத்திரம் ஏற்றுக்கொள்ளப்பட்டதா? (உ) ஏற்கப்பட்ட கேள்விப் பத்திரம் யாருடையது?*

asked the Minister of Nationalized Services: (*a*) Is it proposed to build a C.T.B. depot at Jaela? (*b*) Were tenders called for the building of this C.T.B. depot? (*c*) When were the tenders closed? (*d*) Was the lowest tender accepted? (*e*) To whom was the tender awarded?

**එස්. ද එස්. ජයසිංහ මයා. (ජනසතු සේවා ඇමති වෙනුවට)**

*(திரு. எஸ். டி எஸ். ஜயசிங்ஹ—தேசியமய சேவை அமைச்சர் சார்பாக)*

(Mr. S. de S. Jayasingha—on behalf of the Minister of Nationalized Services)

(අ) ඔව්. (ආ) ඔව්. (ඉ) මේ සඳහා ටෙන්ඩර් දෙකක් කැඳවන ලදුව, (i) ගොඩනැගිලි, පාරවල් සහ අංගන තැනීම සඳහා වූ අංක ඊ.සී/204 දරන කොන්ත්‍රාත්තුව සම්බන්ධයෙන් 1966.6.15 වැනි දිනද, (ii) ආපනශාලාව, විවේක කාමරය සහ ඩිපෝ අධිකාරීගේ කාර්යාලය තැනීම සඳහා වූ අංක ඊ.සී/221 දරන කොන්ත්‍රාත්තුව සම්බන්ධයෙන් 1966.8.31 වැනි දිනද ටෙන්ඩර් බාරගැනීම අවසන් කරන ලදී. (ඊ) ඔව්. දෙවැනි ටෙන්ඩරය සම්බන්ධයෙන් මිළ ගණන් කැඳවන ලද අතර, පිළිගන්නා ලද ටෙන්ඩරය පදනම් වූයේ ටෙන්ඩර්කරුවන් විසින් ඉදිරිපත් කරන ලද අඩුම රේට් ප්‍රමාණයන් මතය. (උ) සීමාසහිත "ඉක්විප්මන්ට් ඇන්ඩ් කන්ස්ට්‍රක්ෂන්" සමාගම.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

## අත්‍යන්ත්‍ර රෙදි මධ්‍යස්ථානවලට නූල් නිකුත් කිරීම

### கைத்தறி நிலையங்களுக்கு நூல் வழங்கல்

### ALLOCATIONS OF THREAD FOR HANDLOOM CENTRES

16. **ද සොයිසා සිරිවර්ධන මයා.** (එෆ්. ආර්. ඩයස් බණ්ඩාරනායක මයා.—දොම්පෙ—වෙනුවට)

*(திரு. டி சொய்ஸா சிறிவர்தன—திரு. எப். ஆர். டயஸ் பண்டாரநாயக்க—தொம்பே—சார்பாக)*

(Mr. de Zoysa Siriwardena—on behalf of Mr. F. R. Dias Bandaranaike—Dompe)

ස්වදේශ කටයුතු ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) නූල් නිකුත් කිරීම 1965 ඔක්තෝබර් මාසයට පෙර ලියාපදිංචි කරනු ලැබූ මධ්‍යස්ථානවලට පමණක් සීමා කිරීමට අමාත්‍යාංශය සහ ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තුව ප්‍රතිපත්ති තීරණයක් ගෙන ඇතැයි යන හේතුව මත, පූගොඩ, කුමාරිමුල්ලේ ඒ. එල්. එම්. මූසින් මහතාට ස්වකීය අත්‍යන්ත්‍ර මධ්‍යස්ථානය සඳහා නූල් ලබාගැනීමට බල පත්‍රයක් දීම ප්‍රතික්ෂෙප කරනු ලැබිද? (ආ) වෙනත් අවස්ථා කීපයකදී අමාත්‍යාංශය සහ දෙපාර්තමේන්තුව මෙම ප්‍රතිපත්ති තීරණය අනුව කටයුතු නොකරන ලද බව එතුමා දන්නවාද? (ඉ) 1965 ඔක්තෝබර් මාසයට පෙර ලියාපදිංචි වී නොසිටියදී, යන්ත්‍ර 24 කින් යුත් අත්‍යන්ත්‍ර මධ්‍යස්ථානයක් පවත්වාගෙන යන නුගේගොඩ, පරණ පාරේ අංක 153 දරන ස්ථානයේ ඩබ්ලිව්. දිසානායක මහතාට 1967 දී නූල් දීම අනුමත කරන ලද බව එතුමා දන්නවාද? (යොමු අංකය: OF 9/6/67) (ඊ) අත්‍යන්ත්‍ර මධ්‍යස්ථානයක් පවත්වාගෙන යන නාවානේ, හරවත්තේ ඇසිලින් නෝනා මහත්මියට කලින් කිසිම ලියාපදිංචි වීමකින් තොරව, 1.7.67 දින නූල් කොටස් ප්‍රමාණයක් අනුමත කරන ලද බවත් එතුමා දන්නවාද? (උ) මේ ගැන එතුමා පරීක්ෂා කරනවාද?

*உள்நாட்டு விவகார அமைச்சரைக் கேட்ட வினா: (அ) 1965 ஆம் ஆண்டு ஒக்ரோபருக்கு முன்னர் பதிவு செய்யப்பட்ட கைத்தறி நிலையங்களுக்கே நூல் வழங்க வேண்டுமென்ற கொள்கைத் தீர்மானத்தைக் கிராம அபிவிருத்தித் திணைக்களமும் அமைச்சும் எடுத்ததாலா, பூகொட, குமாரிமுல்லையில் வசிக்கும் ஜனாப் ஏ. எல். எம். மூசினுக்கு அவரது கைத்தறி நிலையத்திற்கு நூல் பெறுவதற்கான அனுமதி மறுக்கப்பட்டது? (ஆ) இக்கொள்கைத் தீர்மானம் பல்வேறு சந்தர்ப்பங்களில் அமைச்சாலும் திணைக்களத்தாலும் கடைப்பிடிக்கப்படவில்லையென்பதை அவர் அறிவாரா? (இ) 1965 ஆம் ஆண்டு ஒக்ரோபருக்கு முன்னர் பதிவு செய்யாதிருந்தபோதிலும், 24 இயந்திரங்களைக் கொண்ட கைத்தறி நிலையத்தை நடாத்தும், நுகேகொடை, 153, பழைய தெருவில் வசிக்கும் திரு. டபிள்யு. திசாநாயக்கவுக்கு 1967 ஆம் ஆண்டிலும் நூல் பெற அனுமதியளிக்கப்பட்டுள்ளதை அவர் அறிவாரா? (ஈ) ஒரு கைத்தறி நிலையத்தை நடாத்தும் நாவன, ஹறவத்தையில் வசிக்கும் திருமதி அஸிலின் நோனா முன்னொரு போதும் பதிவு செய்திராதபோதிலும், 1.7.67 அன்று ஒரு பங்கு நூல் பெற அனுமதி வழங்கப்பட்டதையும் அவர் அறிவாரா? (உ) இவ்விடயம்பற்றி அவர் கவனம் செலுத்துவாரா?*

asked the Minister of Home Affairs: (*a*) Was Mr. A. L. M. Mushin of Kumarimulla, Pugoda, refused a permit to obtain thread for his handloom centre on the ground that the Department of Rural Development and the Ministry have taken a policy decision to restrict the issue of thread to those centres that were registered prior to October 1965? (*b*) Is he aware that in several other instances this policy decision is not being observed by the Ministry and the department? (*c*) Is he aware that Mr. W. Dissanayake of No. 153, Old Road, Nugegoda, who runs a handloom centre with 24 machines was allowed thread in 1967 without being registered prior to October 1965? (Ref. No. OF 9/6/67) (*d*) Is he also aware that Mrs. Asilin Nona of Harawatte, Nawana, who runs a handloom centre was allowed an allocation of thread on 1.7.67 without any prior registration? (*e*) Will he look into this matter?

**විජයපාල මෙන්ඩිස් මයා.** (ස්වදේශ කටයුතු පිළිබඳ ඇමති වෙනුවට)

*(திரு. விஜயபால மெண்டிஸ்—உள்நாட்டு விவகார அமைச்சர் சார்பாக)*

(Mr. Wijayapala Mendis—on behalf of the Minister of Home Affairs)

(අ) ඔව්. ඒ. එල්. එම්. මූසින් මහතාගේ අත්‍යන්ත්‍ර වැඩපොළ පටන්ගෙන ඇත්තේ 1967 තේ ජනවාරි මාසේ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

බැවින් කපු නූල් නිකුත් කිරීම සඳහා ලියාපදිංචි කර නැත. (ආ) නැත. (ඉ) නැත. (ඊ) නැත. (උ) වැඩිදුර විස්තර ලැබෙන්නේ නම් මම තවදුරටත් පරීක්ෂා කර බලන්නෙමි.

**ද සොයිසා සිරිවර්ධන මයා.**
*(திரு. டி சொய்சா சிறிவர்தன)*
(Mr. de Zoysa Siriwardena)

ලියාපදිංචි වූ ස්ථානවලටත් නූල් නොලැබෙන බව දන්නවාද?

**විජයපාල මෙන්ඩිස් මයා.**
*(திரு. விஜயபால மெண்டிஸ்)*
(Mr. Wijayapala Mendis)

ගරු ඇමතිතුමාට ඒ ගැන මම දැනුම් දෙන්නම්. මා නම් එය දන්නේ නැහැ.

## ශෝක ප්‍රකාශය : ඩී. ඒ. රාජපක්ෂ මහතා

*அனுதாபத் தீர்மானம் : திரு. டீ. ஏ. ராஜபக்ஷ*

## VOTE OF CONDOLENCE : MR. D. A. RAJAPAKSA

අ. භා. 2.21

**ගරු සී. පී. ද සිල්වා (ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල ඇමති හා සභානායක)**
*(கௌரவ சி. பீ. டி சில்வா—காணி, நீர்ப்பாசன, மின்விசை அமைச்சரும் சபை முதல்வரும்)*
(The Hon. C. P. de Silva—Minister of Land, Irrigation and Power and Leader of the House)

ගරු කථානායකතුමනි, ඔබතුමාගේ අවසරය ඇතිව බෙලිඅත්තේ මහජන මන්ත්‍රී වශයෙන්ද නියෝජ්‍ය කථානායක වශයෙන්ද සිටි ඩී. ඒ. රාජපක්ෂ මහතාගේ අභාවය ගැන සඳහන් කිරීමට සිදු වී ඇත.

රාජපක්ෂ මහතා පළමුව වීරකැටියේ ගමේ පාසලේ මූලික අධ්‍යාපනය ලැබ උසස් අධ්‍යාපනය සඳහා ගාල්ලේ රිච්මන්ඩ් විද්‍යාලයට ඇතුළු විය. එහිදී එතුමා දක්ෂ ක්‍රීඩකයකු වශයෙන් බැබලුනි. එතුමා විද්‍යාලයීය ක්‍රිකට් හා පාපන්දු කණ්ඩායම්වල නායකයා වශයෙන් ක්‍රීඩා කෙළේය. එතුමා සාර්ථක වැවිලිකරුවෙක් විය. මුල් අවධියෙහිදී එතුමා දේශපාලනය ගැන උනන්දුවක් නොදැක් වූවත්, "රුහුණේ සිංහයා" නම් ලත් එතුමාගේ ආදර සොයුරු ඩී. එම්. රාජපක්ෂ මහතාගේ ඇවැමෙන් දේශපාලනයට බලෙන්ම ඇදී ගියේය. 1945 දී පැවැති අතුරු මැතිවරණයෙන් ජයගෙන හම්බන්තොට ආසනය වෙනුවෙන් රාජ්‍ය මන්ත්‍රණ සභාවට ඉදිරිපත් විය. එවක් පටන් 1960 සුළු කාලයක් හැර 1964 තෙක් එතුමා මන්ත්‍රී මණ්ඩලයේ පෙනී සිටියේය. එක් කලෙක එතුමා ඉඩම්, වාරිමාර්ග හා විදුලි බල අමාත්‍යාංශයේ පාර්ලිමේන්තු ලේකම් වශයෙන්ද තවත් කලෙක මෙම ගරු සභාවේ නියෝජ්‍ය කථානායක ධුරයේද සේවය කෙළේය.

ගරු කථානායකතුමනි, ඩී. ඒ. රාජපක්ෂ මහතා අවංචල සිත් ඇති මන්ත්‍රීතුමකු වශයෙන් සිටි බව කියන විට ඔබතුමා එකඟ වෙනවා ඇති. එතුමාගේ කාරුණික පරහිතකාමි ගතිගුණ නිසා පළාතේ ඉඩම් නොමැති අසරණ ගැමියන්ගේ තත්ත්වය නඟා සිටුවීමට කටයුතු කරන්නට එතුමාට හැකි විය.

ගරු කථානායකතුමනි, එතුමාගේ අභාවය ගැන මෙම මන්ත්‍රී මණ්ඩලයේ සියලු දෙනා වෙනුවෙන්ම අපගේ බලවත් ශෝකය ප්‍රකාශ කරමු. ශෝකයට පත් එතුමාගේ පවුලේ අයට මෙම වාර්තාවේ පිටපතක් යැවීමට මෙම මණ්ඩලයේ සංවිධායකට නියෝග කරන මෙන් ඉල්ලා සිටිමි.

අ. භා. 2.24

**මෛත්‍රීපාල සේනානායක මයා. (මැදවච්චිය)**
*(திரு. மைத்திரிபால சேனநாயக்க—மதவாச்சி)*
(Mr. Maithripala Senanayake—Medawachchiya)

ගරු කථානායකතුමනි, හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු වූ ඩී. ඒ. රාජපක්ෂ මැතිතුමාණන්ගේ අභාවය ගැන ගරු සභානායකතුමා දැන් ඉදිරිපත් කළ යෝජනාව විරුද්ධ පාර්ශ්වය වෙනුවෙන්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[මෛත්‍රීපාල සේනානායක මයා.]

අනුමත කරන අතරම අපගේ ශෝකය මේ අවස්ථාවේදී පළ කරන්නට සිද්ධවෙලා තිබෙනවා.

අභාවප්‍රාප්ත ඩී. ඒ. රාජපක්‍ෂ මැතිතුමා දකුණේ වැදගත් පවුලක උපන් කෙනකු වශයෙන් මෙන්ම පොදු මහ ජනතාවගේ නායකයා වශයෙනුත් පළමු වන වරට එතුමාගේ සහෝදරයා වූ, එවකට තිබුණු මන්ත්‍රී මණ්ඩලයෙහි සේවය කළ මන්ත්‍රීවරයකු වූ ඩී. එම්. රාජපක්‍ෂ මහත් මයාගේ අභාවයෙන් පසු 1945 දී පත් වූ බව අප කවුරුත් දන්නවා. එවක් පටන් ගත වූ ඒ දීර්ඝ කාලය තුළ මාස තුනකට පමණක් සීමා වූ කෙටි කාලයක් හැරෙන්නට 1965 මාර්තු මාසයේදී පවත්වන ලද මහා මැතිවරණය තෙක් නොකඩවාම වාගේ අවුරුදු විසි ගණනක කාලයක් තිස්සේ මේ ගරු සභාවේ මන්ත්‍රීවරයකු වශයෙන් එතුමා සේවය කළා. 1960 මාර්තු මාසයේදී පවත්වන ලද මහා මැතිවරණයේදී ලත් පරාජය හැරෙන්නට 1965 දක්වා එතුමා මන්ත්‍රීවරයකු වශයෙන් සේවය කළා. මේ කාලය තුළ එතුමා උප ඇමතිවරයකු—පාර්ලිමේන්තු ලේකම්වරයකු—වශයෙනුත් කලක් සේවය කළා. ඒ වාගේම එතුමා නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ නියෝජ්‍ය කථානායක වශයෙන්ද කලක් සිටියා.

ඩී. ඒ රාජපක්‍ෂ මැතිතුමා තමන්ගේ ප්‍රදේශයේ ජනතාවට ලොකු සේවයක් කළ බව එතුමාගේ ආදාහන උත්සවය තිබුණු දවසේ රැස්ව සිටි මහජනයාගෙන් ඔප්පු වන්නට ඇතැයි මා හිතනවා. මගේ ආරංචියේ හැටියට මට වඩා හොඳට එදා පැමිණ සිටි අය ඒ ගැන දන්නවා ඇති. එතුමා පොදු මහජනතාව සමග ඉතාමත් කිට්ටුවෙන් ආශ්‍රය කළ බවත් පොදු මහ ජනතාවගේ ඕනෑඑපාකම් ගැන ඉතාමත් ඕනෑකමින් සහ උනන්දුවෙන් ක්‍රියා කළ බවත් කියන්නට පුළුවනි. මහජන මන්ත්‍රීවරයකු වශයෙන් එතුමා කළ උදාර සේවය ගැන අපට මේ අවසථාවේ මතක් කරන්නට, සිහිපත් කරන්නට පුළුවන්වෙලා තිබෙනවා. එතුමාගේ අභාවය, එතුමා සමග කිට්ටුවෙන් ආශ්‍රය කළ මන්ත්‍රීවරුන් වශයෙන් අපට ලොකු දුකක් ඇති කළා පමණක් නොව කාලයක් තිස්සේ එතුමා නියෝජනය කළ ප්‍රදේශයේ පොදු මහ ජනතාවටත් බලවත් ශෝකයක් පහළ කළ සිද්ධියක් වූ බව අපට දැනගන්නට ලැබී තිබෙනවා.

එතුමාගේ ජීවිතයේ විශේෂ සිද්ධියක් ගැන මා සඳහන් කරන්නට කැමතියි. 1951 වර්ෂයේදී, එවකට තිබුණු ආණ්ඩුවේ පළාත් පාලන හා සෞඛ්‍ය ඇමති වශයෙන් සිටි එස්. ඩබ්ලිව්. ආර්. ඩී. බණ්ඩාරනායක මැතිතුමාත් සමග පොදු මහජනතාවගේ සුභ සිද්ධියට වැඩ කිරීමේ අභිප්‍රායෙන් එඩිතරව එවකට තිබුණු ආණ්ඩුවෙන් ඉවත්ව විරුද්ධ පක්‍ෂයට පැමිණි මන්ත්‍රීවරුන් හය දෙනාගෙන් අභාවප්‍රාප්ත ඩී. ඒ. රාජපක්‍ෂ මැතිතුමාත් එක් අයෙකු බව මා ආඩම්බරයෙන් මතක් කරනවා. ඉන්පසු එස්. ඩබ්ලිව්. ආර්. ඩී. බණ්ඩාරනායක මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් ශ්‍රී ලංකා නිදහස් පක්‍ෂය පිහිටුවාගෙන මේ රටේ මහ ජන යුගයක් උදා කරවීමට යම් යම් අය කොටස්කරුවන් වුණා නම් ඩී. ඒ. රාජපක්‍ෂ මැතිතුමාත් එයින් එක් කොටස්කරුවකු බව මා මතක් කරනවා. විරුද්ධ පාර්ශ්වයේ අප එතුමාගේ අභාවය ගැන බලවත් සේ ශෝක වන බව ප්‍රකාශ කරන අතරම ගරු සභානායකතුමා ඉදිරිපත්කළ ඒ යෝජනාව මා අනුමත කරනවා. මේ ගරු සභාවේ ශෝකය ප්‍රකාශ කරන අද දින නිල වාර්තාවේ පිටපතක් එතුමාගේ පවුලේ අයට යවන මෙන් මා ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා.

අ. භා. 2.28

**ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා**
*(கலாநிதி கொல்வின் ஆர். டி சில்வா)*
(Dr. Colvin R. de Silva)

ගරු කථානායකතුමනි, මුළු විරුද්ධ පාර්ශ්වය වෙනුවෙන්ම මැදවච්චියේ ගරු මන්ත්‍රීතුමා කථා කළේ වී නමුත් අභාවප්‍රාප්ත ඩී. ඒ. රාජපක්‍ෂ මැතිතුමා පිළිබඳව මමත් මේ අවස්ථාවේදී වචන සවල්පයක් ප්‍රකාශ කරන්නට බලාපොරොත්තු වෙනවා. රාජපක්‍ෂ පවුල දකුණු පළාතේ කොයි විධියේ, කොයි තරමේ, කොයි ප්‍රමාණයේ තත්ත්වයක් දරණවාද යන්න මුලින්ම මුළු රටටම දැනගන්නට ලැබුණේ අභාවප්‍රාප්ත ඩී. ඒ. රාජපක්‍ෂ මැතිතුමාගේ සහෝදරයා වන ඩී. එම්. රාජපක්‍ෂ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

මැතිතුමා එදා රාජ්‍ය මන්ත්‍රණ සභාවට පැමිණ, දකුණේ—විශේෂයෙන්ම දකුණේ ගොවි ජනතාවගේ—හඬ මේ සභා ගර්භය තුළ නැගූ විටයි. ඒ ඞී. එම්. රාජපක්ෂ මහත්මයාගේ සේවයට සම්බන්ධ වූ ඞී. ඒ. රාජපක්ෂ මහතාමයාගෙනුත් දකුණේ බහු ජනතාවට විශේෂයෙන්ම ගොවි ජනතාවට පළල් සේවයක් ඉටුවූ බව මා මතක් කර නවා.

මට ප්‍රථමයෙන් කථා කළ හිටපු ඇමතිතුමා කිවාක් මෙන් ඞී. ඒ. රාජපක්ෂ මහත්මයා නිහතමානී කෙනෙක්. බොහොම නිවුණු, බොහොම ඉවසිලිවන්තව කටයුතු කළ කෙනෙක්; කට හඬ නගා ගත්තේවත් නැතිව හැසිරුණු, ගැවසුණු කෙනෙක්. ඒ මහත්මයාගෙන් කවදාවත් කාටවත් වචනයකින්වත් සිත රිදෙන ක්‍රියාවක් නොවූවාය කියා අප සියලු දෙනාටම කියන්නට පුළුවන් ශක්තියක් තිබෙනවා. නමුත් එවැනි නිවුණු ගතියක් තිබුණත්, වැඩිය නොපෙනෙන්නට තිබුණාට, ඒ මහත්මයා තුළ ප්‍රතිපත්ති පිළිබඳව නම් දැඩි ගතියක් තිබුණු බව මා මතක් කර නවා. එදා එස්. ඩබ්ලිව්. ආර්. ඞී. බණ්ඩාරනායක මැතිතුමා ආණ්ඩු පක්ෂයේ සිට විරුද්ධ පක්ෂයට පැමිණි අවස්ථාවේදී—ඒ මොහොතේම—එතුමාත් සමග ආණ්ඩුවෙන් ඉවත්ව විරුද්ධ පක්ෂයට පැමිණි එකම මන්ත්‍රීවරයා ඞී. ඒ. රාජපක්ෂ මහත්මයා බව මා මේ අවස්ථාවේදී මතක් කළ යුතුව තිබෙනවා. රාජපක්ෂ මහත්මයාගේ ප්‍රතිපත්ති අනුව යම් ක්‍රියාවක යෙදීම අවශ්‍යය කියා ඒ මහත්මයා විශ්වාස කළා නම් ඒ ක්‍රියාව කරන්නට එතුමා කවදාවත් පසුබට නොවූ බව එදා ගත් ඒ පියවරෙන් ඔප්පු වෙනවා.

ඒ මහත්මයාගේ පවුලට අයත් වෙනත් අය මේ ගරු සභාවේම නොයෙක් තත්ත්වයන් දරූ බවත්, අදත් දරන බවත් අප මතක් කළහොත් වරදක් නැතැයි මා විශ්වාස කරනවා. මේ මැතිතුමා විශේෂයෙන්ම දකුණේ ගොවි ජනතාව වෙනුවෙන් යම් කිසි වෙහෙසක් උත්සාහයක් දැරුවද, යම් කිසි සේවයක් කළාද, ඒ උත්සාහයේ හා සේවයේ ඉදිරි කටයුතු කරගෙන යාම ඒ පවුල මගින්ම මේ ස්ථානයට පැමිණෙන මහත්වරුන්ට දැන් විශේෂයෙන්ම පැවරී භාර වී තිබෙන බවත් මා මතක් කරන අතර, එය එසේම ඉටු වනවාට මගේ කිසිම සැකයක් නැති බවත් මේ අවස්ථාවේදී සඳහන් කරන්න කැමතියි.

ඒ මැතිතුමා අප අතරින් වෙන් වීමෙන් අපට ඇති වුණ පාඩුව කොපමණද කියා අප දන්න නිසා එතුමාගේ පවුලට ඇති වුණ පාඩුව කොපමණද කියන එක අප විසින් අමුතුවෙන් විස්තර කර පෙන්වා දීමට වුවමනා නැහැ. එය ඉතාමත් පැහැදිලි වශයෙන්ම අපට පෙනී යන කාරණයක්. එතුමා නැති වීමෙන් අපටත්, ඒ පවුලටත්, රටටත් විශාල පාඩුවක් සිදු වුණ බව මතක් කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

**පී. ජී. බී. කෙනමන් මයා.** (මැද කොළඹ තුන්වන මන්ත්‍රී)

*(திரு. பீ. ஜீ. பி. கெனமன்—கொழும்பு மத்தி மூன்றாம் அங்கத்தவர்)*

(Mr. P. G. B. Keuneman—Third Colombo Central)

Mr. Speaker, on behalf of the members of my party in this House and on my own behalf, I should like to add a few words in support of the Motion that has been moved by the Hon. Leader of the House and seconded by the hon. Member for Medawachchiya (Mr. Maithripala Senanayake).

I had the privilege of knowing the late Mr. Rajapaksa both as a Colleague in this House for many years and as a well-known and prominent political personality in the Southern Province. In this House, Sir, he served with distinction, and rose to the position of Deputy Speaker. More than that, in the Southern Province

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[කෙනමන් මයා.]

he was closely associated with progressive movements, especially those designed to espouse the cause of the peasantry of that province. In that respect he followed in the footsteps of his distinguished brother and did so with great fidelity to the cause which his brother had espoused.

I agree with the tribute paid by the hon. Member for Agalawatta (Dr. Colvin R. de Silva) to the personal qualities of the late Mr. Rajapaksa. He was a modest and simple man, a man of genuine humility. That was the quality that immediately impressed itself upon all those who came into contact with him. Nevertheless, despite his simplicity and despite the fact that he quite rarely raised his voice in any regard, he remained very faithful to those political principles that he had espoused even at the cost of his personal advancement, and, in that respect, we all held him in high regard.

Now that he is no more with us, all we can do is to place on record our appreciation of the contribution which he made in furthering the interests of those who sent him to this House and those on whose behalf he, his brother, and other members of his family had worked.

I, therefore, associate myself with the tributes that have already been paid to our late Colleague and support the request made by the Leader of the House that a minute of these Proceedings be sent to the family of the late Mr. Rajapaksa, to whom we express our condolences.

**වෛද්‍යාචාර්ය ඊ. එම්. වී. නාගනාතන්** (නල්ලූර්)

*(டொக்டர் ஈ. எம். வி. நாகநாதன்—நல்லூர்)*

(Dr. E. M. V. Naganathan—Nallur)

Sir, on behalf of my party, I wish to associate myself with the tributes that have been paid and the sentiments expressed by leaders on both sides of the House.

The late Mr. Rajapaksa was well known to us as a kindly gentleman. I remember once asking him why he wore a saffron-coloured shawl always. He said, "This is not saffron-coloured. This is the colour of the ground, the soil. I represent the children of the soil, the agriculturists." And truly did he do so. He was modest, charming, and very sincere. That is the greatest tribute that we can pay him.

Sir, enough has been said, and nothing more need be added except that we express our sincere sympathies to the members of his family and his relations.

**කථානායකතුමා**

*(சபாநாயகர் அவர்கள்)*

(Mr. Speaker)

I wish to associate myself with the sentiments expressed by both sides of the House on the death of Mr. D. A. Rajapaksa. I shall request the Clerk of the House to make a minute of the Proceedings of today and send a copy thereof to the members of the bereaved family.

## නොපැමිණීමේ අවසරය: එම්. එච්. එම්. නයිනා මරික්කාර් මහතා

*வராதிருக்க அனுமதி: ஜனாப் எம். எச். எம். நயினா மரிக்கார்*

## LEAVE OF ABSENCE: MR. M. H. M. NAINA MARIKAR

**ගරු සී. පී. ද සිල්වා**

*(கௌரவ சி. பி. டி சில்வா)*

(The Hon. C. P. de Silva)

මෙම යෝජනාව මම ඉදිරිපත් කරනවා:

"1946 ලංකා (ආණ්ඩුක්‍රම) රාජ සභා ආඥාවේ 24 (1) (ඊ) ඡේදය යටතේ පුත්තලම මන්ත්‍රීවර එම්. එච්. එම්. නයිනා මරික්කාර් මහතාට 1967 නොවැම්බර් මස 20 වන දින සිට මාස 3ක් තුළ මන්ත්‍රී මණ්ඩලයේ රැස්වීම්වලට නොපැමිණීමට අවසර දිය යුතුය."

**ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.**

வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

*Question put, and agreed to.*

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

## විශ්වවිද්‍යාලවල පවතින නොසන්සුන් තත්ත්වය

*பல்கலைக் கழகங்களில் நிலவும் அமைதியின்மை*

## Prevailing Unrest at the Universities

**බර්නාඩ් සොයිසා මයා. (දකුණු කොළඹ)**
*(திரு. பெர்னுட் சொய்ஸா—கொழும்புத் தெற்கு)*
(Mr. Bernard Soysa—Colombo South)

I ask leave under Standing Order No. 18 to move the adjournment of the House to discuss a definite matter of urgent public importance, namely, the prevailing unrest at the universities, with special reference to the name and status problems of these universities.

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)

At a meeting of leaders of parties it was agreed that an opportunity be given to discuss this matter today. If the House agrees, without proceeding under Standing Order No. 18, the matter can be taken up at 4.30 P.M. in order to give both sides of the House an opportunity of discussing it. Otherwise, the discussion will have to start at 5.30 P.M. and it may be that Government will not have much time to reply.

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சீ. பீ. டி சில்வா)*
(The Hon. C. P. de Silva)

I agree.

**බර්නාඩ් සොයිසා මයා.**
*(திரு. பெர்னுட் சொய்ஸா)*
(Mr. Bernard Soysa)

I withdraw the application.

## කෙටුම්පත් පණත් පිළිගැන්වීම

*சமர்ப்பிக்கப்பட்ட மசோதாக்கள்*

## Bills Presented

### ලංකා ගුවන් සේවා (සංශෝධන) පනත් කෙටුම්පත

*இலங்கை வானூர்திச் சேவை (திருத்த) மசோதா*

### AIR CEYLON (AMENDMENT) BILL

" to amend the Air Ceylon Act."

පිළිගන්වන ලද්දේ ප්‍රවාහණ ඇමති වෙනුවට ගරු ඩී. පී. ආර්. ගුණවර්ධන විසිනි. 1967 නොවැම්බර් 21 වන අඟහරුවාදා දෙවන වර කියවිය යුතු යයි ද, එය මුද්‍රණය කළ යුතු යයි ද නියෝග කරන ලදී.

போக்குவரத்து அமைச்சர் சார்பாக, கௌரவ டீ. பீ. ஆர். குணவர்தன அவர்களால் சமர்ப்பிக்கப்பட்டது. 1967 நவம்பர் 21, செவ்வாய்க்கிழமை இரண்டாம் முறையாக மதிப்பிடப்பட வேண்டுமெனவும் அச்சிடப்பட வேண்டுமெனவும் ஆணையிடப்பட்டது.

*Presented by the Hon. D. P. R. Gunawardena, on behalf of the Minister of Communications; to be read a Second time upon Tuesday, 21st November 1967, and to be printed.*

### සාමාන්‍ය හා කාර්මික අධ්‍යාපනය පිළිබඳ පනත් කෙටුම්පත

*பொதுக் கல்வி, தொழில் நுட்பக்கல்வி மசோதா*

### GENERAL AND TECHNICAL EDUCATION BILL

"to make provision for General and Technical Education in Elementary, Lower and Upper Secondary and Technical Schools; to provide for the organization of different types of schools for such purposes; to provide for the establishment of the Ceylon Institute of Education; to establish a Unified Educational Service; to create a fund to be called the National Education Fund; and to make provision for matters connected therewith or incidental thereto."

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

පිළිගන්වන ලද්දේ අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු ඇමති ගරු අයි. එම්. ආර්. ඒ. ඊරියගොල්ල විසිනි. 1967 නොවැම්බර් 21 වන අඟහරුවාදා දෙවන වර කියවිය යුතුයයිද, එය මුද්‍රණය කළ යුතු යයිද නියෝග කරන ලදී.

கல்வி, கலாசார விவகார அமைச்சர் கௌரவ ஐ. எம். ஆர். ஏ. ஈரியகொல்ல அவர்களால் சமர்ப்பிக்கப் பட்டது.

1967 நவம்பர் 21, செவ்வாய்க்கிழமை இரண்டாம் முறையாக மதிப்பிடப்பட வேண்டுமெனவும் அச்சிடப்பட வேண்டுமெனவும் ஆணையிடப்பட்டது.

*Presented by the Hon. I. M. R. A. Iriyagolle, Minister of Education and Cultural Affairs ; to be read a Second time upon Tuesday,* 21st November 1967, *and to be printed.*

## ව්‍යාපාර ලියාපදිංචි කිරීමේ (අධිභාරයෙන් නිදහස් කිරීම) පනත් කෙටුම්පත

வியாபாரப் பதிவு (மேலதிகக் கட்டணத்திலிருந்து விலக்களித்தல்) மசோதா

BUSINESS REGISTRATION (EXEMPTION FROM SURCHARGE) BILL

"to make provision for the retrospective exemption of certain businesses from the levy and payment of the surcharge imposed by the Business Registration (Surcharge) Act, No. 16 of 1961, and for the refund of any amounts paid by way of such surcharge by such businesses."

පිළිගන්වන ලද්දේ මුදල් ඇමති වෙනුවට ගරු සී. පී. ද සිල්වා විසිනි. 1967 නොවැම්බර් 21 වන අඟහරුවාදා දෙවන වර කියවිය යුතුයයිද, එය මුද්‍රණය කළ යුතුයයිද නියෝග කරන ලදී.

நிதி அமைச்சர் சார்பாக கௌரவ சீ. பீ. டி சில்வா அவர்களால் சமர்ப்பிக்கப்பட்டது.

1967 நவம்பர் 21, செவ்வாய்க்கிழமை இரண்டாம் முறையாக மதிப்பிடப்பட வேண்டுமெனவும் அச்சிடப்பட வேண்டுமெனவும் ஆணையிடப்பட்டது.

*Presented by the Hon. C. P. de Silva, on behalf of the Minister of Finance ; to be read a Second time upon Tuesday, 21st November 1967, and to be printed.*

## ලංකා (පාර්ලිමේන්තු මැතිවරණ) රාජාඥව පිළිබඳ විශේෂ කාරක සභාව

இலங்கை (பாராளுமன்றத் தேர்தல்கள்) அரசவைக் கட்டளை மீதான தெரிகுழு

SELECT COMMITTEE ON CEYLON (PARLIAMENTARY ELECTIONS) ORDER IN COUNCIL

ගරු සී. පී. ද සිල්වා
*(கௌரவ சீ. பீ. டி சில்வா)*
(The Hon. C. P. de Silva)

I move,

"That the number of Members to be nominated to the Select Committee on Ceylon (Parliamentary Elections) Order in Council shall be fifteen."

A similar Motion was passed last year also and we appointed a Committee of 15 Members. We intend to appoint the same Members to the new Committee.

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.

வினா எடுத்தியம்பப்பெற்றது.

*Question proposed.*

අ. භා. 2.42

ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා
*(கலாநிதி கொல்வின் ஆர். டி சில்வா)*
(Dr. Colvin R. de Silva)

කථානායකතුමනි, මතු වී තිබෙන ප්‍රශ්නයට අදාළ වූ යම් කිසි කරුණු කීපයක් මේ අවස්ථාවේදී ඉදිරිපත් කළ යුතුය යන විශ්වාසයෙන්, අවශ්‍ය වුවහොත් තමුන්නාන්සේට ඉදිරිපත් කිරීමට අතුරු යෝජනාවකුත් පිළියෙළ කර තිබෙන බව මා මුලින් ම සඳහන් කරන්න කැමතියි. මා කරුණු විස්තර කර අවසාන වූ පසු එය අවශ්‍ය වුවහොත් ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වෙනවා.

මෙම ප්‍රශ්න ගැන සාකච්ඡා කර මෙම ගරු සභාවට උපදෙස් දීම සඳහා පත් කරන මෙම විශේෂ කාරක සභාවට කී දෙනකු පත් කළ යුතුද කියන ප්‍රශ්නය මීට අවුරුද්දකට ඉහත තීන්දු කළ ආකාරයටම තීන්දු කිරීම මදිය යන විශ්වාසය නිසයි මා මේ කරුණු ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

වන්නේ. ඒ කාලයේ සිට අද දක්වා සාමාන්‍ය ඡන්ද ක්‍රම ගැන පමණක් නොව විශෙෂයෙන් ඡන්ද පෙත්සම් ක්‍රම ගැන මේ රටටත්, අපටත්, මේ ගරු සභාවේ නොයෙක් මන්ත්‍රීවරුන්ටත්, උසාවිවලටත් යම්කිසි අලුත් වැදගත් සැලකිය යුතු අත් දැකීම් ලැබී තිබෙන බව රහසක් නොවෙයි. එසේ ලැබී තිබෙන අත්දැකීම් අනුව, විශෙෂයෙන් අපගේ පාර්ලිමේන්තු ඡන්ද ක්‍රම සඳහා නීතිය වශයෙන් තිබෙන්නාවූ ආඥාපනත ගැන, විශෙෂයෙන් පෙත්සම් ක්‍රමය ගැන එම ආඥාපනතේ සඳහන් වී තිබෙන කොටස් ක්‍රියාවේ යෙදෙන ක්‍රමය ගැන, විශාල—කලකිරීමක් කියන වචනය මා පාවිච්චි නොකර—සැකයක් හා බියක් ඇතිවී තිබෙන බව මා ප්‍රකාශ කළහොත් වරදක් නැතැයි කියා මා විශ්වාස කරනවා. ඒ ගැන කථා කිරීමට මා පටන් ගත යුතුව තිබෙන්නේ මේ කාරණයට මගේ පෞද්ගලික සම්බන්ධකමකුත් තිබෙන බව මතක් කරමිනුයි. එහෙත් එයට අදාළ නොවන විධියට—එයට නොගැවෙන විධියට—ඒ ගැන කිසිම හැඟීමක් නැති විධියට—කථා කරන්නට මා බලාපොරොත්තු වන බවත් මතක් කරන්නට කැමතියි. අගලවත්තේ අතුරු මැතිවරණයේදී අගලවත්ත ඡන්ද දායක කොට්ඨාශයේ මන්ත්‍රීවරයා වශයෙන් මා පත් වූවායින් පසුව මට විරුද්ධව ඡන්ද පෙත්සමක් ඉදිරිපත්කර තිබෙන බව මා මතක් කළ යුතුයි. එයින් මතුවන්නාවූ යම් කිසි ප්‍රශ්නයක් ගැන නොව මෙතෙක් කල් ඇති වී තිබෙන ඡන්ද පෙත්සම් විභාගවලින් මතුවූ පොදු ප්‍රශ්න ගැන මා කරුණු ඉදිරිපත් කරන්නට යන්නේ, ඒ ප්‍රශ්න ගැන විශේෂ දැනුමක් ඇති යම් යම් ගරු මන්ත්‍රීවරුන් මේ සභාවේ සිටින බැවින් ඒ මන්ත්‍රීවරුන් මේ විශේෂ කොමිටියට පත් කළ යුත්තේ ඒ නිසාම බව ඔප්පු කිරීමටයි. මා ඉදිරිපත් කරන්නට යන්නේ ඉතාම බරපතළ වැදගත් ප්‍රශ්න බව සඳහන් කරන අතර මා නැවතත් මතක් කරන්නට කැමතියි, මට විරුද්ධව ඉදිරිපත් කර තිබෙන පෙත්සම ගැන කිසිම හැඟීමක් ඇති කිරීමේ අදහසක්වත්, උත්සාහයක්වත් ඇතිව මා මේ කථාව නොකරන බව. එසේ කීම මගේ යුතුකමක්.

ගරු කථානායකතුමනි, ඡන්ද පෙත්සම් ක්‍රමය අප විසින් අපේ නීතියට ඇතුළත් කරගෙන තිබෙන්නේ එංගලන්තයේ නීතියෙන්. එංගලන්තයේ කෙරෙන හැම එකක්ම මේ රටෙත් කිරීම අපේ රටේ චාරිත්‍රයක් වී තිබෙන බව ඇත්තයි. එහෙත් එංගලන්තයේ ඒ ආයතනය—ඒ ක්‍රමය—ක්‍රියාත්මක වන්නේ කෙසේද? මේ රටේ ඒ ආයතනය—එම ක්‍රමය—ක්‍රියාත්මක නොවන බව දැන් නොයෙක් අංශවලින්, නොයෙක් අත්දැකීම්වලින් අප දැනගෙන තිබෙන කාරණාවක්. ඊට අප්‍රමාණ හේතූන් තිබෙනවා. මේ රට එංගලන්තය නොවෙයි. අප අතරේ සිටි යම් අය මේ රට එංගලන්තයේ පොඩි කෑල්ලක් බව ප්‍රකාශ කර තිබෙන නමුත් ලංකාවට වෙනම ඉතිහාසයක් තිබෙනවා; ලංකාවට අයිති චාරිත්‍ර සහ පුරුදු තිබෙනවා; ලංකාවට හුරු වන සමාජ ක්‍රමයක් හා ගතිගුණ තිබෙනවා. කොයි ආයතනයක්, කොයි නීති ක්‍රමයක් කොයි රටකින් ගෙනැවිත් මේ රටට දමා, මේ රටේ එය ක්‍රියාවේ යොදවන්නට උත්සාහ කළත් එය ක්‍රියාවේ යෙදීමේදී අනික් රටේ ක්‍රියාත්මක වූ ආකාරයට ක්‍රියාවේ නොයෙදෙන බවට අපට දැන් කරුණු පෙන්වන්නට පුළුවනි.

ඡන්ද පෙත්සම් ක්‍රමය ක්‍රියාවේ යෙදුණු හැටියට පොඩි කරුණක් මම මුලින් මතක් කරන්නම්, අන්තිමේදී මතු කරන්නට බලාපොරොත්තු වන ප්‍රශ්නය මුලින් සඳහන් කරමින්. ඡන්ද පෙත්සම් ක්‍රමය අපේ රටට වුවමනා ක්‍රමයක්ද යන ප්‍රශ්නය මතු කරන්නටයි, මා අද උත්සාහ කරන්නේ. මේ ඡන්ද පෙත්සම් ක්‍රමයෙන් සිදු වන හොඳට වඩා අප්‍රමාණව නොහොඳ සිදු වන බව අපට හොඳින්ම ඔප්පු කරන්නට පුළුවන්. තවද ඡන්ද පෙත්සම් ක්‍රමයෙන් ඉෂ්ට වන්නට තිබෙන්නාවූ කටයුතු සහ අරමුණු ඉටු කර ගැනීමට නීතියේ වෙනත් අංශ, වෙනත් මාර්ග දැනටම ඇති වී තිබෙන බව ඔප්පු කරන්නට අද මා බලාපොරොත්තු වෙනවා. කෙසේ වුණත් මේ රටේ මේ ඡන්ද පෙත්සම් ක්‍රමය ගැන අමුතු සෙවීමක් බැලීමක් ඇති වුණේ පසුගිය මහා මැතිවරණයට පසුව—මා අර පැත්තට හෝ මේ පැත්තට වගකීමක් නොපවරා කියනවා—ඡන්ද

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

පෙත්සම් 43ක්ම ඇමුණුනාට පසුවයි. ඡන්ද පෙත්සම් ඉදිරිපත් කිරීමෙන් අදහස් කරන්නේ මැතිවරණවලදී නීතිවිරෝධි අන්දමින් සිදුවුණු යම් යම් දූෂණ ක්‍රියා ඔප්පු කිරීමටයි. එහෙත් අද දවසේ මෙම ඡන්ද පෙත්සම් ක්‍රමය වෙනත් විධියක දේශපාලන ආයුධයක් වශයෙන් ශක්තිය සහ ආදායම තිබෙන්නාවූ පක්ෂවලට පාවිච්චි කරන්නට ඉඩකඩ ලැබී තිබෙන බව පෙනී යනවා.

ගරු කථානායකතුමනි, මෙම වචන ටික මම මේ ගරු සභාව ඉදිරියෙහි ප්‍රකාශ කළාට මෙහි සිටින කිසිම ගරු මන්ත්‍රීවරයකු මට වරදක් කියන්නේ නැතැයි මා විශ්වාස කරනවා. මෑත කාලවලදී මෙම ගරු සභාවට පැමිණෙන මන්ත්‍රීවරුන්ගේ සමාජ තත්ත්වයේ සහ මුදල් තත්ත්වයේ වෙනස්වීමක් නැතිනම් පරිවර්තනයක් එන්න එන්නම ඇති වුණු බව අප දන්නවා. එක්තරා කාලයක දේශපාලන කට යුතු භාරව තිබුණේ ධනවත් පොහොසත් උගතුන්ය කියන කොටසට පමණයි. එහෙත් ධනවත්කමත් උගත්කමත් දෙක එක නොවන බව මෑතදී සුප්‍රීම් උසාවියේදීම අපට මතක් කර දෙන ලද බව මෙහිලා තරමක් දුරට සිහිපත් කරන්නට මා කැමතියි. දෙවන කුමන්ත්‍රණ නඩුව නමින් යන්නාවූ නඩුව පිළිබඳව තමුන්නාන්සේට මතක ඇති. එහි විත්තිකරුවන් ඉල්ලන ලද සිංහල ජූරි සභාව වෙනුවට විශේෂ ජූරි සභාවක් පත් කරන ලෙස ඉල්ලීමේ ස්වරූපයෙන් ඉංග්‍රීසි ජූරි සභාවක් තේරීම ඉෂ්ට කර ගැනීම පිණිස ඇටෝර්නි ජනරාල්තුමා නැතිනම් නීතිපතිතුමා ඉල්ලීමක් ඉදිරිපත් කළ බව තමුන්නාන්සේට මතක ඇති. එම ඉල්ලීම ප්‍රතික්ෂේප කළ සුප්‍රීම් උසාවියේ අග්‍ර විනිශ්චයකාරතුමා, එහිදී ඇටෝර්නි ජනරාල්තුමා වෙනුවෙන් පෙනී සිටි ආණ්ඩුවේ අද්වකාත්තුමා විසින් ඉදිරිපත් කරන ලද තර්කයක් ගැන වචනයක් තමයි, මා දැන් මතක් කරන්නට හදන්නේ. මෙය මගේ කියමනක් නොවෙයි. ආණ්ඩුවේ අද්වකාත්තුමා කීවේ කරුණු විසඳීමට විශේෂ ජූරිවලින් විශේෂ ඇනුමක් ලබාගන්නවාය යන්නයි. අන්තිමේදී බැලූ විට එම තර්කයේ අර්ථය වූයේ කුමක් ද ? පොහොසත් වන ප්‍රමාණයට මොලේ දියුණුවට තිබේය යන්නයි. එහෙත් අග්‍ර විනිශ්චයකාරතුමා සිය නඩු තීන්දුවෙන් මතක් කළේ මොළයයි සාක්කුවයි දෙක තිබෙන්නේ එක තැන නොවේය යන්නයි. ඒ බව මා ඉතා සන්තෝෂයෙන් ප්‍රකාශ කරන අතර, සාක්කුවලට නානා ආකාරයට මුදල් වැටෙන බව අප මෙතැන නොයෙකුත් අවස්ථාවලදී සාකච්ඡා කර තිබෙන බවත් කියනවා.

මෙම ඡන්ද පෙත්සම් ක්‍රමය බෙහෙවින් වියදම් සහිත ක්‍රමයක් බව සඳහන් කළ යුතුයි. එහි පවතින එම ගතිගුණය වළක්වාලන්නට විධියක් නැති බවයි, අපට පෙනෙන්නේ. මෙය වියදම් සහිත වීමට හේතු කීපයක් තිබෙනවා. ඒවායින් එකක් දෙකක් පමණයි, මා සඳහන් කරන්නට කල්පනා කරන්නේ. මෙවැනි පෙත්සමක් මගින් ඉදිරිපත් කරන්නේ එක් චෝදනාවක් නොවෙයි; චෝදනා දෙකක් හෝ තුනක් හෝ නොවෙයි; චෝදනා විශාල ගණනක් ඉදිරිපත් කරනවා. එසේ ඉදිරිපත් කරනු ලබන චෝදනාවල යම්කිසි සීමාවක් තැබීමට නීතියේ කිසියම්ම ක්‍රමයක් ඇති කර නැහැ. එසේ හෙයින් අවසානයේදී මෙවැනි පෙත්සමක් අනුව ඇහෙන්නේ එක් නඩුවක් නොවෙයි. නඩු 50 ක් 60 ක් 70 ක් 100 ක් හෝ ඊට වැඩි ගණනක් වුණත් එක පෙත්සම් නඩුව තුළ විභාග කර වන්නට පුළුවනි. මේවා ගැන ටිකක් අප දැන ගත යුතුයි. මේ පත් කරන කොමිටියට මේ පිළිබඳ දැනුමක් ඇති උද විය පත් කළ යුතුයි. පෙත්සමක් ඉදිරිපත් කර ඇමුණුවායින් පසුව ඒ පෙත්සමේ ඇතුළත් එක එක චෝදනාව යටතේ තවත් චෝදනා කීයක් ඉදිරිපත් කරනවා ද යන්න තීන්දු කිරීම පෙත්සම්කරුට භාර වෙනව. පෙත්සම ඇසීමට මාසයකට—මාස එකහමාරකට විතර කලින් විස්තර සහිතව චෝදනා ඉදිරිපත් කරන්ට ඔහුට නියම කරනවා. මා දැනුවත්වයි කථා කරන්නෙ. ඒ විස්තර දෙන අවස්ථාවේදී අප්‍රමාණ පෙත්සම්වල චෝදනා හැට—හැත්තෑවක් ඉදිරිපත් කරනව. ඒවාට ඉංග්‍රීසියෙන් "instances" යයි කියනව. එක් එක් චෝදනාව යටතේ යම් යම් සිදුවීම් වෙන්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

කරමින් ඉදිරිපත් කිරීමක් වශයෙන් චෝදනා 60 ක්, 70 ක් ඉදිරිපත් කර අඟවන්නේ මේ හැට—හැත්තෑව ගැනම පෙත්සම්කරු, නඩුව ඇසෙන විට, නඩුවේ දී සාක්ෂි ඉදිරිපත් කරන්ට බලාපොරොත්තු වන බවයි. ඒ අනුව සාක්ෂිකරු ලැයිස්තු දමා තිබෙනවා; දමනවා. මේ පාර්ලිමේන්තුවට පත් වුණු යම්කිසි මන්ත්‍රීවරයෙකුට විරුද්ධව ඒ පෙත්සම ගෙනැවිත් තිබෙනව ද, ඒ උත්තරකරුට සිදු වෙනව, පෙත්සම්කරු විසින් ඉදිරිපත් කර තිබෙන ඒ විස්තර සහිත චෝදනා හැට—හැත්තෑව ගැනම උත්තර දීම සඳහා වැඩ කටයුතු කරන්න. සාක්ෂිකරුවන් සොයන්ට ඕනෑ; චෝදනා ගැන සොයන්ට ඕනෑ; ඒවා ගැන තමන්ගේ පැත්තට සාක්ෂි දෙන්ට සාක්ෂිකරුවන් සොයන්ට ඕනෑ. ඒ වගේම ඒ චෝදනා වල ඇත්ත—නැත්ත ගැන නොයෙක් විධියේ සෙවීම්, පරීක්ෂණයන් පවත්වන්ට ඕනෑ. ඒ සියලු දේටම වියදමක් දරන්ට සිදු වෙනව. ඒ සියලු වියදම් දරා සූදානම් වී පෙත්සම් විභාගය පවත්වන දවසට උත්තරකරු උසාවියට ඉදිරිපත් වීමෙන් පසුව, පෙත්සම්කරුට නැඟිටලා තම නීතිඥයා මඟින් කියන්ට සම්පූර්ණ අයිතිවාසිකම දී තිබෙනව, මම විස්තර සහිතව ඉදිරිපත් කර තිබෙන චෝදනා හැට—හැත්තෑවෙන් මම චෝදනා පණහක්—හැටක්ම අස් කර ගන්නවාය කියා. ඒ චෝදනා සම්බන්ධයෙන් සූදානම් වෙන්ට විත්තිකරුට හෙවත් උත්තර කරුට දරන්ට සිදු වූ වියදම ඒ ඉදිරිපත් කරන්ට බලාපොරොත්තුවක් නැති චෝදනා ඉදිරිපත් කළ පෙත්සම්කරු ගෙන් අය කර ගැනීමට ක්‍රමයක් අපේ නීතියේ හදලත් නැහැ; ඒකට ඉඩක් තිබෙනව නම් අද වන තුරු කිසියම් විනිශ්චයකරුවෙක් ඒ බලය පාවිච්චි කරලත් නැහැ. මේවා අපි කල්පනාවට ගන්ට ඕනෑ නේ ද? මේ කරුණු ගැන දන්නා තරමට මේවා කල්පනාවට ගන්ට පුළුවනි.

තව පැත්තක් ගනිමු. චෝදනා දහය, පහළොහ, විස්ස ඇතුළත් පෙත්සම් විනිශ්චයට භාජනය වූ බව මුළු රටම දන්නව. මේ එක එක චෝදනාව ගැන වෙන වෙනම නඩුවක් පවත්වන්නාක් මෙන් එක පෙත්සම් නඩුවේදී නඩු විස්සක්-තිහක් දෙපැත්ත කියනව. අන්තිමේදී එය ඇසූ විනිශ්චයකාරතුමා නඩු තීන්දුවක් දෙනව. එවැනි තීන්දු ඇති වුණු නිසයි, මම ඊළඟ වචනය කියන්නෙ. චෝදනා 20 ක් ඉදිරිපත් කර තිබුණාය කියමු. එයින් 19 කින්ම විත්තිකරු හෙවත් උත්තරකරු නිදහස් කරමින් එක චෝදනාවකට විතරක් ඔහු වරදකරු කරමින් තීන්දුව දෙන අතරේ නිදහස් වුණු නඩු 19 වෙනුවෙන් ඔහුට දරන්ට සිදුවුණු ගාස්තුවත් නොදී නඩු තීන්දු දී තිබෙනව. මෙහිදී—ඉංග්‍රීසියෙන් කියනවා නම්—" හිට් ඕ මිස් මෙතඩ් " එක අනුගම නය කරන්නට පෙත්සම්කරුට අයිතියක් දී තිබෙනවා. ගහන පහර වැදේදෝ නො වැදේදෝ යන සැකය ඇතුව ගහලා බල නවා. හරියට වැදුණොත් හොඳයි.

මේ සියල්ලම වියදම් වැඩි වන කරුණුයි. අප්‍රමාණ නීතිඥයිනුත් අධිනීතිඥයිනුත් මෙවැනි නඩු සඳහා තඹසල්ලියක්වත් අය නොකර පෙනී සිටි අවස්ථා තිබුණු නමුත් මෙවැනි පෙත්සම්වලින් කියන කරුණු හේතුකොට ගෙන විශාල වශයෙන් වියදම් දරන්නට මේවාට ඉදිරිපත් වන අයට සිදු වී තිබෙන බව මා මේ අවස්ථාවේදී කියන්නේ මේවා සම්බන්ධව දැනුමක් ඇතුවයි. එහෙත්, " මෙවැනි තත්ත්වයක් තිබීම යෝග්‍යයි, එය හරි, එවැනි තත්ත්වයක් වුවමනායි, මේවාට යන වියදම් එතරම් දෙයක් නො වෙයි " ආදී වශයෙන් කියන මන්ත්‍රීවරුන් මෙම ගරු සභාවෙහි සිටිනවා. ලංකාවෙහි ඇති වුණු දේශපාලන දියුණුව නිසා, ආදායම් නැති දුප්පත් පැලැන්තිවලට අයත් සාමාන්‍ය අයටත් මෙතැනට පැමිණෙන්නට ඉඩ ලැබීම ගැන අප ආඩම්බර විය යුතුයි. එවැනි කෙනකුට විරුද්ධව මේ අන්දමේ පෙත්සමක් ඉදිරිපත් වී එය විභාග වී අවසානයේදී ඔහු එයින් නිදහස් වුණත් මනුෂ්‍යයකු වශයෙන් ඔහු සමාජය තුළ වැටී සිටින ප්‍රපාතය කොයිතරම් ගැඹුරුද යන වග විස්තර කරන්නට මට ශක්තියක් තිබෙනවා, එවැනි පෙත්සම්වලට අසුවුණු මේ ගරු සභාවේ මන්ත්‍රීවරුන් ගැන මා හොඳහැටි දන්න නිසා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා]

තමන්ට විරුද්ධව පෙත්සමක් ඉදිරිපත් වුණු විට, අසුවල් අසුවල් කරුණු අනුව ඒ පෙත්සම බොරු බව ඔප්පු කරන්නට පුළුවන්කම තිබුණත් ඊට අවශ්‍ය වියදම් දරන්නට බැරි නිසා, මන්ත්‍රීවරයකු වශයෙන් ලැබුණු තත්ත්වයෙන් ඉවත් වුණොත් ඒ පෙත්සම නතර කර ගන්නට බැරිදැයි සමහර අය, නීතිඥයකු වශයෙන් මගෙන් ප්‍රශ්න කර තිබෙනවා. මේ සම්බන්ධව අපට තිබෙන්නේ පුදුමාකාර නීතියක්. ගරු කථානායකතුමනි, මේ ක්‍රමය ආරම්භ වුණේ දූෂණවල ගැවුණු මන්ත්‍රීවරුන් දූෂණවල නොගැවුණු මන්ත්‍රීවරුන් සමග එකට වාඩි වීම වැළැක්විය යුතුය යන මතය උඩ නම්, දූෂණයකට ගැවුණායයි චෝදනා ලබන මන්ත්‍රීවරයා ඔහුගේ ආසනයෙන් අස් වුණොත් ඒ ප්‍රශ්නය එතැනින් ඉවර විය යුතු නේද? එවැනි මන්ත්‍රීවරයකු, "අනේ මට නම් මේවා ගැන රණ්ඩු කරන්නට ශක්තියක් නැහැ, මම යන්නම්" කියා ඔහුගේ ආසනයෙන් අස් වන්නට ඉල්ලුවත් පෙත්සම නතර කරන්නට බැහැ. පෙත්සම ඉදිරියට ගෙන යන්නට ඕනෑ; ඔහු පෙත්සම් විභාගයට පෙනී සිටින්නට ඕනෑ; ඊට උත්තර දෙන්නට ඕනෑ; පෙත්සම කෙසේ හෝ දිනා ගන්නටත් ඕනෑ. එහෙම නැත්නම්, ඔහුට හත් අවුරුද්දකට පාර්ලිමේන්තුව පැත්තේ දේශපාලනය නම් සූන්. මේ සම්බන්ධව නිසි නීති රීති පිළියෙළ කළ යුතුය යන කරුණට පමණක් මා මේ ප්‍රශ්නය සීමා කරන්නට කැමැති නැහැ. මෙහි ඊට වඩා බැරෑරුම් ප්‍රශ්නයක් තිබෙනවා. එම නිසා මා මේ ප්‍රශ්නයට තවත් පැත්තකින් එනවා.

ලංකාවේ පළ වන "ටෛම්ස්" පත්‍රය විසින් රටට ඉදිරිපත් කරන ලද මතයක් මෙතැන මතු කරමින් ඒ මඟින් මා අරකී ප්‍රශ්නයට එන්නට යි අදහස් කරන්නේ. දේශපාලනය අතින් "ටෛම්ස්" පත්‍රය මොන පැත්තේද යන වග අපේ ගරු අගමැතිතුමාට පැහැදිලි නැතත් රටට නම් හොඳට පැහැදිලියි. යම් කිසි පත්‍රයක් විසින් තමාගේ පොඩි පළුද්දක් පෙන්නුවොත් එය විරුද්ධකාර පත්‍රයක් හැටියටයි අගමැතිතුමා විශ්වාස කරන්නේ. ඒ ගැන අප මේ අවස්ථාවේදී වාද කරන්නට වුවමනාවක් නැහැ. ආණ්ඩුව පැත්තට ලැබෙන්නට තිබුණු වාසියක් මේ පෙත්සම් ක්‍රමයෙන් අවාසියට පරිවර්තනය වී තිබෙන බව, ළඟදී ඇති වුණු අතුරු මන්ත්‍රී තරඟවලින් ආණ්ඩුවට වැදුණු පහරවල් ගැන කථා කරන "ටෛම්ස්" පත්‍රයට පෙනී ගොස් තිබෙනවා. අතන දිනනවා; අණබෙර ගහනවා; අලුතෙන් ඡන්දයක් පවත්වනවා. ඡන්දයේදී දෙපැත්තෙන්ම නොයෙකුත් කරුණු ඉදිරිපත් කරනවා; පහරට පහර ගහනවා. නමුත් තීන්දුව බැලුවාම අර පෙත්සම ගෙන ආ පැත්තට අවාසියි. එම නිසා "ටයිම්ස්" පත්‍රයෙ ලිපිවලින් හා කතෘ වාක්‍යවලින් මතු කරනවා, මෙයට ප්‍රතිකර්මයක් තිබෙනවාද කියන ප්‍රශ්නය. එමගින් යෝජනා කර ඇති අදහස කරුණා කර සිතට ගත යුතුයි. එතැනින් කියනවා, මෙන්න මේ ආකාරයේ නීතියක් තිබිය යුතුය කියා. මෙම කාරණා මා විශේෂයෙන් සඳහන් කරන්නේ ඒවා විශේෂ කාරක සභාවට වැදගත් වන ප්‍රශ්න නිසයි.

ගරු කථානායකතුමනි, ඉදිරිපත් කර ඇති මතය වැරදි මතයක් බවයි මා පෙන්වා දෙන්න යන්නේ. පැරදුණු තැනැත්තා පෙත්සම් විභාගයෙන් වැරදිකාරයා වී එම ආසනය අහිමි වුණොත් එසේ අහිමි වීම හේතුකොටගෙන වෙන කිසියම් තරඟ ක්‍රමයක් නොපවත්වා කලින් පැවති තරඟයෙන් පැරදුණු තැනැත්තා නැති නම් තරඟයේදී දෙවන තැන ලැබූ තැනැත්තා මෙතැනට පත් කළ යුතුයයි කියනවා. ඒ අනුව පෙත්සමකින් ජයග්‍රහණය කළාම අනික් ප්‍රතිඵලයත් නිකම්ම වාගේ එනවා. නමුත් මෙහිදී පිළිගැනේනේ කුමක් ද? මෙතැන ගැබ් වී තිබෙන අදහස කුමක් ද? ආසනය අහිමි වූ තැනැත්තා දූෂණ ක්‍රියා කළ කෙනෙක්ය, නමුත් පැරදුණු තැනැත්තා කිසිම පලුද්දක් නැති කෙනෙක්ය, යන අදහස නොවේ ද? එසේ වුණත් ඒ අන්දමට හිතන්නට කිසිම කාරියක් නැහැ. නීතියේ පැත්තෙන් බැලුවත්, අද පවතින ක්‍රමය අනුව පැරදුණු තැනැත්තාගේ කල්ක්‍රියාව ගැන විසඳීමක් එම පෙත්සම් නඩුවේදී සිදු වන්න කිසි ලෙසකින්වත්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ඉඩක් නැහැ. මේ රටේ අද පවතින ඡන්ද පෙත්සම් නීතිය එක් පැත්තකට බර වුණු, සම්පූර්ණයෙන්ම අසාධාරණයට, අයුක්තියට තුඩු දෙන ක්‍රමයක් බව කියන්න ඕනෑ.

කථානායකතුමා
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)

Will the hon. Member take very much longer ?

ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා
*(கலாநிதி கொல்வின் ஆர். டி சில்வா)*
(Dr. Colvin R. de Silva)

Yes, Sir. I am on a very important point.

කථානායකතුමා
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)

I did not want to interrupt you, but I noticed that the point you are making is that Members who are appointed to this Select Committee should be aware of all these matters.

ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා
*(கலாநிதி கொல்வின் ஆர். டி சில்வா)*
(Dr. Colvin R. de Silva)

Yes, Sir.

ගරු සී. පී. ද සිල්වා
*(கௌரவ சி. பீ. டி சில்வா)*
(The Hon. C. P. de Silva)

The Opposition has sent in their names already.

කථානායකතුමා
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)

Will the hon. Member try to be as short as possible ?

ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා
*(கலாநிதி கொல்வின் ஆர். டி சில்வா)*
(Dr. Colvin R. de Silva)

I will.

මා කියන්නට අදහස් කළේ මෙයයි. ඇත්ත වශයෙන් මේ කාරණය කොමිටියත්, මේ ගරු සභාවත්, රටත්, දැනගත යුතු කාරණයක්. අපේ රටේ නීතියෙ හැටියට පැරදුණු කෙනෙකුට විරුද්ධව ඡන්ද පෙත්සමක් ගෙන ඒමට කිසිම ක්‍රමයක් නැහැ. එපමණක් නොවෙයි, පැරදුණු අපේක්ෂකයාගේ කල්ක්‍රියාව ගැන, ජය ග්‍රහණය කළ තැනැත්තාට විරුද්ධව ගෙන ආ පෙත්සම් විභාගයේදී විනිශ්චය කිරීමට නීතියෙන් ඉඩක් නැහැ.

කථානායකතුමා
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)

Is not there provision for that if a man claims a seat ?

ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා
*(கலாநிதி கொல்வின் ஆர். டி சில்வா)*
(Dr. Colvin R. de Silva)

එකම පටු අවස්ථාවකදී පමණයි. යම්කිසිවෙක් පෙත්සමක් ඉදිරිපත් කරමින්, පැරදුණු පුද්ගලයා පත් විය යුතුව තිබුණාය කියනවා නම්, ඒ අවස්ථාවේදී එංගලන්තයේ බලපාන නීතියේ හැටියට නම් ඔහුට හරස්ව පෙත්සමක් ගෙන ඒමට අවස්ථාව තිබෙනවා. ඒ අයිතිය, අපේ නීතියේ හැටියට තිබෙනවාද කියා සැක සහිතයි. එබඳු අයිතියක් ගැන මා හිතන හැටියට, අපේ නීතියේ සඳහන් වී නැහැ.

If I may say that in English : the constitutional procedure in that narrow case is not mentioned in Ceylon and it is, at the least, not certain that it is.

ගරු කථානායකතුමනි, මේ අනුව පුදුම විධියේ තත්ත්වයක් තිබෙන්නේ. පෙත්සම ඉදිරිපත් කළ පුද්ගලයාට විරුද්ධව, අද පවතින නීතියේ හැටියට, නොයෙකුත් චෝදනා ගෙන ආ හැකියි. ඔහුට විරුද්ධව චෝදනා ගෙනෙන්නෙත් එයින් වාසියක් ගන්නට බලාපොරොත්තු වන අය නොවෙයි. එවැනි අවස්ථාවක් ඇති වුණොත් ඒ බොහොම කලාතුරකින් පමණයි.

දේශපාලන අතින් කොපමණ විරුද්ධ වුණත් එක කරුණක් පිළිබඳව දෙමළ රාජ්‍ය පක්ෂයේ නායක එස්. ජේ. වී.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා]

වෙල්වනායගම් කන්කසන්තුරේ මන්ත්‍රීතුමාට මා ගරු කරනවා. ඔහු ඡන්දයෙන් පැරදුණු අවස්ථාවකදී ඡන්දයෙන් ජය ගත් තැනැත්තාට විරුද්ධව ඡන්ද පෙත්සමක් ඔහුගේ නමින්ම ඉදිරිපත් කර ඉන් පැරදී රුපියල් 40,000 ක ගාස්තුව කටත් යටවන තැනට ඔහු පත් වුණා. එතුමා තමන්ගේ වැඩේ තමන්ම කිරීමට වගකීමක් ඇතිව ඉදිරිපත්වීම ගැන මා ගරු කරනවා. එහෙත් වැඩි වශයෙන් සිදු වන්නේ කුමක්ද? පිටුපසින් සිටගෙන රූකඩ නැටවීමයි. කවුරු හෝ තුට්ටු දෙකක් නොවටින ඡන්දදායකයකු ලවා පෙත්සම ඉදිරිපත් කරවනවා. ඒ සඳහා බැඳිය යුතු ගාස්තුව පමණක් ඔහුට දෙනවා. නඩුව ඉවර වන විට ඒ බඳින මුදල වියදම් වූ මුදලින් දහයෙන් පංගුවක්වත් වන්නේ නැහැ. පෙත්සම ඉදිරිපත් කරවන්නේ කිසිවක් නැති කෙනකු ලවා නිසා ඒවා නැවත අයකර ගන්නත් බැහැ. පෙත්සම ඉදිරිපත් කරන්නේ කොහුම්ට. ඒ නිසා හරස්ව පෙත්සම් ගෙන ඒමට නීතියෙන් බලයක් ඇති කිරීමෙන් පමණක් මා කියන කරුණුවලින් ඇති වන අසාධාරණය නැත්නම් අපරාධය නැති වී යන්නේ නැහැ.

ඡන්ද පෙත්සමකින් කියන්නේ කුමක්ද? ඡන්ද පෙත්සමකින් දෙවිධියකට චෝදනා කොටස් දෙකක් ඉදිරිපත් කරන්නට පුළුවන්. එක කොටසක් නම් පත් වූ මන්ත්‍රීවරයාගෙන් යම් යම් වැරදි සිදුවුණාය කියන එකයි. කාගේ වැරදිවලට කෙසේ වගකිවයුත්තකු වෙනවාද කියා තව ටිකකින් විශේෂ වචනයක් කියන්නට මා අදහස් කරනවා. එය අපේ රටට බොහෝම වැදගත් ප්‍රශ්නයක්. එය පැත්තකින් තබමු. ඡන්ද පෙත්සමකින් එක කොටසක් ඉදිරිපත් කරන චෝදනා මේවායි: චින්තිකරු විසින් හෝ ඔහුගේ ඒජන්ත කෙනකු විසින් හෝ මේ මේ අපරාධ සිදු කර තිබෙනවාය, ඒ හේතුව නිසා මෙම ඡන්ද ප්‍රතිඵල ප්‍රතික්ෂේප කොට අලුත් ඡන්දයක් පැවැත්විය යුතුයි නැත්නම් වෙන කෙනකු පත් කළ යුතුයි කියන එකයි ඉදිරිපත් කරන එක චෝදනාවක්. තවත් කොටසක් තිබෙනවා. ඒ කොටසට අපේ පාර්ලිමේන්තු මැතිවරණ නීතියෙන් සම්පූර්ණයෙන්ම නීති අවකාශ හා මාර්ගය යම් යම් ආරක්ෂාවනුත් ඇතිව ඇති කර තිබෙනවා. ගරු කථානායකතුමනි, අද අප පැමිණ සිටින තත්ත්වය කුමක්ද? අද ඡන්දයකින් දිනන තැනැත්තාට විරුද්ධව අනික් පැත්තෙන් ඡන්ද පෙත්සමක් ඉදිරිපත් නොකළොත් ඔහු වාසනාවන්තයෙක්. පෙත්සමේ සඳහන් කරුණු ඇත්තද නැත්තද කියන එක නොවෙයි ප්‍රශ්නය. පෙත්සම ගෙනෙන්නේ කරදර කිරීම පිණිසයි. එය විනිශ්චයකාරවරුන් තම විනිශ්චයවලදී සඳහන් කර තිබෙන කරුණක්. ඒ අනුව අප කරුණු දෙකක් ගැන කල්පනා කරන්නට ඕනෑ. එකක් මැතිවරණවලදී නීතියෙන් තහනම් කර ඇති වැරදි සිදුකිරීම නැවැත්වීම පිණිස දඬුවම් ක්‍රමයක් තිබීමයි. අනික නොකෙරුණු වැරදි සඳහන් කර කරදර කිරීමේ ක්‍රමය වැළැක්වීමයි. මේ දෙකොටසම අද නීතියේ තිබෙනවා. අද තිබෙන මැතිවරණ නීතිය අනුව ඡන්දයකින් පත්වූ කෙනෙකු හෝ ඡන්දයකට සහභාගි වූ කෙනකු හෝ ඡන්දයකින් පරාජයවූ කෙනකු හෝ තරග කරුවකු නොවන කෙනකු හෝ ආදී වශයෙන් කොයියම්ම කෙනකු විසින් හෝ ඡන්ද නීතියක් කඩකර අපරාධයක් කර තිබෙනවාය කියා ඇටෝර්නි ජනරාල් තුමාගේ අවසරය ඇතිව ඒ අපරාධය ගැන චෝදනාවක් අපේ සාමාන්‍ය උසාවිවල ඉදිරිපත් කිරීමට බලය තබා තිබෙනවා.

මේ දවස්වල නම් ඇටර්නි ජනරාල් තුමාලා ගැන වැඩිය කථා කිරීම යෝග්‍ය යයි නොසිතුවත් නීතියේ ඒ කොන්දේසිය සඳහන් කර තිබෙන්නේ හොඳක් සඳහා බව මා මතක් කරන්නට කැමතියි. ඡන්දයෙන් තේරී පත්වුණු කෙනකුට හෝ ඕනෑම කෙනකුට හෝ විරුද්ධව අපරාධයක් කිරීමේ චෝදනාව පිට නඩුවක් පැමිණිලි කරන්නට බලාපොරොත්තුවක් තිබෙනවා නම් ඒ සම්බන්ධයෙන් තමන්ට ඉදිරිපත් කරන්නට පුළුවන් සාක්ෂි මොනවාද ඒවා කොයි ආකාරයේ ඒවාදැයි ඇටර්නි ජනරාල්තුමාට ඉදිරිපත් කළයුතු අතර එතැනින් අවසරයක් ලැබුණොත් පමණක් ඒ නඩුව පැමිණිලි කරන්නට ඉඩ දෙන කොන්දේසියක් ඇතුළත් කර තිබෙන්නේ බොරු නඩු, සොච්චං නඩු, කරදර කිරීම සඳහා පමණක් ඉදිරිපත් කරන නඩු යන මේවාට ඉඩ නොතැබීමටයි. ඒ නිසා කිසියම් පුද්ගලයකු වැරදි කර

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

තිබෙනවා නම්, මේ කරන්නා වූ අපරාධකාරී ක්‍රියාවලට ඉඩ නොදී පෙත්සම් මාර්ගයෙන් සාධාරණය ඉෂ්ට කර ගන්නට පුළුවනි. අවසර ඇතිව නඩුවක් පැමිණිලි කළ විට ඒ පිළිබඳව වගකීමක් තිබෙනවා. ඒ නඩු දහයක් දොළහක් එක පාරටම අසන්නේ නැහැ. ඇටර්නි ජනරාල්තුමා එක හොඳ නඩුවක් තෝරා විභාග කිරීම සඳහා එය ඉදිරිපත් කරනවා. ඒ නඩුවෙන් ගැලවෙන්නට බැරි වුණොත් වැරදිකාරයා වූ තැනැත්තාට අපේ රටේ නීතිය අනුව අවුරුදු හතක් යන තුරු දේශපාලන අයිතිවාසිකම් අහිමි වෙනවා. එතකොට පෙත්සම් ක්‍රමයෙන් ඉෂ්ට කර ගන්නට පුළුවන් කාරණය පිළිබඳව තවත් පැත්තක් තිබෙනවා නේදැයි කෙනකුට කියන්නට ඉඩ තිබෙනවා. අර අසුවල් හෝ විස්තර කරන්නට පුළුවන්, පෙන්වන්නට පුළුවන්, තෝරා පත් කරන්නට පුළුවන් හෝ පුද්ගලයකුගෙන් සිදු වුණු වැරදි නොව, පළල් ලෙස ඡන්දයේදී පැවතුණු තත්ත්වය හේතුකොටගෙන සාධාරණ ඡන්ද විමසීමක් සිදු වුණේ නැතැයි කියමින් කෙනකුට පෙත්සමක් ඉදිරිපත් කරන්නට පුළුවනි.

සුප්‍රිම් උසාවියට අද “ රිට් ” ක්‍රමයෙන් එවැනි නඩු අසන්නට අයිතිවාසිකම තිබෙනවා. එහෙත් එහි මදිකමක්, දුර්වලකමක්, ඉඩක් නැතිකමක් තිබෙනවා නම් ඒවා මගහැරවීම පිණිස නීතිය සංශෝධනය කිරීමට අපට කිසිම අමාරුවක් නැහැ. ඒ නිසා මේ විධියට බැලුවාම මේ ඡන්ද පෙත්සම් ක්‍රමය මේ රටට කිසි සේත්ම වුවමනා නැති ක්‍රමයක් බව මම මෙම ගරු සභාවේදී ප්‍රසිද්ධියේ ප්‍රකාශ කරනවා. උසාවියේ ඇති දේවල් ගැන කථා නොකරමිනුයි, මා මේ කියන්නේ. මේ නීතියේ තව එක ප්‍රධාන පැත්තක් තිබෙනවා. විශේෂ දැනුමක් තිබිය යුතු අය සිටිය යුතු පැත්තක් ගැන මා මතක් කරන්නට කැමතියි. අපේ රටේ ඡන්ද නීතියට ඇතුළත් කර තිබෙන්නා වූ පෙත්සම්වලදී එංගලන්තයේ දියුණු කළ අදහසක්ද භාවිතයට ගෙන තිබෙනවා. සෑම ඡන්දාපේක්ෂකයාම ඡන්ද ඒජන්ත නමින් කෙනකු පත් කරන්නට ඕනෑ. මා කියන්නේ ඒ ගැන නොවෙයි. එංගලන්තයේ සාදා ඇතැයි කියා මෙහි ගෙනවුත් පාවිච්චි කරන අපේ නීතියේ ඒ කාරණය ඊට වඩා පළල් විධියට තිබෙනවා. ඒ මොකක්ද? යම් කෙනකු ඡන්දාපේක්ෂකයාගේ අනුදැනුම ඇතිව ඔහුගේ පැත්ත ගත්තා නම්, ඒ පැත්ත ගත්තා වූ ඒ ඇත්තා යම්කිසි ඡන්ද නීතියක් කඩ කළහොත්, ඒ ඡන්ද නීතිය කැඩීම ඡන්දාපේක්ෂකයා විසින් තහනම් කරනු ලැබ ඇති බව ඔප්පු වුණත්, එමෙන්ම ඔහු ඒජන්ත කෙනකු වශයෙන් පත් කරනු නොලැබුවත්, පිළිගනු නොලැබුවත් ඔහු ඡන්ද ඒජන්ත කෙනකු හැටියට අපේ රටේ පිළිගන්නවා. 19 වැනි ශත වර්ෂයේ එංගලන්තයේ බොහොම පටු ඡන්දදායක කොට්ඨාශ—එක කොට්ඨාශයක ඡන්දදායකයන් හත් අට සියක් නැත්නම් දහක් දෙදහක් වශයෙන් පොඩි ඡන්දදායක කොට්ඨාශ—තිබුණු කාලයේ හැදූ නීතියක්, මේ. එවැනි සුළු ඡන්දදායක පිරිස් සිටින ප්‍රදේශවල අපේක්ෂකයන් තමන්ට වැඩ කරන සියලු දෙනා සම්බන්ධයෙන්ම පෞද්ගලිකව වගකිව යුතු යැයි ප්‍රතිපත්තියක් වශයෙන් පිළිගත්තා නම්, එසේ පිළිගැනීමේ සාධාරණකමක් තිබෙනවා.

එහෙත් අද අපේ රටේ තත්ත්වය කොහොමද? මා පසුගිය මහා මැතිවරණයේදී, කම්කරු, රැකීරක්ෂා හා නිවාස ඇමතිගේ වර්තමාන පාර්ලිමේන්තු ලේකම්තුමා සමඟ දෙහිවල-ගල්කිස්ස ආසනයට තරඟ කළ අවස්ථාවේදී, මගේ මතකයේ හැටියට එම කොට්ඨාශයේ ඡන්දදායකයන් 63,000 ක් පමණ හිටියා. කථානායකතුමනි, එක ඡන්දදායක කොට්ඨාශයක් තුළ ඒ තරම් විශාල ඡන්දදායක පිරිසක් සිටි බව මතක තබා ගන්න. එක ඡන්දදායක කොට්ඨාශයක සිටිය යුත්තේ වැසියන් 75,000 ක් පමණය කියායි දළ වශයෙන් අපේ නීතියේ සඳහන් වන්නේ. ඒ ගණන පුරවැසියන් නොවෙයි, වැසියන්. වැසියන් 75,000 කින් යුක්ත විය යුතු ඡන්දදායක කොට්ඨාශයක ඡන්දදායකයන් 63,000 ක් ඉන්නවා නම්, ඒ ප්‍රදේශයේ වැසියන් ලක්ෂ $1\frac{1}{2}$ ක් 2 ක් ඉන්නා බව තමුන්නාන්සේලාට ඔප්පු වෙයි. එවැනි ඡන්දදායක කොට්ඨාශයක—මා කථා කරන්නේ දෙපැත්තේම අපේක්ෂකයන් වෙනුවෙන් — නොයෙකුත් අහු මූලුවල, පැතිවල, අංශවල ඉන්නා අය තම අපේක්ෂකයා කෙරෙහි ලොකු

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා]

ලැදිකමක් ඇතිව විශාල උත්සාහයක් දරා මැතිවරණ කටයුතු කරනවා ඇතැයි අප බලාපොරොත්තු වෙනවා. එසේ සිදු වන බවත් අප දන්නවා.

අගලවත්තේත් මැතිවරණයක් කළා. මා අගලවත්තේ අතුරු මැතිවරණය ගැන කථා කරනවා නොවෙයි. ඒ සම්බන්ධයෙන් ඡන්ද පෙත්සමකුත් තිබෙනවා. ඒ පෙත්සමේ තිබෙන ඒවා ගැන මා මතක් කරන්නේ නැහැ.

කථානායකතුමා
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)

Those are all matters for the Select Committee. This Motion is only to enable the nomination of fifteen Members to the Select Committee.

ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා
*(கலாநிதி கொல்வின் ஆர். டி சில்வா)*
(Dr. Colvin R. de Silva)

Yes, Sir. But there is one point I want to make. You will see what I am coming to, on the law of agency, in a moment. It is too complicated and subtle a thing not to be mentioned.

කථානායකතුමා
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)

The law of agency is a matter that will be decided upon by the Select Committee. All these matters will be relevant only when the report of the Select Committee is before the House.

ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා
*(கலாநிதி கொல்வின் ஆர். டி சில்வா)*
(Dr. Colvin R. de Silva)

Respectfully, Sir, it is a matter demanding such skilled analysis and understanding,——

කථානායකතුමා
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)

We shall have the hon. Member on the Committee to lead them.

ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා
*(கலாநிதி கொல்வின் ஆர். டி சில்வா)*
(Dr. Colvin R. de Silva)

No. Sir. So long as I have a petition against me, I do not think I should be on a Select Committee concerning this issue.

කථානායකතුමා
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)

The hon. Member can give evidence before the Select Committee.

ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා
*(கலாநிதி கொல்வின் ஆர். டி சில்வா)*
(Dr. Colvin R. de Silva)

Sir, I shall have to await the outcome of that petition.

කථානායකතුමා
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)

I do not think——

ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා
*(கலாநிதி கொல்வின் ஆர். டி சில்வா)*
(Dr. Colvin R. de Silva)

If I am fortunate enough to have a favourable result in that petition, it may be time enough for me to ask you, Sir, in the proper place, whether it is possible for the Committee, if it chooses to do so, to co-opt me on to it.

කථානායකතුමා
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)

Why is the hon. Member so pessimistic ?

ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා
*(கலாநிதி கொல்வின் ஆர். டி சில்வா)*
(Dr. Colvin R. de Silva)

I, Sir, as a lawyer, recognize that the law is a gamble. As one having direct experience of so many petitions, and knowing that the courts operate not with truth but with credibility, and that the biggest of liars can have the best of addresses in court, you will forgive me if I do not anticipate the outcome of a petition.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

But, in any case, the hon. Member can give evidence before the Select Committee.

ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා
(கலாநிதி கொல்வின் ஆர். டி சில்வா)
(Dr. Colvin R. de Silva)

I would not like to, so long as there is a petition. You will appreciate that.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

The point is that, although what the hon. Member is now dealing with is no doubt interesting, there will not be an end to this question because these are matters that he can discuss once the report is before the House. The Motion before the House is for the purpose of nominating fifteen Members to the Select Committee.

ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා
(கலாநிதி கொல்வின் ஆர். டி சில்வா)
(Dr. Colvin R. de Silva)

The proposal of the Hon. Leader of the House, you will please remember, respectfully, was that we should re-appoint the fifteen Members who were appointed last year.

ගරු සී. පී. ද සිල්වා
(கௌரவ சீ. பீ. டி சில்வா)
(The Hon. C. P. de Silva)

I did not say so. The parties have decided to do so.

ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා
(கலாநிதி கொல்வின் ஆர். டி சில்வா)
(Dr. Colvin R. de Silva)

I may have misunderstood either his Sinhalese or his pronunciation, whichever it is.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

I think the power to nominate is given to the Speaker, and as such I shall consider all the points that have been raised when I make the nomination.

ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා
(கலாநிதி கொல்வின் ஆர். டி சில்வா)
(Dr. Colvin R. de Silva)

May I please be permitted to place some of those points before you ?

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

I thought the hon. Member had done so successfully.

ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා
(கலாநிதி கொல்வின் ஆர். டி சில்வா)
(Dr. Colvin R. de Silva)

I have a couple of more matters to touch on. I appreciate your anxiety that I should not take long. But the matter is far too serious to let it pass.

I hope this Select Committee will ensure that we shall never witness again the harassment and the oppression of humble, everyday, perfectly honest men by utterly dishonest petitions which have been brought in the courts. I am not talking about myself. I am ready to point them out. And some of them, if not for the skill of their appeal lawyers, would be out of this House today, and never, never, if you will pardon my indignation, will I be able to reconcile myself to a system of legal procedure that results in that kind of oppression to hon. Members of this House of the humble variety.

The rich can defend themselves, Sir. The rich have resources. The rich can get the most skilled lawyers in the country. The rich can get at witnesses. The rich have clubs in which to talk. The poor, they have only their little humble homes from which they come here, and if they by any chance make some little mistake in their conduct in that modern great hotel called "Sravasti," somebody, through the newspapers, will be denouncing them as men unfit to be here.


Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)

They also have got skilled advocates, especially in the appeal court.

**ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා**
අපේ රටේ කොයි දේ කරන්නට ගියත් පන්ති භේදයක් තිබෙනව. විශ්ව විද්‍යාලයේ උපාධි අපේක්ෂකයන් තුළ භයක් තිබෙන්නෙ ඒකයි. "ශ්‍රී ලංකා විශ්ව විද්‍යාලය—පේරාදෙනිය" හෝ වෙනත් නමක් හෝ තිබුණට කමක් නැහැ. එහෙත් පේරාදෙනියේ විශ්ව විද්‍යාලය මගින් නිකුත් කරනු ලබන සහතික පත්‍ර වලට නැත්නම් ඒ උපාධිවලට විශේෂ සැලකිල්ලක්, වැඩි සැලකිල්ලක්, දක්වන තත්ත්වයක් ඇති වන විට අනික් විශ්ව විද්‍යාලවල උපාධි දෙවෙනි තුන්වෙනි පන්තියේ උපාධි බවට පත් වෙනව. දැනට මත් ඒ තත්ත්වය උද්ගත වී තිබෙනව. දැනටත් පේරාදෙනියේ උපාධියකට දක්වන සැලකිල්ල විද්‍යාලංකාර—විද්‍යෝදය විශ්ව විද්‍යාලවල උපාධිවලට දක්වන්නේ නැති බව අපට සාක්ෂිවලින් ඔප්පු කරන්ට පුළුවන්කම තිබෙනව. ඒ වගේම ශ්‍රී ලංකා විශ්ව විද්‍යාලය ජාත්‍යන්තර වශයෙන් පිළිගත් විශ්ව විද්‍යාලයක්. ජාත්‍යන්තර වශයෙන් පිළිගැනෙන විශ්ව විද්‍යාලයක උපාධිධාරීන් අනික් රටවල විශ්ව විද්‍යාල මගිනුත් පිළිගන්නව. ඔවුන් උගතුන් හැටියට, උපාධිධාරීන් හැටියට, අනික් රටවල විශ්ව විද්‍යාලත් පිළිගන්නව. එහෙත් අනික් විශ්ව විද්‍යාල තුනේ උපාධිධාරීන් ජාත්‍යන්තර වශයෙන් අනික් රටවල පිළිගන්නෙ නැහැ. ඇයි ? පිළිගත් විශ්ව විද්‍යාලය පේරාදෙනිය පමණක් නිසයි. මේ නිසා "අපි ලබා ගන්න උපාධිවලින් ප්‍රයෝජනයක් නැහැ" කියන භයක් ශිෂ්‍යයන් තුළ ඇති වෙනව. ඒවා දෙවෙනි තුන්වෙනි පන්තියේ උපාධිය කියන මතයට ඔවුන් වැටෙනව. විශ්ව විද්‍යාල සියල්ලටම ශිෂ්‍යයන් තෝරා ගනු ලබන්නේ රජය මගින් පවත්වන එකම විභාගයකින් බව, එකම ලකුණු ක්‍රමයක් අනුව බව, අපි හොඳටම දන්නව. එසේ නම් එක් එක් විශ්ව විද්‍යාලයේ උපාධිවලට වෙනස් අන්දමේ සැලකිල්ලක් දැක්වීම අසාධාරණයි. එයින් සිදු වෙන්නෙ නොතිබුණු පන්තියක් අලුතෙන් ඇති වීමයි. එසේ නොයෙක් පන්ති තිබෙනව. ඒවා මදිවාට තවත් පන්තියක්, තවත් රදල කුලයක්, තවත් බමුණු කුලයක් හදන්ටයි, මේ විශ්ව විද්‍යාල හතර හතර විධියකට පැවැත්වීමට යමෙකු අදහස් කරනවා නම්—මා කාටවත් චෝදනා කරන්නෙ නැහැ, එහෙම අදහස් කරනවා කියා ; යමෙකු එහෙම අදහස් කරනවා නම්—ඔහු අදහස් කරන්නෙ.

ඒ නිසා ශ්‍රී ලංකා විශ්ව විද්‍යාලය යනුවෙන් එකම විශ්ව විද්‍යාලයක් පිහිටුවන ලෙස අපි විශේෂයෙන් ඉල්ලා සිටිනව. අධ්‍යාපන ඇමති වශයෙන් කලුගල්ල මහත්මයා සිටිද්දී අධ්‍යාපන කමිටුවේ සාමාජිකයකු හැටියට මම මේ යෝජනාව කළ බව මට මතකයි. දකුණු කොළඹ ගරු මන්ත්‍රීතුමා (බර්නාඩ් සොයිසා මයා.) කිව්ව වගේ, එකම විශ්ව විද්‍යාලයක් තබාගෙන එහි ශාඛා වශයෙන් හෝ විශ්ව විද්‍යාල භූමි වශයෙන් එය ඕනෑ තරමක් පළල් කරන්ට ඉඩකඩ ඇති කළ යුතුයි කියා අපිත් ඒ කාලයේ යෝජනා කළා. එහෙත්, අවස්ථාවක් නොතිබුණු නිසා එය ක්‍රියාත්මක වුණේ නැහැ. මේ අවස්ථාවේදී අප ගරු අධ්‍යාපන ඇමතිතුමාගෙන් ඉල්ලා සිටින්නේ, මේ විශ්ව විද්‍යාල හතරම එකම තත්ත්වයේ උපාධි ලබා දෙන විද්‍යා පීඨයන් බවට පත් කරන ලෙසයි. එසේ නොකළොත් උපාධිධාරීන් අතර පන්ති භේදයක් ඇති වීමෙන් රටේ මෙතෙක් නොතිබුණු අලුත් පන්තියක්—අලුත් බමුණු කුලයක්—අනාගතයේදී බිහි වෙනවා. එම නිසා, ගරු අධ්‍යාපන ඇමතිතුමා මෙතෙක් නොතිබුණු පන්ති භේදයක් ඇති කිරීමේ පාපය අත් කර නොගෙන පන්ති භේදය නැති කිරීමේ ප්‍රශංසාව ලබා ගැනීමට උත්සාහ කරන ලෙස එතුමාගෙන් ඉල්ලා සිටිනවා.

මා හිතන හැටියට, විශ්ව විද්‍යාලයවල වැඩ වර්ජනයට ඉතා කිට්ටුම හේතුව වී තිබෙන්නේ මෙයයි. විද්‍යාලංකාර විශ්ව විද්‍යාලයේ උපාධි අපේක්ෂකයින් ඊට වඩා වැදගත් කරුණු කීපයක් ඉදිරිපත් කර තිබෙනවා. යම් විශ්ව විද්‍යාලයක වැරදි තිබෙනවා නම්, දූෂණ තිබෙනවා නම්, මුදල් නාස්ති සිදු වෙනවා නම්, අල්ලස් දූෂණ ඇති වෙනවා නම් ඒවා කොයි කාලයේ කවුරුන් විසින් කළත්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ඒවා අනුමත කරන්නට අප සූදානම් නැහැ. විද්‍යාලංකාර විශ්ව විද්‍යාලයේ තිබෙන වංචනික ක්‍රියා, හිතුවක්කාර වැඩ, අදක්ෂ පාලනය යන මේවා ගැන සොයා බැලීමට අග්‍රාණ්ඩුකාරතුමා මාර්ගයෙන් වහාම කොමිටියක් පත් කරන ලෙස එහි ශිෂ්‍ය ශිෂ්‍යාවන් ඉල්ලා සිටිනවා. ඒ ශිෂ්‍යයින්ගේ වර්ජනයට තුඩු දුන් හේතු අතර එය මුල් තැනක් ගන්නවා. ගරු අග්‍රාණ්ඩුකාරතුමා විශ්ව විද්‍යාලයේ කුල පති නිසා ඇත්ත වශයෙන්ම ඒ ශිෂ්‍ය යින් ඉල්ලා සිටින පරිදි, එවැනි කොමිටි යක් පත් කළ යුත්තේ එතුමා මාර්ග යෙනුයි. තම ඉල්ලීම් සාධාරණ බව සනාථ කිරීමට මේ ශිෂ්‍යයින් ඔඩිටර් ජනරාල්ගේ වාර්තාවෙන් කරුණු ඉදිරිපත් කර තිබෙ නවා. ඒවා දීර්ඝ වශයෙන් ඉදිරිපත් කරන්නට කාල වේලාව නැති නිසා මම එයින් කරුණු දෙක තුනක් පමණක් තමුන්නාන්සේට පෙන්වා දෙන්නම්.

විද්‍යාලංකාර විශ්ව විද්‍යාලයයේ එක් ගොඩනැගිල්ලක් සඳහා රු. 1,81,720 ක මුදලක් ලබාගෙන තිබෙනවා. එහෙත්, එක්තරා කෙනකුගේ නමක් යොදා, ඔහුට "පිං පිණිස කරවන ලදී" යනුවෙන් එම ගොඩනැගිල්ල ඉදිරිපිට ලියා තිබෙනවා.

**ගරු ඊරියගොල්ල**
*(கௌரவ ஈரியகொல்ல)*
(The Hon. Iriyagolle)
කොයි කාලයේද ?

**ටී. බී. එම්. හේරත් මයා.**
*(திரு. ரி. பி. எம். ஹேரத்)*
(Mr. T. B. M. Herath)
මේ කාරණය එළි වී තිබෙන්නේ නම් ඊයේ පෙරෙයිදායි. 1966 ඔඩිටර් ජනරාල් වාර්තාවෙනුයි මෙය අනාවරණය වී තිබෙන් නේ. කොයි කාලයේදී කෙරුණත් වරද වරදක් හැටියට පිළිගන්නට අප ලෑස්ති බව මා කථාව පටන් ගන්න විටම කිව්වා.

එපමණක් නොවෙයි. පෑලියගොඩ ළිඳක් කැපීමට රු. 17,000 ක් වැය වී තිබෙන බවත්, දළුගම ළිං දෙකක් කැපීම සඳහා එකකට රු 34,198.20 බැගින් රු. 63,396.40 ක් වැය වී තිබෙන බවත් මෙම ඔඩිටර් ජනරාල් වාර්තාවෙහි සඳහන් වෙන වා. මේවා මහජන මුදල් නේද ? මහජන මුදල් නාස්ති වී තිබෙන අන්දම පරීක්ෂා කරන ලෙස මේ උපාධි අපේක්ෂකයින් හෙවත් අපේ අනාගත පරම්පරාව අප ගෙන් ඉල්ලා සිටින විට එය ඉටු නොකර තොත් අප ඊට වරදකරුවන් නොවෙයිද ? මෙයින් කාට පහර වැදුණත් මහජන මුදල් මේ විධියට නාස්ති කිරීම වරදක් බව අප පිළිගත යුතුයි. මෙම ළිං කැපීම සඳහා ටෙන්ඩර් පවා කැඳවා නැති බව ඔඩිටර් ජනරාල් වාර්තාවෙන් පෙන්වා දී තිබෙ නවා. ඊළඟට, ජලයෙන් යට වන එක්තරා වගුරු බිමක් විශ්ව විද්‍යාලයට අත්පත් කර ගැනීම සඳහා රු. 1,16,364 ක් වියදම් කර තිබෙනවා. මේ විධියේ කරුණු තවත් රාශියක් පෙන්වා දී තිබෙන නමුත් අද දක්වා කිසිවකු මේ ගැන සොයා බලා නැහැ; මේවාට වගකිව යුත්තන්ගෙන් අද දක්වා කිසිවකු මේ ගැන ප්‍රශ්න කර නැහැ. විශ්ව විද්‍යාලයට නිදහස තිබිය යුත්තේ එහි කට යුතු "විශ්ව" නම් පමණයි. එහි කටයුතු දූෂිත නම් මේ විධියේ සීමා රහිත නිදහසක් ඒවාට දෙන්නට අප සූදානම් විය යුතු නැහැ.

තවත් වැදගත් කරුණක් පෙන්විය යුතුයි, මේ අවස්ථාවේදී. විද්‍යාලංකාරයේ ආදි ශිෂ්‍ය සංගමය ගොඩනැගිලි සඳහා රුපි යල් ලක්ෂයක් ලබාගෙන තිබෙනවා. එයින් වැඩි කොටසක් ලබාගෙන තිබෙන් නේ, එහි දානට සිටින එවකටත් සිටි පාලකයින් විසිනුයි. එම නිසා අප දෙගොල් ලටම මෙයින් බේරෙන්නට පුළුවන්කමක් නැහැ. එදා වරදක් කළ අය අදත් ඒ වර දම කරමින් සිටිනවා. ගරු අධ්‍යාපන ඇමති තුමා ඊයේ පෙරෙයිදා ගෙනා පණතින් මේ පිළිබඳව කිසිවක් කෙරිලා නැහැ. එයිනුත් වැඩක් කෙරී නැති නම් තවත් පනතක් හෝ ගෙනැවිත් මෙය හරියාකාර ඉටු කරන ලෙසයි, මා කියන්නේ. අපේ අනා ගත පරම්පරාව හැදෙන්නේ මේ රටේ විශ්ව විද්‍යාලවලින් තමයි. අපේ උපාධි අපේක් ෂක ළමයින්ට මේවා තේරෙනවා නම් මෙවැනි ගරු සභාවක සිටින මන්ත්‍රීවරුන් ටත් ඇමතිවරුන්ටත් අගමැතිවරුන්ටත් මේවා පිළිබඳව මෙතරම් හඬගා කියන්නට වුවමනාද ? මේ අන්දමේ ප්‍රශ්නයක් එම උපාධි අපේක්ෂකයන් අපෙන් ඇසූ විට අපට ඒ ඉදිරියෙහි දණ ගසන්නට සිදු

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ටි. බී. එම්. හේරත් මයා.]

වෙනවා නේද? මෙවැනි කරුණු තවත් රාශියක් තිබෙනවා. ඒවා සියල්ල කියන්නට දැන් වේලාවක් ඇත්තේ නැහැ.

විශ්ව විද්‍යාලය ඇතුළේ කොමිටියක් පත් කළා. ඒ කොමිටිය මගින් අනාවරණය කර ගත් කරුණු රාශියක් තිබෙනවා. විශ්ව විද්‍යාලය ඇතුළේ සිදුවුණු දූෂණ පිළිබඳව සොයාගත් කරුණු රාශියක් ඒ අනුව ඉදිරිපත් වෙනවා. විද්‍යාලංකාරයේ පමණක් නොවෙයි, ඔවැනි දූෂණ තිබෙන්නේ. විද්‍යොදය විශ්ව විද්‍යාලය පිළිබඳවත් මම මේ සභාවේ කරුණු සඳහන් කර තිබෙනවා. එහි කෝට් සභාවේ හිටපු සාමාජිකයකු වශයෙන් නොයෙකුත් කරුණු සඳහන් කර තිබෙනවා, උසස් අධ්‍යාපන පනත පිළිබඳව සාකච්ඡා කරන විට. මේ ස්ථාන දූෂණවලින් පිරී පවතිනවා. විද්‍යාලංකාර විශ්ව විද්‍යාලයේ පමණක් නොවෙයි, විශ්ව විද්‍යාල සියල්ලෙහිම සිටින උදවිය ඔවුන්ට දී තිබෙන නිදහස අයුක්ති සහගත අන්දමට පාවිච්චි කොට එම විශ්ව නිදහසින් අයුතු අන්දමේ ප්‍රයෝජන ලබා ගෙන තිබෙනවා. නොයෙකුත් අන්දමේ දූෂණ කටයුතුවලින් හොරකම්වලින් මහ ජන මුදල් කාබාසිනියා කර දමා තිබෙනවා. එවැනි පුද්ගලයන් සිටිනවා නම් ඔවුන්ට නිසි දඬුවම් ලබා දීමට පක්ෂ භේදයෙන් තොරව එකිනෙකා අප හැමදෙනාම ඉදිරිපත් විය යුතුයි. මා මෙම කරුණු සාමාන්‍ය දේ හැටියට සලකන්නේ නැහැ.

උපාධිධාරීන්ට රැකීරක්ෂා සැපයීම පිළිබඳ ප්‍රශ්නය ගැන එම ශිෂ්‍යයන් කියනවා. එම කාරණය නිසා තමයි, මේ පිළිබඳ තත්ත්වය තවදුරටත් උග්‍ර වී තිබෙන්නේ. දැන් උපාධිධාරීන්ට රක්ෂා ඇත්තේ නැහැ. එසේ හෙයින් ඔවුන් අතර එක්තරා තරඟයක් පවතිනවා. එක විශ්ව විද්‍යාලයකින් ලැබෙන සහතිකයට වැඩි සැලකිල්ලක් ලැබෙනවා නම්, ඒ කියන්නේ පේරාදෙණියේ විශ්ව විද්‍යාලයෙන් ලත් සහතිකය පළමුවන පන්තියේ එකක් වෙනවා නම්, අනෙක් විශ්ව විද්‍යාලවලින් ලත් සහතික ඉබේම පැත්තකට තල්ලු වී යනවා. එසේ හෙයිනුයි, ඒ උදවියත් සමාන සහතික ක්‍රමයක් ඉල්ලන්නේ. එම නිසායි, මේ තරඟය තවදුරටත් උග්‍ර වී තිබෙන්නේ.

පසුගිය කාලයේ විශ්ව විද්‍යාලයෙන් පිට වුණු හැම දෙනාටම පාහේ විශ්ව විද්‍යාලයෙන් එළියට ආ හැටියේම වාගේ කෙසේ හෝ රක්ෂා සපයනු ලැබුවා. කුමන ක්‍රමයක් හෝ යොදා විශ්ව විද්‍යාලවලින් පිට වන අයට රැකීරක්ෂා සැපයීම ගැන එදා හිටපු අධ්‍යාපන ඇමතිවරුන්ට අප ස්තූතිවන්ත වන්නට ඕනෑ. හැමදාම ඒක කරන්නට පුළුවන් දෙයකැයි මා සිතන්නේ නැහැ. ඒ උදවිය වැඩි දෙනකුට රැකීරක්ෂා සැපයීම කළා. තමුන්නාන්සේලා හැකි තරම්වත් රැකීරක්ෂා සපයන්නේ නැහැ. කාටවත් රක්ෂා නැති තත්ත්වයක් තමයි, අද පවතින්නේ. රැකීරක්ෂා ප්‍රශ්නය නිසා විශ්ව විද්‍යාලවලින් පිට වන උපාධිධරයන් අතර අද ලොකු කලකිරීමක් ඇති වී තිබෙනවා. උපාධිධාරීන්ට රැකීරක්ෂා සැපයීම සඳහා සුදුසු විධිවිධාන යොදන්නැයි කියන්නේ එම නිසායි. ඔවුන්ට රැකීරක්ෂා සැපයීමට විධිවිධාන යොදන බවට රජය සහතික කළයුතු යැයි ඔවුන් කියනවා. මා කියන්නේ නැහැ, සහතික කරන්නටය කියා. එහෙත් පුළුවන් පමණ මහන්සි ගන්නට ඕනෑ, රැකීරක්ෂා සපයා දෙන්නට. ඔවුන් විශාල වියදමක් දරා ඉගෙනගෙන තිබෙනවා. මා කල්පනා කරන හැටියට, විශ්ව විද්‍යාලවලට තේරී සිටින අය ළඟ තමයි මේ රටේ හොඳම මොළ ටික තිබෙන්නේ. ඉතාම උසස් බුද්ධියක් තිබෙන ඒ උදවියට රක්ෂා සපයන්නට නිසි වැඩ පිළිවෙළවල් යොදන්නට ඕනෑ.

එහෙත් අද උපාධිධාරීන් පැත්තක සිටියදී පන්දම් අල්ලන උදවියට රක්ෂා ලබා ගන්නට හැකි ක්‍රියා මාර්ග තිබෙනවා. ඉන් එකක් තමා, තුණ්ඩු ක්‍රමය. මගේ පළාතේ කෙනෙකුට එක්තරා ඇමතිවරයෙක් ලිපියක් යවා තිබෙනවා, "ගිහිල්ලා පළාතේ මන්ත්‍රීවරයා හමු වන්න; එතකොට රක්ෂාව ගන්නා හැටි කියා දේවි" යනුවෙන්. මා විරුද්ධ පාර්ශ්වයේ මන්ත්‍රීවරයකු නිසා මම දන්නේ නැහැ, ඒ ක්‍රමය. ඇමතිතුමාට යැවූ තුණ්ඩුවකට ඇමතිතුමා ආපසු තුණ්ඩුවක් එවා තිබෙනවා, ඒ රක්ෂාව බලාපොරොත්තු වන තනැත්තාට. ඒකත් රැගෙන මන්ත්‍රීතුමා හමු වන්නට කියනවා. මා විරුද්ධ පාර්ශ්වයේ කෙනෙකු නිසා මම දන්නේ නැහැ, එම ශාස්ත්‍රය ගැන

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

කියන්න. තුණ්ඩු ක්‍රමයට රක්ෂාව ලැබෙනවා නම් එවැනි බුද්ධිමතුන්ට කුමක්ද සිදු වන්නේ ? ඔවුන් අධෛර්‍යයට පත් වෙනවා. එම නිසයි, රක්ෂා දෙන හැටියට සහතික වන්නැයි ඔවුන් කියන්නේ. උපාධිධාරීන් මහපාරේ එහාට මෙහාට රස්තියාදු වෙද්දී ඉගෙන නොගත් උදවිය වෙනත් මාර්ගවලින් රක්ෂා ලබා ගන්නවා. අප අහනවා, තමුන්නාන්සේලාට උපාධිධාරීන් ගොවි හමුදාවට බඳවා ගන්න බැරිමන්ද කියා. සාමාන්‍යයෙන් නූගත් කෙනෙකුට වඩා හොඳින් උගත් පුද්ගලයා ඒ කාර්යය කරන්නේ නැද්දැයි බලන්න. බුද්ධිමත් පුද්ගලයාට, නූගත් පුද්ගලයාට වඩා හොඳින් ඒ කටයුත්ත කරන්න පුළුවනි. එමනිසා යම්කිසි ක්‍රමයක් තිබෙනවා නම් ඒ උපාධිධාරීන්ගේ අනාගතය පිළිබඳව, එයින් ඔවුනට සෑහීමට පත් වෙන්න පුළුවනි. එපමණක් නොවෙයි, ආණ්ඩුව උපාධිධාරීන් හැකි තරම් පත් කර ගෙන බැරි ප්‍රමාණය තමයි මේ ඉතිරිව සිටින්නේ කියන හැඟීමක් ඒ උදවියට ඇති වෙනවා නම්, එයින් වුණත් ඔවුනට සෑහීමකට පත් වෙන්න පුළුවනි. අවාසනාවකට මෙන් දැන් පවත්නා ක්‍රමය යටතේ නම් ඒ අයට කොයි ලෙසකින්වත් සෑහීමකට පත් වෙන්න පුළුවන්කමක් නැහැ. එමනිසා, දේශපාලන වශයෙන් අප ඉල්ලා සිටින්නේ, මේ රටේ සිටින බුද්ධිමත් කොටස තරහ කර ගන්නේ නැතුව ඒ උදවියගේ අනාගතය පිළිබඳව යම්කිසි වැඩ පිළිවෙළක් ගන්නා ලෙසයි. කෙසේ වුණත් අද ගෙන යන වැඩ පිළිවෙළ දෙස බලන විට ප්‍රජාතන්ත්‍රවාදී ලෙස ආණ්ඩු කිරීම තව දුරටත් නැවැත්වීමේ අදහසින් ක්‍රියා කරනවාද කියන සැකයක් ඇති වෙනවා. ගරු කථානායකතුමනි, මා කලින් සඳහන් කළ ලෙස, රටේ සිටින බුද්ධිමතුන්, උපාධිධාරීන් පිරිස දැන් අවුරුදු තුන හතරක පමණ කාලයක සිට රක්ෂාවක් නැතිව නිකම් රස්තියාදු වෙනවා. එසේ වුණත් පස්සා දොරින් ඇතැම් අයට රක්ෂා දෙනවා. එමනිසා, ශිෂ්‍යයින්ගේ ඉල්ලීමක් තිබෙනවා රැකීරක්ෂා ගැන සහතිකයක් කරන්නටය කියන. එසේ සහතිකයක් කරන්න බැරි නම් රැකීරක්ෂා ලබා ගැනීමට හැකි ක්‍රමයක් යොදන්න. එවිට ඒ අය ඉන් සෑහීමකට පත් වේවි.

අනික් කාරණය, ඒ අය සඳහන් කරනවා ශිෂ්‍යාධාර ගැන. මේවා ගැන දිගින් දිගට විස්තර කිරීම අවශ්‍යයයි මා කල්පනා කරන්නේ නැහැ. ඒ වාගේම මානුෂික අයිතිවාසිකම් ගැනත් සඳහන් කරනවා. අද මානුෂික අයිතිවාසිකම් පවා නොතකා විනය නීති මාලාවක් පනවා තිබෙනවා. සිගරැට් කැබැල්ලක්, කඩදාසි කැබැල්ලක් බිම දැම්මොත් රුපියල් පණහක් දඩ ගහනවාය කියන්න මේ රටේ පවතින සාමාන්‍ය නීතියෙන් නම් පුළුවන් කමක් නැහැ. එසේ වුණත් අද එබඳු විනය නීති පනවා තිබෙනවා. එපමණක් නොවෙයි, විද්‍යාලංකාර විශ්ව විද්‍යාලයේ පනවා තිබෙන නීතිරීති අනුව සැතපුම් පහක් ඇතුළතදී ආගම ඇදහීමටත් අවසර ගන්න ඕනෑ. ගරු කථානායකතුමනි, ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවෙ 29 වන වගන්තියේ ඇතුළත් වන්නේ කුමක්ද? එම ව්‍යවස්ථාවන්ට පවා පටහැනිව අද ක්‍රියා කරන බව පෙනී යනවා. අද, විද්‍යාලංකාර විශ්ව විද්‍යාලයේ ශිෂ්‍යයින්ට තම ආගම අදහන්න විද්‍යාලයෙන් අවසර ගන්න වන තත්ත්වයෙ විනය නීති පනවා තිබෙනවා. මෙය පුදුම වැඩක් නොවෙද ? මේ වාගේ අමානුෂික විනය නීති පනවනවා නම් ඒ විනය නීති මගින් අපේ දරුවන් වහලුන් බවට පත් කරන්න උත්සාහ කරනවා නම් මේ රටේ ජනතාවගේ ධනය, ලක්ෂ ගණනින් කෝටි ගණනින් එවැනි ආයතනවලට වියදම් කරනවා දකින්න මේ ගරු සභාවේ මන්ත්‍රීවරුන් වන අප කිසිසේත් සූදානම් නැති බවයි මා මතක් කරන්නේ. අපේ දරුවන්ගේ නිදහස, අපේ දරුවන්ගේ ආත්ම ගරුත්වය රැකගෙන මනුෂ්‍යයින් වශයෙන් හැදීමට රුකුලක් ලැබෙන අන්දමට මේ මුදල් වැය කරන්න ඕනෑ. එසේ නැතුව කාගෙවත් වහලුන් හැටියට අපේ දරුවන් හැඩ ගස්වන්න මේ මුදල් කිසිසේත් වැය කරන්න වුවමනාවක් නැහැ. පංක්ති භේදයක් නැතුව, උස්පහත් භේදයක් නැතුව, දුප්පත් පොහොසත් භේදයක් නැතුව ඇමතිවරයාගේ දරුවාටත් සාමාන්‍ය මිනිසාගේ දරුවාටත් නිදහසේ අධ්‍යාපනය ලැබිය යුතු ආයතනයක් තමයි, විශ්ව විද්‍යාලය. එවැනි ආයතනයක මානුෂික නිදහසට අවහිර වන සේ නීතිරීති පනවා ක්‍රියා කරනවා නම්, ශිෂ්‍යයින් වහලුන් බවට පත් කරන්න උත්සාහ දරනවා

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[පී. බී. එම්. හේරත් මයා.]

නම් එම වහල්භාවය නැතිකළ යුතු බවයි අප කියා සිටින්නේ.

ගරු කථානායකතුමනි, ආචාර්ය එන්. එම්. පෙරේරා—අපේ යටියන්තොට මන්ත්‍රීතුමා—මුදල් ඇමතිතුමා වශයෙන් ක්‍රියා කරන කාලයේදී, එතුමා සකස් කළා දුප්පත් ශිෂ්‍යයින්ට තමන්ගේ ඉගෙනීමේ කටයුතු කර ගෙන යන්න බැංකුවෙන් මුදල් ණයට ලබා ගැනීමේ ක්‍රමයක්. රක්ෂාවක් කළායින් පසුව එම මුදල කොටස් වශයෙන් ආපසු ගෙවීමේ වැඩ පිළිවෙළකුයි එතුමා සකස් කළේ. මෙම වැඩ පිළිවෙළ නිසා ගමින් එන, දුප්පත් පැල්පතින් එන දරුවාට පවා විශාල සෙතක් සැලසුණා. නමුත් මේ රජය එම වැඩ පිළිවෙල නවතා දැමුවා. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් තමුන්නාන්සේ දන්නවා ඇති, මෙයට අවුරුද්දකට පමණ පෙර පේරාදෙනියෙ විශ්ව විද්‍යාලයේ ශිෂ්‍යයෙක් මුදල් නැතිකම නිසා දිවිනසා ගත් බව. ඒ අන්දමට දුප්පත් උදවියගෙ දරුවන්ට සහනයක් සැලසීම පිණිස මහජන බැංකුවෙන් මුදල් ණයට දීමේ ක්‍රමයක් සකස් කළ නමුත් මේ රජය එම වැඩ පිළිවෙළ සම්පූර්ණයෙන්ම අත්හැර දමා තිබෙනවා. එම වැඩ පිළිවෙළට බාධා කිරීම ගැන, නවත්වා දැමීම ගැන මා මෙම ආණ්ඩුවට චෝදනා කරනවා. රක්ෂාවක් කළාට පසුව කොටස් වශයෙන් ආපසු ගෙවීමේ ක්‍රමය යටතේ දුප්පත් ශිෂ්‍යයකුට ණය මුදලක් දෙන්න මහජන බැංකුවට බැරි මන්ද? එසේ වුණත් ගෙවල් හදන්න රුපියල් ලක්ෂ ගණනින්, කෝටි ගණනින් ණය මුදල් දෙන්න පුළුවනි. මාසයකට රුපියල් සියයක්-එකසිය පණහක් දෙන්න සූදානමක් නම් නැහැ. දුප්පතුන් සඳහා සුළු මුදලක් දෙන්න මැලිවීම ගැන මා මේ ආණ්ඩුවට චෝදනා කරනවා. දුප්පත් මහජනතාවට සැලසූ ඒ සහනය නතර කර දැමීමට පියවර ගත්තේ මන්දැයි දැන ගැනීමට සතුටුයි. මෙය කවුරුන් ආරම්භ කළත් කමක් නැහැ. "රතු" පුද්ගලයකු ඇරඹුවත් එය හොඳ වැඩක් නම් අප ඉදිරියට ගෙන යාමට අකමැති මන්ද? එමනිසා අධ්‍යාපන කටයුතු කර ගෙන යාම පිණිස දුප්පත් දරුවන්ට සලසා දුන් සහනය ඉදිරියටත් සලසා දෙන ලෙස මා මතක් කරනවා.



මෙවැනි තවත් ප්‍රශ්න රාශියක් තිබෙනවා. වේලාව අවසාන වේගෙන යන නිසා මගේ කථාව දීර්ඝ කරන්නට මා බලාපොරොත්තු වන්නේ නැහැ. මා අවසාන වශයෙන් ඉල්ලීමක් කරන්නට කැමතියි. විශ්ව විද්‍යාලවල ඉගෙන ගන්නා උපාධි අපේක්ෂක අපේ දරුවන් උපාධිය ලබා ගත්තාට පසුව තමා ලබාගත් උපාධිය ලංකාවේ අනිකුත් විශ්ව විද්‍යාලවල උපාධි හා සම තත්ත්වයක් දරනවාය, තමන් ලැබූ උපාධිය ලෝකයේ අනිකුත් රටවල් විසින් ලංකාවේ අනෙකුත් විශ්ව විද්‍යාලවලින් පිරිනමන උපාධි හා සම තත්ත්වයකින් පිළිගන්නවාය, උපාධිය ලබාගෙන මේ රටේ අනිකුත් අයට වඩා බුද්ධිමතුන් හැටියට විශ්ව විද්‍යාලයෙන් එළියට පැමිණි විට බුද්ධියෙන් කරන රැකිරක්ෂා සඳහා තමන් තෝරා ගනු ලබනවාය, කියන විශ්වාසයක් හා ස්ථිරත්වයක් ඔවුන් තුළ ඇති කරන්නට ඕනෑ. එහෙත් අද සිදු වී තිබෙන්නේ කුමක්ද? කොළ පාට කමිසයක් දමා ගෙන ඡන්දපේක්ෂකයාගේ පස්සෙන් ගොස් තුණ්ඩු කෑල්ල ලබා ගත්තාම කොන්දොස්තරකමක් ලැබෙනවා. ගරු ඇමතිතුමාගේ අලුත් පනත අනුව 12 වැනි ශ්‍රේණිය පාස් කර විශ්ව විද්‍යාලයෙන් විෂයයන් හතරක්ද පහක්ද පාස් කර එළියට පැමිණි විට තුණ්ඩුව ලබාගන්නට බැරි වුණොත් ගෙදරටවී ඉන්නට ඕනෑ. එය විශාල අපරාධයක්. ගරු ඇමතිතුමා අධ්‍යාපනය වර්ග කරන්නට කල්පනා කරනවා නම් ඒ ඒ අංශවලින් වුවමනා කරන ප්‍රමාණය විශ්ව විද්‍යාලයෙන් පිට කර ගන්නට බලන්න ඕනෑ. විද්‍යා ගුරුවරුන් නැතෙයි කියනවා. නැත්නම් පුහුණු කරවන්නේ නැත්තේ ඇයි? ඉංජිනේරුවන් මදි නම් ඒ අංශය පුළුල් කර රටේ අවශ්‍යතාවයන්ට ප්‍රමාණවත් වන පරිදි ඉංජිනේරුවන් ඇති කර නොගන්නේ ඇයි? කෙසේ වෙතත් උපාධිය ලබාගෙන විශ්ව විද්‍යාලයෙන් පිටවන අයට යම්කිසි ස්ථිරත්වයක් බලාපොරොත්තුවක් ඇතිව පිටවීමට කටයුතු යොදන ලෙස මා ඉල්ලා සිටිනවා.

අද කොළඹ විශ්ව විද්‍යාලයේ හා විද්‍යාලංකාර විශ්ව විද්‍යාලයේ ඇති වී තිබෙන තතත්වය ගැන බලමු. එදා ශිෂ්‍යයින්ගෙනුත් අපෙනුත් ගරු අගමැතිතුමා කළ ඉල්ලීම අනුව වර්ජනය සමථයකට පත් වේය කියා අපි බලාගෙන හිටියා. එහෙත් අද වන

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

තුරුත් එය සමථයකට පත් වී නැහැ. ඒ නිසා මේ විශ්ව විද්‍යාලවලට සමතැන් දීමේ ප්‍රශ්නය නිරාකරණය කිරීමටත් දූෂණ සොයා බැලීමටත් සාධාරණ කොමිසමක් පත් කරන ලෙස ඉල්ලා සිටිනවා. ඔය කරුණු දෙක හරියාකාර ඉටු කළොත් ඔය වර්ජනය නතර කර උපාධි අපෙක්ෂකයන් නැවත පන්තිවලට යනවාට කිසිම අවිශ්වාසයක් නැහැ. එහෙත් කොමිසමක් පත් කරනවා නම් රට රවටන්නට කොමිසමක් පත් කරන්න එපා. දැනට පැන නැගී ඇති අවුලින් මේ රටේ අනාගතය බාරගන්නට සිටින උපාධි අපේක්ෂක ඒ පිරිස වැටී සිටින තත්ත්වයෙන් බේරා ගැනීමට ඉදිරිපත් විය යුත්තේ රජයයි. ඒ නිසා ඒ සඳහා ඉදිරිපත් වන්නය කියා රජයෙන් ඉල්ලා සිටිමින් මගේ කථාව අවසාන කරනවා.

අ. භා. 5.32

**ගරු ඩඩ්ලි සේනානායක**
*(கௌரவ டட்லி சேனநாயக்க)*
(The Hon. Dudley Senanayake)

Mr. Speaker, I do not propose to deal with the matters raised by the hon. Member for Walapane (Mr. T. B. M. Herath) during the course of his remarks because I have no doubt that the Hon. Minister in his reply will deal with some of them.

In passing I only wish to remark that it would be more appropriate to discuss appointments and their irregularities once the House is in possession of the C. W. E. Commission report. We shall discuss these matters when we all have the necessary facts available to us.

I am compelled to make a few remarks in view of the fact that I had occasion, on an Adjournment Motion earlier, to intervene in this matter and because the hon. Member for Colombo South (Mr. Bernard Soysa) referred to that intervention in the remarks he made.

Firstly, I would remind hon. Members of the House that some months back the Hon. Minister of Education brought forward a proposal for the stablishment of a separate university in Colombo. It was canvassed in this House. He adduced some very good reasons for having a separate university. The management of the university in Colombo as a campus of the university at Peradeniya, according to the Hon. Minister and the facts put forward by him, became rather difficult, and the situation called for the establishment of a university in Colombo. That was, I believe, accepted by the House without a division. I do not know whether the hon. Member for Colombo South has any doubt about this. I cannot remember.—[*Interruption*].

**බර්නාඩ් සොයිසා මයා.**
*(திரு. பேர்னட் சொய்ஸா)*
(Mr. Bernard Soysa)

I mentioned that there will be trouble about the name.

**ගරු ඩඩ්ලි සේනානායක**
*(கௌரவ டட்லி சேனநாயக்க)*
(The Hon. Dudley Senanayake)

He may have mentioned that there will be trouble about the name. But I do not think that he, for a moment, contested the desirability of having another university in Colombo.

Well, it may be that on second thoughts we are thinking of other solutions. I do not blame him or anybody else because various views have been put forward and attitudes towards the solution of this problem may have changed, but I want to bring forward this fact that for very good reasons adduced by the Hon. Minister on that occasion, it was decided, practically unanimously, by this House that there shall be another university in Colombo.

Now the whole trouble originally arose over the name. It is after this trouble had arisen and had gone on sometime that I myself interdicted and made a statement. I want to refer to parts of that statement because my subsequent conduct in the light of the statement I made seems to be questioned. What I did say on that occasion was that, when the Hon. Minister himself brought up certain proposals before the Cabinet,

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

an opinion was expressed that it would be undesirable to change the name of the university at Peradeniya which is known as the University of Ceylon. It has had that name, and it has been known throughout the world by that name. It has turned out graduates as graduates of the University of Ceylon.. Therefore, I said whatever name is given to the Colombo Institution, let us not change the name of the University of Ceylon. Now, I made that quite clear in my statement. I shall read it out :

"However, there was a feeling in the minds of the members of the Cabinet that any alteration, even by implication, of any word or letter in the status of the university that had been established for some time at Peradeniya, would be unsatisfactory, "

That was the statement I made, and in fact I went on to say :

" . . . . without derogating from the status that Peradeniya held, to give a similar status to the university constituted at Colombo. "—[OFFICIAL REPORT, 6th November 1967 ; Vol. 75, cs. 2270 and 2271].

Perhaps what I meant would not have been clear, but to my mind what I said was, let us not change the name of the University at Peradeniya, but let us give the University of Colombo the status of a university of Ceylon. It is perfectly clear. As far as I can see that is what I stated. And the further statement was made that I shall consult—the hon. Member for Colombo South referred to that—the persons interested before a final decision is made.

In fact I can tell the hon. Member for Colombo South that after my statement various student deputations saw me in my office and wanted an elucidation, a clarification of my statement. They wanted to know what I actually meant. I think the hon. Member for Colombo South is also aware of it. I told them what I intended to convey by my statement, namely, that there should be no change at all in regard to Peradeniya but that we would give the status of a university of Ceylon to the Colombo institution.

There were certain other difficulties that I mentioned. For instance, there were some students who entered the University of Ceylon before this naming took place. What they wished was to have the degree of the University of Ceylon even though they were now in the newly named University of Colombo. I said that that adjustment could easily be done. We can give the option to all those who entered the university before the naming to have the degree of the University of Ceylon if they so wished.

Now, Mr. Speaker, after I met the deputations of students there was a discussion with certain other people who were interested in the university question, namely, the Hon. Minister himself, the Chairman of the National Council of Higher Education, and the two vice-chancellors. I had a discussion with them too, and I believe the Hon. Minister of Education will bear me out when I say that the Vice-Chancellor at Peradeniya was opposed to any change in the name of the Peradeniya institution. That was his view. He expressed it at that conference. He said that there may be trouble in Peradeniya if that was done. Hon. Members may say that the University Senate passed a resolution for changing it. It is true. but I am telling you what the Vice-Chancellor at Peradeniya stated at that discussion. After that discussion it was decided that the Peradeniya institution should retain the name it had without any change, and the Colombo institution should be called "University of Ceylon, Colombo", giving it the status of a university of Ceylon.

There was a deputation that met me after that. Professor Mylvaganam, Dr. Hoover, and some other came along with some students. They took this matter up. They were not satisfied with that decision. As far as I can remember, they were suggesting that one be called "University of Ceylon, Peradeniya, and the other "University of Ceylon, Colombo," or something to that effect.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

Professor Mylvaganam and I were colleagues at a university once. I told Professor Mylvaganam, "You are a graduate of Cambridge and so am I. We were together. How would you like if the name 'Cambridge' was changed?" I do not think he said anything in reply to that. I asked him whether he did not likewise think that the graduates of Peradeniya would also not like the name of the Peradeniya university, known throughout the world, changed suddenly. I told him that he and I would cease to be graduates of an existent university if the name of the Cambridge University was changed. Similar feelings would arise as regards the graduates of the University of Ceylon if we changed the name in any way and gave it a different name.

I think they argued to the effect that Colombo was really the seat of the university and that Peradeniya had a certain number of faculties. I told them that I had been a member of the University Council for a number of years and I was aware of the fact that Peradeniya was the seat of the university, and that faculties in Colombo were gradually being shifted to Peradeniya. In fact, I remember, there was a delay in shifting the Engineering Faculty. There was a row going on between the then Vice-Chancellor and the Professor of Engineering. The Vice-Chancellor was accusing the Professor of Engineering of causing undue delay in shifting the Engineering Faculty from Colombo to Peradeniya. All those were illustrative of the fact that Peradeniya was acknowledged to be the site that was decided upon. So that, those were the circumstances in which this particular decision was made. I told them, "You may make any decision you like about the name; one can argue till the cows come home that it is wrong. Make any decision, and I will argue against it." It is possible, always possible in a matter such as this, to argue that the particular naming is unsatisfactory.

Then, as regards these funds and various things that the hon. Member for Colombo South (Mr. Bernard Soysa) referred to, adjustments can be made about financial provision so that the Colombo institution will not suffer.

Therefore, I want hon. Members to realize that it was not with the intention of giving a secondary status to the Colombo institution that this naming in this fashion took place. There would have been criticism, there might have been trouble—I cannot say there would have been—if the name of Peradeniya was changed.

බර්නාඩ් සොයිසා මයා.
(திரு. பெர்னட் சொய்ஸா)
(Mr. Bernard Soysa)

After your communique there would have been trouble, because you had given them the status of "University of Ceylon." Nobody would like to derogate from that status after it had been created.

ගරු ඩඩ්ලි සේනානායක
(கௌரவ டட்லி சேனநாயக்க)
(The Hon. Dudley Senanayake)

I did not give them that status They had that status. I did not agree to that status being changed. It is a status they had. I felt it was undesirable to change that—not the status, that name. As a matter of fact, to my mind, under this new naming, both institutions have the status of Universities of Ceylon. But I did not want to change the name of Peradeniya. I thought so for very good and strong reasons. That was the whole trouble.

I did also say in that discussion with the professors that a university does not get its reputation and status through a name. I reminded them that each university builds up a reputation of its own for particular branches of study. For instance, I reminded Professor Mylvaganam that when we went to Caombridge—I do not know whether it is the same now—Cambridge was reputed for science and Oxford for arts. I do not know whether the same situation holds now. Each university builds up a reputation for studies in a particular branch; and through the lapse of

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

years it may be that Colombo will build up a much higher reputation than Peradeniya. In certain branches of study, Colombo would have an advantage over Peradeniya. The hon. Member for Colombo South must agree that it will have such advantage. In those branches of study, its reputation will be much higher than Peradeniya. But that is to be seen. The matter of reputation, the standing, of a university is determined by its whole body—the professors, the lecturers, the students. It is they who can build up that reputation.

I am glad I got this opportunity of making this statement, because I have not moved from the position I took up when I made the earlier statement.

අ. භා. 5.52

**ප්‍රින්ස් ගුණසේකර මයා.**
*(திரு. பிறின்ஸ் குணசேக்கர)*
(Mr. Prins Gunasekera)

ගරු කථානායකතුමනි, මෙවැනි වැදගත් ප්‍රශ්නයක් සම්බන්ධයෙන් ගරු අගමැතිතුමා කථා කළාට පසුව මට කථා කරන්නට ලැබෙන්නේ හදිසියෙන්. එතුමාගේ කථාවේදී සඳහන් වුණු කරුණු කීපයක් ගැන පිළිතුරු දෙන්නට මා බලාපොරොත්තු වෙනවා. මෙම විවාදයට මූලික වශයෙන් හේතු වුණේ ගරු අගමැතිතුමා පසුගිය හය වැනිදා මෙම ගරු සභාව ඉදිරියේ කළ ප්‍රකාශයයි. අද මෙම විවාදය සඳහා පැය තුනක කාලයක් ලබා ගැනීම සඳහා විරුද්ධ පාර්ශ්වය ඔබතුමා හමු වී කීප වරක්ම සාකච්ඡා කළ බව ඔබතුමා දන්නවා. අපට දෙතුන් වරක් ඔබතුමා හමු වන්නට සිදු වුණේ ඊට දවස් කීපයකට පෙර, එනම් පසුගිය හතර වැනිදා, මෙම ගරු සභාවේදී ගරු අධ්‍යාපන ඇමතිතුමා ඔබතුමාගේ අවසරය ඇතිව කළ එක්තරා ප්‍රකාශයක් නිසයි. එවකට සති තුනක් පමණ පැරණි වූ විශ්ව විද්‍යාල අර්බුදය සම්බන්ධයෙන් ඒ විද්‍යස්ථාන ගැන වග කියන ඇමතිතුමා හැටියට අධ්‍යාපන ඇමතිතුමා එදා ඔබතුමා හමුවේත්, මන්ත්‍රී මණ්ඩලය හමුවේත් එක්තරා ප්‍රකාශයක් කළා. ඒ ප්‍රකාශය සම්බන්ධයෙන් විරුද්ධ පාර්ශ්වයේ අදහස් ප්‍රකාශ කිරීමටත්, ඒ ගැන විවාදයක් පැවැත්වීමටත් අවස්ථාවක් අයැද සිටි නමුත් ඔබතුමා දන්නා පරිදි මේ කැබිනට් මණ්ඩලයේ එක්තරා ගරු ඇමතිවරයකුගේ විරුද්ධත්වයක් නිසා අපට එම අවස්ථාව නො ලැබී ගියා. ඉන් පසුව ඔබතුමාගේද මැදහත් වීම ඇතිව මෙම අවස්ථාව ලබා ගැනීමට සාකච්ඡා දෙකක් පැවැත්තුවා. ඒ සාකච්ඡා දෙකෙන් එකක් පැවැත්වුණේ හය වැනිදා ගරු අගමැතිතුමා විසින් කරන ලද ප්‍රකාශයෙන් අනතුරුවයි. අධ්‍යාපන ඇමතිතුමාගේ ප්‍රකාශයට අනතුරුව පසුගිය හය වැනිදා ගරු අගමැතිතුමා මන්ත්‍රී මණ්ඩලයේදී කළ විනාඩි හතරක ප්‍රකාශය, මිනිත්තු දහඅටක් තිස්සේ ගරු අධ්‍යාපන ඇමතිතුමා විසින් කරන ලද ප්‍රකාශයට හාත්පසින්ම, සියයට සියයක්ම පටහැනියි. එතකොට මන්ත්‍රී මණ්ඩලය හමුවේත්, උසස් අධ්‍යාපන පිළිබඳ වගකිවයුත්තන් හමුවේත් උසස් අධ්‍යාපනය පිළිබඳ සැලකිල්ලක් දක්වන සාමාන්‍ය ජනතාව හමුවේත්, පොදු රටවැසියා හමුවේත් එකිනෙකට කිසි සේත් නොගැළපෙන්නා වූ, හාත්පසින්ම එකිනෙකට විරුද්ධ වන්නා වූ ප්‍රකාශ දෙකක් දැන් තිබෙනවා. ගරු අධ්‍යාපන ඇමතිතුමා විශ්ව විද්‍යාල ප්‍රශ්නය සම්බන්ධයෙන් විනාඩි පහළොවක් විස්සක් තිස්සේ කරුණු සම්පිණ්ඩනය කරමින් අවසානයට කියා සිටියේ මොකක්ද? ඒ සියලුම කරුණු එකිනෙක ගෙනහැර දැක්වීමට කාලය නැති නිසා කරුණු සම්පිණ්ඩනය කර දැක්වුවහොත් එදා ගරු අධ්‍යාපන ඇමතිතුමා පැහැදිලි කළ, පැන නැඟී තිබෙන විශ්ව විද්‍යාල ප්‍රශ්නය සඳහා කැබිනට් මණ්ඩලයේ තීරණය මෙයයි.

කුමක්ද? කොළඹ විශ්ව විද්‍යාලය පිහිටුවීමට පෙර පැවති තත්ත්වයට නැවත වරක් ආපසු යාමයි. ඒ ප්‍රකාශය කොට පැය 48 ක් ගත වන්නටත් මත්තෙන්, ඒ ප්‍රකාශය කළේ කැබිනට් මණ්ඩලයේ අනුමැතිය හෝ අවසරය හෝ නැතිව බව එම කැබිනට් මණ්ඩලයේම සිටින රාජ්‍ය ඇමතිතුමා මේ ගරු සභාවටත්, රටටත් කියා සිටියා.

**ගරු ඊරියගොල්ල**
*(கௌரவ ஈரியகொல்ல)*
(The Hon. Iriyagolle)

එහෙම කීවා නම් වැරදියි.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ප්‍රින්ස් ගුණසේකර මයා.**
*(திரு. பிறின்ஸ் குணசேக்கர)*
(Mr. Prins Gunasekera)

අධ්‍යාපන ඇමතිතුමා මගේ කථාවට හරස් කපමින් කියන දේවලට පිළිතුරු දෙන්නට ගියොත් මගේ තර්කය ඒ විධියට——

**ගරු ඊරියගොල්ල**
*(கௌரவ ஈரியகொல்ல)*
(The Hon. Iriyagolle)

තමුන්නාන්සේට පිළිතුරක් නොවෙයි මා කීවේ. කෙනෙක් එහෙම කීවා නම් වැරදියි.

**ප්‍රින්ස් ගුණසේකර මයා.**
*(திரு. பிறின்ஸ் குணசேக்கர)*
(Mr. Prins Gunasekera)

අවටින් ඇසෙන ශබ්දවලට ඇහුම්කන් දෙන්නට මා කැමති නැහැ. නොවැම්බර 4 වැනිදා අධ්‍යාපන අමතිතුමා කළ ප්‍රකාශයෙන් අනතුරුව විරුද්ධ පාර්ශ්වය ඒ සම්බන්ධයෙන් විවාදයක් ඉල්ලා සිටි අවස්ථාවේදී දෙගොල්ල අතර ඇති වුණු වචන හුවමාරුවේදී හොඳටම පැහැදිලි වුණා, ගරු අධ්‍යාපන ඇමතිතුමා කළ ප්‍රකාශය කැබිනට් මණ්ඩලයේ අනුමැතිය නැතිව කළ එකක් බව.

එහෙත් කලින් දා මේ ගරු සභාවේදී එතුමා පොරොන්දු වුණේ, කැබිනට් මණ්ඩලයේ අනුමැතිය ඇතිව ප්‍රකාශයක් කරන බවටයි. අවශ්‍ය නම්, ඒ කරුණ පමණක් සනාථ කිරීම සඳහා 1967 නොවැම්බර් 3 වැනි දා හැන්සාඩ් වාර්තාවේ 1701 වැනි තීරුව කියවන්නම්:

"ගරු ඊරියගොල්ල:

Please give me half a second to explain. I have to explain my position to the Cabinet, and after the decision of the Cabinet, I shall make a full statement here. So, I shall be very thankful if you will wait till I make that statement."

අධ්‍යාපන ඇමතිතුමා කීවේ එහෙමයි. විරුද්ධ පාර්ශ්වය වෙනුවෙන් දකුණු කොළඹ ගරු මන්ත්‍රීතුමාත් (බර්නාඩ් සොයිසා මයා.), මාත් ඊට කලින් දා කිසියම් ප්‍රශ්න වගයක් අහන්නට සූදානම් වුණු අවස්ථාවේදී ඇමතිතුමා කීවා, "කරුණාකර අද ප්‍රශ්න අහන්නට එපා; හෙට කැබිනට් මණ්ඩලය සමඟ සාකච්ඡා කොට, කැබිනට් මණ්ඩලයේ අනුමැතිය හා අවසරය ලබා ගෙන ප්‍රකාශයක් කරනවා" කියා. එසේ කීවේ 1967 නොවැම්බර 3 වැනි දායි. "හෙට" වුණා; 1967 නොවැම්බර 4 වැනි දා උදා වුණා. ඔබතුමාගේ අවසරය ඇතිව එතුමා එදා මේ ගරු සභාව හමුවේ ප්‍රකාශයක් කළා. ඒ ප්‍රකාශය කිරීමට ඔබතුමා අවසර දුන්නේ, කලින් දා එතුමා දුන් ප්‍රතිඥාව උඩයි.

1967 නොවැම්බර 4 වැනි දා අධ්‍යාපන ඇමතිතුමා කළ ප්‍රකාශයේදී කිසිම අවස්ථාවක කීවේ නැහැ, "එය කැබිනට් මණ්ඩලයේ අනුමැතිය නැතිව කරන ප්‍රකාශයක්" බව. එහෙම නම් අපට යුක්තියක් තිබෙනවා තීරණය කරන්නට, නිගමනය කරන්නට, "අධ්‍යාපන ඇමතිතුමා අද කරන කථාව ඊයේ දුන් ප්‍රතිඥාව අනුව කැබිනට් මණ්ඩලයේ අවසරය හා අනුමැතිය ඇතිව කරන එකක්" බවට.

**ගරු ඊරියගොල්ල**
*(கௌரவ ஈரியகொல்ல)*
(The Hon. Iriyagolle)

අයිතියකුත් තිබෙනවා; ඇත්තත් ඒකයි.

**ප්‍රින්ස් ගුණසේකර මයා.**
*(திரு. பிறின்ஸ் குணசேக்கர)*
(Mr. Prins Gunasekera)

එය ඇත්ත නම් රාජ්‍ය ඇමතිතුමා එයට සම්පූර්ණයෙන් හරස් කපමින් කිවේ ඇයි, "කැබිනට් මණ්ඩලයේ සාමාජිකයකු හැටියට මේ ප්‍රකාශය ඇහුවේත් මෙතැන දීයි" කියා. කැබිනට් මණ්ඩලය ඇතුළේ තිබෙන කුණු කන්දල්, මත භේද අපට වුව මනා නැහැ. වැදගත් ජාතික ප්‍රශ්නයක් පිළිබඳව, මේ රටේ බුද්ධිමත් ජනගහණයෙන් විශාල කොටසක් කෙරෙහි බලපාන උග්‍ර ප්‍රශ්නයක් පිළිබඳව, වගකිව යුතු ඇමතිවරයකු මෙවැනි ප්‍රකාශයක් කරන විට එය වගකිව යුතු ප්‍රකාශයක් වශයෙන් විශ්වාස කිරීමට අපට අයිතියක් තිබෙනවා. පොදුවේ මුළු විරුද්ධ පාර්ශ්වය වෙනුවෙන්ම කථා කරන්නට මට පුළුවන් කමක් නැහැ. මා නම් ඇත්ත වශයෙන්ම, අධ්‍යාපන ඇමතිතුමා ප්‍රතිපත්ති ප්‍රකාශයක් කළත් ඒ ප්‍රකාශ ගැන ඒ තරම්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ප්‍රින්ස් ගුණසේකර මයා.]

සැලකිල්ලක් දක්වන කෙනෙක් නොවෙයි. මගේ කනගාටුදායක අත්දැකීම නම් මේ ගැන කැබිනට් මණ්ඩලයේ ඇතැම් ගරු ඇමතිවරුන් වගකීමෙන් තොරව ප්‍රකාශයන් කරන බවයි. එදා 4 වැනිදා ගරු අධ්‍යාපන ඇමතිතුමා කළේ වගකීමෙන් තොර ප්‍රකාශයක්. එය කර පැය 48ක් ඇතුළත කැබිනට් මණ්ඩලයේ නායකයා හැටියට ගරු අගමැතිතුමා විශ්ව විද්‍යාලයීය ප්‍රශ්නය විසඳිම සඳහා විශ්ව විද්‍යාලයීය කටයුතු ගැන උනන්දුවක් දක්වන හැම දෙනාටත්, පඩක්ති වර්ජනය කර සිටි ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට සහ වෙනත් අයටත් ආයාචනයක් කරමින් කියා සිටියේ මේ ප්‍රශ්නය සම්පූර්ණයෙන්ම සාධාරණ ලෙස විසඳීමට දැන් ඉදිරිපත් වී සිටින බවයි. පේරාදෙණියේ විශ්ව විද්‍යාලයටත්, කොළඹ විශ්ව විද්‍යාලයටත් යන මේ දෙකටම කිසිම හානියක් නොවන පරිදි සමතැන් තත්ත්වයක් දීමෙන් මේ ප්‍රශ්නය විසඳීමට එතුමා ඉදිරිපත්වෙලා සිටිනවාය කිව්වා.

සමතැන් කියන වචනය මේ රටේ තරමක් අභාග්‍යසම්පන්න ඉතිහාසයක් තිබෙන වචනයක්. ගරු අගමැතිතුමා එදා පාවිච්චි කළේ මේ සමතැන් කියන වචනයයි. පේරාදෙණියේ ලංකා විශ්ව විද්‍යාලයටත්, කොළඹ ලංකා විශ්ව විද්‍යාලයටත් සමතැන් දෙන ප්‍රතිඥාවක් එදා එතුමා දුන්නා. දීලා හැම දෙනාගෙන්ම ඉල්ලා සිටියේ ආපසු පඩක්තිවලට යන ලෙසයි. මේ ප්‍රශ්නය සැම දෙනා සමගම සාකච්ඡා කර සාධාරණය ඉටු කරන්නෙමියි එතුමා එදා කිව්වා.

ගරු අගමැතිතුමා නොවැම්බර් මාසයේ 6 වැනිදා දුන් ඒ ප්‍රතිඥාව 4 වැනිදා ගරු අධ්‍යාපන ඇමතිතුමා දුන් ප්‍රතිඥාවට හාත් පසින්ම විරුද්ධයි. පඩක්ති වර්ජනය කර සිටින විශ්ව විද්‍යාලයීය ශිෂ්‍ය ශිෂ්‍යාවන් තමන්ගේ ඉල්ලීම කුමක්දැයි දන්නවා. නම පිළිබඳ වෙනසක් නිසා පැන නැඟි අර්බුදයක් විසඳීමේදී ගරු අධ්‍යාපන ඇමතිතුමා කියන්නේ නම පිළිබඳව අර්බුදයක් ඇති වන්නේ නැහැ යන්නයි. පරණ තත්ත්වයටම අප යනවා, යනුවෙන් එතුමා කියනවා. ගරු අගමැතිතුමා කියන්නේ නම පිළිබඳ අර්බුදය දෙගොල්ලටම සමතැන් දීමෙන් විසඳන බවයි. ගරු ඇමතිවරයකු දුන් ප්‍රතිඥාව ප්‍රතික්ෂේප කර කැබිනට් මණ්ඩලයෙහි නායකයා හැටියට ගරු අගමැතිතුමා දුන් ප්‍රතිඥාව පිළිගෙන, එවකට කොළඹ විශ්ව විද්‍යාලය යන නමින් තිබුණු ආයතනයේ වෛද්‍ය හා විද්‍යා ශිෂ්‍යයින් ගරු අගමැතිතුමා කෙරෙහි විශ්වාසය තබා ආපසු පඩක්තිවලට යෑමට පෙර කරුණු පහදා දීම සඳහා 7 වැනිදා උදේ ගරු අගමැතිතුමා හමුවුණා. මේ අවස්ථාවේ ගරු අගමැතිතුමා මෙහි ඉන්නවා නම් බොහොම හොඳයි. එහෙම නම් මට සන්තෝෂ වන්නට තුබුණා. මා එසේ කියන්නේ ඇයි? වෛද්‍ය හා විද්‍යා අංශයේ ශිෂ්‍ය සංගම් මගින් නිකුත් කර තිබුණු ඇතැම් ප්‍රකාශයක් නිසා තමන් එදා මන්ත්‍රී මණ්ඩලයේදී දුන් ප්‍රතිඥාව කඩ වූ බවක් හැඟෙනවා යයිද, එහෙම ප්‍රතිඥාවක් දුන්නේ නැතැයිද, තමා දෙවැනි වරටත් නිකුත් කළ ප්‍රකාශයෙන් සීමා කර ඇත්තේ පළමු වැනි ප්‍රතිඥාව හරි හැටි ක්‍රියාවේ යෙදීම පමණකැයිද කිව්වා.

ගරු අගමැතිතුමා දැන් මෙහි නැහැ. එතුමා මෙහි නොසිටියත් මේ කාරණා ටික ලේඛනගත විය යුතු නිසා කියන්නට ඕනෑ. 6 වැනිදා හැන්දෑවේ ගරු අගමැතිතුමා දුන් ප්‍රතිඥාව හරි හැටි පැහැදිලි නැති නිසා අර්බුදය සමථයකට පත් කිරීමට පඩක්ති වර්ජනය කර සිටි ශිෂ්‍ය ශිෂ්‍යාවන් කැමැත්තෙන් සිටි නිසා ඔවුන් පසු වදා උදේ ගරු අගමැතිතුමා හමු වුණා. හමුවෙලා ඒ ගැන ඇහුවා. මේ ප්‍රශ්නය පිළිබඳව සැලැකිල්ලක්, උනන්දුවක් දක්වන හැම දෙනාම සමග සාකච්ඡා කිරීමට ගරු අගමැතිතුමා ප්‍රතිඥාවක් දුන්නා. එය එක්තරා විධියකට ඉටු වූ බව මේ ශිෂ්‍ය සංගම්වල නායකයන් පිළිගන්නවා. එක්තරා ප්‍රමාණයකට පමණයි එය ඉටු වුණේ. මේ ශිෂ්‍ය සංගම් මැදහත් වුණේ තමනට පැහැදිළිව නොතේරුණු ව්‍යාකූල ස්ථානයක් පැහැදිලි කර ගැනීම සඳහායි. ඒ අවස්ථාවේදී ශිෂ්‍ය සංගම්වල නියෝජිතයන් අගමැතිතුමාට පැහැදිළිවම ප්‍රශ්නයක් ඉදිරිපත් කළා. "අගමැතිතුමනි, ඔබතුමා කිව්වා, කොළඹ විශ්ව විද්‍යාලයටත්, ලංකා විශ්ව විද්‍යාලයටත් සම තත්ත්වයක් දෙනවාය කියා. එයින් අදහස් කරන්නේ පේරාදෙණියේ ලංකා විශ්ව විද්‍යාලය යන නම එහෙමම තිබියදී ලංකා විශ්ව

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

විද්‍යාලය, කොළඹ, කියා කොළඹ ආයතනය නම් කිරීමද ?" යන ප්‍රශ්නය මේ විද්‍යා හා වෛද්‍ය අංශයේ ශිෂ්‍යයන් මතු කළා. ඒ අවස්ථාවේදී අගමැතිතුමා දුන් පිළිතුර කුමක් ද ? මේ සාකච්ඡාවට, එනම් නොවැම්බර් 7 වන දින උදේ 9.30 ට අගමැතිතුමා සමග පැවැත්වූ මේ සාකච්ඡාවට, වෛද්‍ය ශිෂ්‍ය සංගමයේ සභාපති සචිත්තානන්ද, එම සංගමයේ ලේකම් හීනටිගල, එම සංගමයේ උප සභාපති රුද්‍රිගෝ හා තවත් ශිෂ්‍ය සංවිධාන කීපයක් වෙනුවෙන් රඹුක්පොත, ප්‍රනාන්දු, පොදු ශිෂ්‍ය සංගමයේ සභාපති ජස්ටින්, එහි ලේකම් පාලික ගුණසිංහ යනාදී මහත්වරුන් සහභාගි වුණා. ඒ අවස්ථාවේදී වෛද්‍ය ශිෂ්‍ය සංගමය වෙනුවෙන් එම සංගමයේ සභාපති මහත්මයා කෙළින්ම ප්‍රශ්නයක් මතු කළා. මේ සාකච්ඡාව පවත්වා තිබෙන්නේ ඉංග්‍රීසියෙනුයි. ඇසූ ප්‍රශ්නය මේකයි :

"Sir, will you name us 'University of Ceylon, Colombo' and retain the name 'University of Ceylon' for the other place ?"

ඇත්ත වශයෙන්ම නම පිළිබඳ පටලැවිල්ලක් පැන නැගුනා මිසක් විශ්ව විද්‍යාලයීය තත්ත්වය පිළිබඳ පටලැවිල්ලක් කවදාවත් මේ ශිෂ්‍යයින් තුළ තිබුණේ නැහැ. නම වෙනස් කිරීම නිසා විශ්ව විද්‍යාලයීය තත්ත්වයෙන් නොව මහජනතාව ඉදිරියේ පෙනී සිටින හොඳ නාමය පිළිබඳ තත්ත්වයෙන් අඩුවක් වේය යන බිය පමණයි මේ ශිෂ්‍යයින් තුළ තිබුණේ. විශ්ව විද්‍යාලයීය තත්ත්වය පිළිබඳව ප්‍රශ්නයක් කවදාවත් මේ ශිෂ්‍යයින් අතරවත් විශ්ව විද්‍යාල දෙක අතරවත් තිබුණේ නැහැ. ශිෂ්‍යයන් විසිනුත් ලංකා විශ්ව විද්‍යාලයේ මහාධිකාරී මණ්ඩලය විසිනුත් මෙතැන "ස්ටේටස්" යන වචනය පාවිච්චි කර තිබෙන්නේ විශ්ව විද්‍යාලයීය තත්ත්වයට නොව නම් වෙනස් කිරීම නිසා ඇති වන ගෞරවය හා හොඳ නාමය කෙරෙහි පවතින තත්ත්වය කෙරෙහි බව කේම්බ්‍රිජ් විශ්ව විද්‍යාලයෙන් නීති උපාධිය ලබාගත් ගරු අගමැතිතුමා තේරුම් ගන්නට ඕනෑ. එම නිසා ගරු අගමැතිතුමාට දැන් ඇඟ බේරා ගෙන පැන යන්නට බැහැ. "මම මුල් ප්‍රකාශයේදී පේරාදෙණි තත්ත්වයට නොවෙනස් තත්ත්වයක් දෙනවාය කියා කිව්වාය" කියා දැන් පැන යන්නට බැහැ. අගමැතිතුමා දෙන්නට ඕනෑ නැහැ ඒක. ඒක දී අවසානයි. පසු ගිය ජූලි 24 වන දින අපගේ විවේචනයන් මධ්‍යයේ ගරු අධ්‍යාපන ඇමතිතුමා විසින් ඉදිරිපත් කොට සම්මත කොට ගත් රෙගුලාසි මාගීයෙන් කොළඹ විශ්ව විද්‍යාලයට විශ්ව විද්‍යාලයීය තත්ත්වය දී අවසානයි. ලංකා විශ්ව විද්‍යාලයීය තත්ත්වය කොළඹ විශ්ව විද්‍යාලයටත් දී අවසානයි. එම නිසා මෙතැන තත්ත්වය පිළිබඳ ප්‍රශ්නයක් නොවෙයි තිබෙන්නෙ; නම පිළිබඳ ප්‍රශ්නයකුයි. එම නිසා තමයි ශිෂ්‍යයින් පැහැදිලිවම ප්‍රශ්නයක් ඇසුවෙ : "අපේ නම පමණක්ද වෙනස් කරන්නෙ, නැත්නම් ලංකා විශ්ව විද්‍යාලය, පේරාදෙණිය, යන නමත් වෙනස් කරනවාද." කියා. අගමැතිතුමා ඒ ප්‍රශ්නයට දුන් පිළිතුර කුමක්ද?

"No, no ; when I say parity I mean parity."

"නැහැ, නැහැ, සම තත්ත්වය කියා මා අදහස් කරතොත් මා සම තත්ත්වය දෙනවා දෙනවාමයි" කියන එකයි ඒ කියන්නේ. ඊට පසුවදා බැලින්නම් දී තිබෙන්නේ වෙන මොකක්ද එකක්. මෙම ප්‍රශ්නයේදී මෙබඳු වැදගත් වගකීමකින් යුත් ප්‍රකාශයක් කිරීමට පෙර ඒ ප්‍රකාශය ගැන සෑහෙන තරම් කල්පනා නොකර—නිකම්ම වේදිකාවට ගොස් එදිනෙදා ඇති වන සුළු දේශපාලන ප්‍රශ්නයක් ගැන මොනවා හෝ කියා පැන යන්නා වාගේ—මන්ත්‍රී මණ්ඩලයේදී ඒ ප්‍රකාශය කිරීම ගැන මා ගරු අගමැතිතුමාට චෝදනා කරනව.

අදත් ගරු අගමැතිතුමාගේ කථාවේ සාවද්‍ය කරුණු කීපයක් සඳහන් වුණා. එනම් ලංකා විශ්ව විද්‍යාලය නමැති විද්‍යාපීඨය පිහිටුවූ මධ්‍යස්ථානය හැටියට එතුමා අවුරුදු ගණනක් තිස්සේ දන්නේ පේරාදෙනිය බවයි. ඒ ප්‍රකාශය සම්පූර්ණයෙන්ම වැරදියි. මෙහි නීත්‍යානුකූල තත්ත්වය කුමක් ද කියා තමන්ගේ නීති උපදේශකයන්ගෙන්වත් දැන ගන්න වටිනවා නොවේ ද ? මේ රටේ අධ්‍යාපන ඉතිහාසයේ කවදාවත් නොවූ විරූ තරම් බැරෑරුම් බර පතළ උග්‍ර අර්බුදයක් අද පැන නැඟී තිබෙනවා. ඒ අර්බුදය විසඳීම සඳහා රටේ නායකයා හැටියට ගරු අගමැතිතුමා මෙ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ප්‍රින්ස් ගුණසේකර මයා.]

තැන ප්‍රකාශ කරනවා, ලංකා විශ්ව විද්‍යාලය සදහටම තිබුණේ පේරාදෙණියේ පමණය, වෙන තැනක පිහිටා තිබුණේ නැත කියා. මේ විධියට, අගමැතිතුමාගේ ප්‍රකාශවලට සවන් දෙන සාමාන්‍ය රට වැසියා අගමැතිතුමාගේ කථා පිළිගන්න ඕනැ. ඒ මොක ද? එක අතකින් රාජ්‍ය නායකයා; අනික් අතින් පැරණි පළ පුරුදු දේශපාලනඥයෙක්. එවැනි පුද්ගලයකු මෙවැනි කාරණයක් පිළිබඳව මෙවැනි ප්‍රකාශයක් කරන විට රටවැසියා එය එපරිදි පිළිගැනීම ස්වාභාවිකයි. එහෙත් කථානායකතුමනි, එහි ඇත්ත තත්ත්වය කුමක් ද? එහි නීත්‍යානුකූල තත්ත්වය එය නොවෙයි.

ලංකා විශ්ව විද්‍යාලය පිහිටුවීමට පෙර විශ්ව විද්‍යාලය නමින් ලන්ඩන් විශ්ව විද්‍යාලයේ ශාඛාවක් කොළඹ තිබුණා. එවකට එහි විද්‍යාලයාධිපති වශයෙන් සිටි සර් අයිවර් ජෙනිංස් ලංකා විශ්ව විද්‍යාලය නමින් ස්ථානයක් පිහිටුවීම සඳහා 1942 අංක 20 දරණ ආඥාපනතින් විශ්ව විද්‍යාලය නීතිගත කළා. ලංකා විශ්ව විද්‍යාලය නමින් හැඳින්වුණ ඒ විශ්ව විද්‍යාලය—

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)

I am sorry to interrupt the hon. Member, but the time allotted to him by the Whip is 20 minutes. I should like to ask him to be as short as possible because there are three other Members who wish to speak.

**ප්‍රින්ස් ගුණසේකර මයා.**
*(திரு. பிறின்ஸ் குணசேக்கர)*
(Mr. Prins Gunasekera)

ගරු කථානායකතුමනි, මේ කරුණු ටික පැහැදිලි කිරීම සඳහා මට තව විනාඩි කීපයක් කථා කරන්නට සිදු වේවි. මා ස්තුතිවන්ත වෙනවා ගරු මාතර මන්ත්‍රීතුමාට, එතුමා කියනවා එතුමාගේ කාලයත් අර ගෙන කථා කරන්නය කියා.

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)

ඔව්, එසේ කියා දිගටම කථා කරනවා. ඊත් පසුව මොකක්ද වෙන්නේ?

**ප්‍රින්ස් ගුණසේකර මයා.**
*(திரு. பிறின்ஸ் குணசேக்கர)*
(Mr. Prins Gunasekera)

කැබිනට් මණ්ඩලයේ ඇමතිවරුන් අතර වාගේ අපේ එහෙම භේදයක් පැන නඟින්නේ නැහැ.

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)

මීට කලින් එහෙම වෙලා තිබෙනවා.

**ප්‍රින්ස් ගුණසේකර මයා.**
*(திரு. பிறின்ஸ் குணசேக்கர)*
(Mr. Prins Gunasekera)

1942 අංක 20 දරණ පනතින් ලංකා විශ්ව විද්‍යාලය පිහිටෙව්වා. එසේ පිහිටුවීමට අදාළ ඡේදය එම පනතේ 4 වන ඡේදයයි. එනම්:

"The University constituted by this Ordinance shall have its seat in or near Kandy, on the site lying within the boundaries of any land hereafter vested in the University under section 5 (hereinafter referred to as the University precints)."

ලංකා විශ්ව විද්‍යාලය නමැති විද්‍යා පීඨයේ මධ්‍යස්ථානය හැටියට හැඳින් වෙන ස්ථානය මහනුවරයි. එයින් කියැවෙන්නේ දැනට විශ්ව විද්‍යාලය තිබෙන පේරාදෙණිය ප්‍රදේශයයි. එහෙත් මේ පනත නීතියක් වශයෙන් නීතිගත වුණත් එම නීතිය පරිදි ලංකා විශ්ව විද්‍යාලය පේරාදෙණියට ගෙන යන්න බැරි තත්ත්වයක් එදා තිබුණා. එනිසා නීතිවේදියකු වූ සර් අයිවර් ජෙනිංස් මහතා මොකක්ද කෙළේ? එවකට සිටි අග්‍රාණ්ඩුකාරතුමා ලවා 1942 අංක 20 දරණ විශ්ව විද්‍යාල පනතේ 4 වන ඡේදය නීතිගත නොවිය යුතු බවට ප්‍රකාශනයක් නිකුත් කළා. 1942 ජූනි මාසෙ 9 වෙනිදයි පනත සම්මත කෙළේ. එහෙත් මෙහිදී පැන නගින අර්බුදය හා අවුල් තත්ත්වය දුටු ජෙනිංස් මහතා විශ්ව විද්‍යාලය ආරම්භ විය යුතු දිනය වන ජූලි මාසෙ 1 වෙනිදාට දවස් කීපයකට කලින් එම පනතේ 4 වෙනි ඡේදය ක්‍රියාත්මක නොවිය යුතු හැටියට නීතිය සකස් කර ගත්තා. ගරු කථානායකතුමනි, එතකොට තත්ත්වය මොකක් ද? ලංකා විශ්ව විද්‍යාලයේ විද්‍යා

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

පීඨය—මධ්‍යස්ථානය—පිහිටුවිය යුත්තේ කොහේද කියා අද වන තෙක් කොහේ වත් නීතියෙන් නියම කර නැහැ. නීත්‍යානුකූල තත්ත්වය එයයි. 1942 ජූනි මස 9 වැනිදා අග්‍රාණ්ඩුකාරතුමාගේ නියමය පරිදි රෙගුලාසි පනවා තහනම් කරන ලද්දේ ඒ 4 වැනි ඡේදය පමණක් නොවෙයි. තවත් ඡේද කීපයක්ම තහනම් කළා. එහෙත් ඒ ඡේද අවශ්‍ය අවස්ථාවලදී නැවතත් බලපවත්වන විධියට නීති සංශෝධනය කළා. එහෙත් 4 වැනි ඡේදය මේ දක්වා නැවත වලංගු කර නැහැ. ලංකා විශ්ව විද්‍යාලයේ විද්‍යා පීඨය පේරාදෙනියය කියා කීම වැරදියි. නීත්‍යානුකූල තත්ත්වය එය නම් ලංකා විශ්ව විද්‍යාලය කියන නමට අතිරේක අයිතියක් පේරාදෙනියට තිබෙනවාය කීම සහමුලින්ම වැරදියි. ලංකා විශ්ව විද්‍යාලය කියන නම මේ දක්වා කොළඹත්, පේරාදෙනියත් දෙකම පොදුවේ පාවිච්චි කළා. ලංකා විශ්ව විද්‍යාලයේ විද්‍යා පීඨය පේරාදෙනියය කියන කාරණය නීතිගත කිරීමට තමයි, ගරු අධ්‍යාපන ඇමතිතුමා පසුගිය දවසක රෙගුලාසියක් ඉදිරිපත් කර පැය 4 ක් තිස්සේ විවාද කර අප විරුද්ධ වුණු විට ඉල්ලා අස් කර ගත්තේ. ඒ අවස්ථාවේ දීත් මා මේ තර්කය ඉදිරිපත් කළා. ඒ විවාදය අවස්ථාවේදී එතුමා බොහෝ විට අපේ ඇඟට කඩා පැන්නා, තමුසෙලා අංගොඩ යන්නට ඕනෑය කියා. එහෙත් පැය 4ක් විවාද කළාට පසු එතුමාගේ මොළය පෑදී, ඒ රෙගුලාසිය ඒ විධියට ක්‍රියාත්මක කරන්නෙ නැතුව ඉල්ලා අස් කර ගත්තා.

ගරු කථානායකතුමනි, මේ පැනනැගී තිබෙන අර්බුදය විසඳීමට දැන් එක්තරා මාර්ගයක් තියෙනවා. ලංකා විශ්ව විද්‍යාලය කියන නම පිළිබඳ තනි අයිතියක් කොළඹටවත් පේරාදෙනියටවත් නැහැ. දකුණු කොළඹ ගරු මන්ත්‍රීතුමා (බර්නාඩ් සොයිසා මයා.) යෝජනා කළා වගේ, නීඩ්හැම් වාර්තාවෙන් නිර්දේශ කර සිටියා වගේ—මට මතක හැටියට ගුණවර්ධන විශේෂ කාරක සභා වාර්තාවෙනුත් යෝජනා කර සිටියා—මේ රටට එක ලංකා විශ්ව විද්‍යාලයක් පිහිටුවීමට අවස්ථාව ලැබී තිබෙනවා. එහි ශාඛා හෙවත් විද්‍යා පීඨ, යාපනය, මඩකලපුව, මාතර, කැළණිය නුගේගොඩ, කොළඹ—වුවමනා නම් කුලියාපිටියේ වුනත්—ලංකාවේ වෙන ඕනෑම තැනක වුනත්—පිහිටුවන්නට පුළුවන්. ලංකා විශ්ව විද්‍යාලයේ විද්‍යා මණ්ඩප හැම තැනම පිහිටුවමින්, ජාත්‍යන්තර කීර්තියක් සහ පිළිගැනීමක් දැනටමත් ලබා ගෙන ඇති ලංකා විශ්ව විද්‍යාලය කියන ඒ නම හැම දෙනාටම පොදුවේ භාවිත කිරීම සඳහා ඉඩ ලබා දෙමින් මේ ප්‍රශ්නය විසඳීමට අවස්ථාව සැලසී තිබෙන විට, ඒ නම පිළිබඳ අයිතිය පේරාදෙනියට පමණක් තිබෙනවය කියා පැතලා දුවන්නෙ ඇයි? මේ නම පිළිබඳව වැඩි දුරටත් විග්‍රහ කරන්නට ගියොත් ඒ පිළිබඳව වැඩි අයිතියක් තිබෙන්නේ කොළඹට බව පැහැදිලි කරන්නට පුළුවන්. ඒ නිසා ඒ නම කොළඹට පමණක් දමන්නය කියා මා කියන්නේ නැහැ. ඊට වඩා සාධාරණ විධියට ඒ ප්‍රශ්නය විසඳා ගන්නට පුළුවන්. ඊයේ පෙරෙයිදා රැස් වූ කොළඹ විශ්ව විද්‍යාලයේ ගුරු මණ්ඩලයත් ඒ හා සමාන යෝජනාවක් ඉදිරිපත් කළා. ලංකා විශ්ව විද්‍යාලය කියන නම ලංකාවේ හැම විශ්ව විද්‍යාලයකටම පොදු එකක් කරමින් නිදහස්ව ක්‍රියා කළ හැකි, නිදහස්ව පාලනය කළ හැකි, නිදහස්ව සංවර්ධනය විය හැකි විද්‍යා මණ්ඩප ඕනෑ තරමක් ලංකාවේ ඕනෑ තැනක පිහිටුවන්නට පුළුවන්. ඒ නිසා මේ විසඳුම පිළිගන්නටය කියා ඉල්ලා සිටියා. එහෙත් ගරු අධ්‍යාපන ඇමතිතුමා ඒ විසඳුම පිළිගත්තෙත් නැහැ; ගරු අගමැතිතුමා පසුව වෛද්‍ය ශිෂ්‍ය මණ්ඩලයටත්, විද්‍යා ශිෂ්‍ය මණ්ඩලයටත් තමන්ගේ අදහස් පැහැදිලි කිරීමෙන් අනතුරුව නිකුත් කළ ප්‍රවෘත්ති පත්‍ර නිවේදනයෙන් එය පිළිගත්තෙත් නැහැ. හැම දෙනාටම සාධාරණ වන විධියට, හැම දෙනාටම යුක්තිසහගත වන විධියට මේ ප්‍රශ්නයට යෙදිය හැකි විසඳුම රජය මගින් ප්‍රතික්ෂේප කර තිබෙනවා. රටේ මෙතරම් ආන්දෝලනයක් ඇති කළ මෙම ප්‍රශ්නයට මෙතරම් සාධාරණ විසඳුමක් සොයා ගන්නට අමාරුයි. එම නිසා මේ ගැන නැවත වරක් මෙම රජය කල්පනා කළ යුතු යැයි මා සිතනවා.

ගරු අගමැතිතුමාටත් ගරු අධ්‍යාපන ඇමතිතුමාටත් මා නගන දෙවන චෝදනාව කුමක්ද? විශ්ව විද්‍යාලීය ශිෂ්‍යයන්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ප්‍රින්ස් ගුණසේකර මයා.]

අතර දැනට පැනනැඟී තිබෙන මේ අර්බුදය හුදෙක් නම පිළිබඳ, නම්බුව පිළිබඳ, හැඳින්වීමේ පුවරුව පිළිබඳ කාරණයක් හැටියට සැලකීමයි, මා නගන එම චෝදනාව. එක්කෝ එතුමන්ලා තමන් විසින් තමන්ම රවටා ගන්නට උත්සාහ ගන්නවා වෙන්නට ඇති. එසේ නැතිනම් එම ප්‍රශ්නය ගැන හරි අවබෝධයක් නැතුව ක්‍රියා කරනවා වෙන්නට ඇති. මා සූදානම් නැහැ, මේ රටේ අගමැතිතුමාට මෙම ප්‍රශ්නය පිළිබඳ හරි අවබෝධයක් නැති කෙනෙකැයි කියන්නට. එසේ කීවොත් එය මටම කර ගන්නා ලජ්ජාවක්; නින්දාවක්. මගේ රටේ අගමැතිවරයා මෙම ප්‍රශ්නය හරියාකාර අවබෝධ කර නොගත් කෙනෙක්ය කියන්නට මා කැමති නැත්තේ එම නිසයි. එහෙත් මෙම ප්‍රශ්නයට මුහුණ දෙන්නට ඔවුන් සූදානම් නැහැ. විශ්ව විද්‍යාලයට දිය යුතු නම කුමක්ද යන්න පමණක් නොවෙයි, දැන් තිබෙන ප්‍රශ්නය. ඊට වඩා බැරෑරුම්, ඊට වඩා ගැඹුරු, ඊට වඩා ජාතික සහ ඊට වඩා වැදගත් ප්‍රශ්නයක් වශයෙන් මා එම ප්‍රශ්නය හඳුන්වා දෙන්නට කැමතියි. එය මේ රටේ ජාතික සංවර්ධනය පිළිබඳ ප්‍රශ්නයක් බවයි, මගේ හැඟීම. මෙතෙක් මෙම ප්‍රශ්නය සාධාරණ අන්දමින් විසඳන්නට පුළුවන්කමක් ඇති වී නැහැ. තරුණ පරම්පරාව තුළින් නැඟී එන කෝපය එයයි. ඒ බව හරිහැටි අවබෝධ කර ගන්නට ඕනෑ. ඔවුන් අගමැතිතුමාට කෙළින්ම චෝදනා කළේ කුමක් හෙයින්ද? මන්ත්‍රී මණ්ඩලයේ දීත්, ඊට පසු දින අගමැති කාර්යාලයේ දීත් අපට දුන් ප්‍රතිඥාව තමුන්නාන්සේ සම්පූර්ණයෙන්ම කඩා බිඳ දමා තිබෙනවාය යන්නයි, එම චෝදනාව. දෙවන වර සාකච්ඡාවේදී ඔවුන් කියා සිටියා—ගරු අගමැතිතුමා එනවා; මට බොහොම් සන්තොෂයි, ඒ ගැන.

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)

තමුන්නාන්සේ දැන් මිනිත්තු 33 ක් කතා කර තිබෙනවා.

**ප්‍රින්ස් ගුණසේකර මයා.**
*(திரு. பிறின்ஸ் குணசேக்கர)*
(Mr. Prins Gunasekera)

මට කොපමණ කාලයක් දෙනවාද ?

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)

දුන්නේ මිනිත්තු 20යි. කරුණාකර ඉක්මණින් කතාව අවසාන කරන්න.

**ප්‍රින්ස් ගුණසේකර මයා.**
*(திரு. பிறின்ஸ் குணசேக்கர)*
(Mr. Prins Gunasekera)

පුළුවන් තරම් ඉක්මණින් ඉවර කරන්නම්. මෙවැනි ප්‍රශ්නයක් උඩින් පල්ලෙන් ගසා දමා වාඩි වන එක හරි නැහැ.

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)

එසේනම් මාතර ගරු මන්ත්‍රීතුමාට (තුඩාවේ මයා.) කතා කරන්න එපායැයි කියන්න.

**ප්‍රින්ස් ගුණසේකර මයා.**
*(திரு. பிறின்ஸ் குணசேக்கர)*
(Mr. Prins Gunasekera)

ඒක වටින්නේ නැහැ.

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)

එසේනම් හරියාකාර වේලාව බෙදාගෙන කතා කරන්න.

**තුඩාවේ මයා.**
*(திரு. துடாவ)*
(Mr. Tudawe)

මා දෙනවා, මගේ සම්පූර්ණ කාලය.

**ප්‍රින්ස් ගුණසේකර මයා.**
*(திரு. பிறின்ஸ் குணசேக்கர)*
(Mr. Prins Gunasekera)

ගරු කථානායකතුමනි, ඔබතුමාටත් මාතර ගරු මන්ත්‍රීතුමාටත් මේ රටේ බුද්ධිමත් තරුණ පරම්පරාව වෙනුවෙන් මගේ ගෞරවය මම පුද කරනවා. මේවා කිවයුතු කරුණුයි. මෙවැනි වැදගත් ප්‍රශ්නයකදී නිකම් උඩින් පල්ලෙන් මොනවා හරි කියා තර්කයකින් දිනීමට නොවෙයි. අපේ බලාපොරොත්තුව.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

අපේ අගමැතිතුමාගෙන් මෙම ශිෂ්‍යයන් දෙවන වතාවේදී ප්‍රශ්න කළා, "ඇයි ගරු අගමැතිතුමනි, ඔබතුමාට මතක නැද්ද මෙ වැනි ප්‍රතිඥාවක් ඊයේ අපේ සභාපති වරයාට ඔබතුමා විසින් දෙන ලද බව" යනුවෙන්. ගරු අගමැතිතුමා ඊට පිළිතුරු දුන්නේ නැහැ. තමන් ළඟ සිටි ලේකම් වරයාගෙන් අසා තිබෙනවා, එක්තරා ප්‍රශ්නයක්. ගරු කථානායකතුමනි, එම අවස්ථාවේදී මා එතැන සිටියේ නැහැ. එහෙත් මෙම ශිෂ්‍ය නියෝජිතයන්ගේ වාර්තාව පිළිගෙනයි, මා මෙම තර්කය නගන්නේ. ගරු අගමැතිතුමා ආපසු හැරී තමන් ළඟ සිටි ලේකම්තුමාගෙන් අසා තිබෙනවා, "මා එවැනි දෙයක් කීවාද ?" යනුවෙන්. අනතුරුව අගමැතිතුමා නිකුත් කළ ප්‍රවෘත්ති පත්‍ර නිවේදනයෙහිත් එය ඒ විධියටමයි කියා තිබෙන්නේ. "නොවැම්බර් මස 7 වෙනිදා ශිෂ්‍ය බල මණ්ඩලයෙහි නියෝජිතයන් සමග පැවති සාකච්ඡාවකදී කොළඹ සහ පේරාදෙණි විශ්ව විද්‍යාලවලට නමින් හා තත්ත්ව යෙන්ද සම තත්ත්වයක් දෙන බවට මවිසින් කරන ලදැයි කියන ප්‍රකාශයක් ගැන වෛද්‍ය ශිෂ්‍ය සංගමය විසින් සම්මත කරන ලද යෝජනාවෙහි සඳහන් කොට ඇතැයි" එහි සඳහන් වෙනවා. ගරු අග මැතිතුමා නිකුත් කරන ලද ප්‍රකාශයෙහි තිබෙන්නේ එම සඳහන විතරයි. මෙවැනි සඳහන් මා කළේ නැතැයි එතුමා මේ දක්වා කියා නැහැ. එතුමා මේ මන්ත්‍රී මණ්ඩලයේදීත් කතා කළා. එහෙත් එය ප්‍රතික්ෂේප කළේ නැහැ. වෛද්‍ය ශිෂ්‍යයන් සහ විද්‍යා ශිෂ්‍යයන් නගන එම චෝදනා වට මෙතෙක් ගරු අගමැතිතුමාගෙන් පිළිතුරක් ලැබී නැහැ. බොරු පොරොන් දුවක් දී ඒක කඩ කළා කියා ගරු අගමැති තුමාට මෙතැන චෝදනා කරන්ට මට වුවමනා කරන්නෙ නැහැ. පොරොන්දුව දී තිබෙන්නෙ වෛද්‍ය හා විද්‍යා ශිෂ්‍ය යන්ටයි. ඔවුන් අගමැතිතුමාට චෝදනා කර තිබෙනව. ඒ චෝදනාවට මෙතෙක් පිළිතුරු ලැබී නැහැ. මට ලැබී ඇති තොර තුරු අනුව මම සූදානම් ඒ ශිෂ්‍ය ශිෂ්‍යාවන් ගේ වාර්තාව පිළිගන්න. ගරු අගමැති තුමාගේ අත්සන සහිතව නිකුත් කරන ලද ප්‍රකාශයෙන්වත් එහෙම ප්‍රශ්නයක් ඇසූ බව හෝ ඒ විධියේ ප්‍රතිඥාවක් නුදුන් බව හෝ කියා නැහැ.

ගරු කථානායකතුමනි, එදා තකහනියේ විනාඩි 4 කදී ගරු අගමැතිතුමා කළ ප්‍රකාශ යේදී පේරාදෙනිය ගැනත් කොළඹ ගැනත් පැහැදිලිව සඳහන් කළා. එහෙත් ගරු අගමැතිතුමා මෙතැන කියා සිටියේ පේරාදෙනියෙ නම අබමල් රේණුවකින් වත් වෙනස් කරන අදහසක් එතැන තිබුණෙ නැහැ කියායි. [බාධාකිරීමක්] ගරු අගමැතිතුමා එහෙම විග්‍රහයක් කරන වා නම් වැරදියි. මක්නිසාද පාවිච්චි කර තිබෙන වචනය "status" කියන එකයි. නම පිළිබඳව වචනයක්වත් කියා නැහැ. ඒ ප්‍රකාශය කරන අවස්ථාවේදී ගරු අග මැතිතුමාට ශිෂ්‍යයන්ගේ ඉල්ලීම් පිළිබඳ ව හරි අවබෝධයක් තිබුණා නම් අර්ථ දෙකක් දිය හැකි එබඳු වචනයක් කළා නම් එය වැරදියි. මක්නිසාද ? ඇයි මේ වචනය පාවිච්චි කළේ කියා ඒ අහිංසක ශිෂ්‍යයන් නීතිඥයන් හැටියට තමුන් නාන්සේ සමග තර්ක කරන්ට නොඑන නිසයි. ඒ වචනයට අර්ථ දෙකක් දෙන්ට පුළුවන් නම් ගරු අගමැතිතුමාට පුළුවන් කම තිබුණා, මම මේ වචනය පාවිච්චි කරන්නෙ මෙන්න මේ අර්ථය ඇතිව යයි පැහැදිලි කර දෙන්න. ගරු අගමැතිතුමා පාවිච්චි කළ වචන ටික 1967 නොවැම්බර් 6 වන දා හැන්සාඩ් වාර්තාවේ 2270 වන තීරුවේ මේ විධියට වාර්තා වී තිබෙනවා :

"However, there was a feeling in the minds of the members of the Cabinet that any alterations, even by implication, of any word or letter . . . ."

**ගරු ඩඩ්ලි සේනානායක**
*(கௌரவ டட்லி சேனநாயக்க)*
(The Hon. Dudley Senanayake)

"Any word or letter."

**ප්‍රින්ස් ගුණසේකර මයා.**
*(திரு. பிறின்ஸ் குணசேக்கர)*
(Mr. Prins Gunasekera)

The operative words are "in the status of the university." "Even by implication, of any word or letter in the status of the university."

"status" ප්‍රශ්නයක් මෙතැන තිබුණෙ නැහැ. ඒ අහිංසක ශිෂ්‍යයන් නොමඟ යවා පන්ති වර්ජනය හමාර කිරීමට——

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ගරු ඊරියගොල්ල**
*(கௌரவ ஈரியகொல்ல)*
(The Hon. Iriyagolle)

ශිෂ්‍යයො නොමඟ යැව්ව එක තමයි, අපරාධය !

**ප්‍රින්ස් ගුණසේකර මයා.**
*(திரு. பிறின்ஸ் குணசேக்கர)*
(Mr. Prins Gunasekera)

—මෙවැනි ප්‍රකාශයක් කිරීම වැරදියි. ශිෂ්‍යයන් නොමඟ යැව්වෙ කොහොමද කියන එක කැබිනට් මණ්ඩලයේ අවසර ඇතිව ලිව්වාය කියන, තමුන්නාන්සේගේ අත් අකුරුවලින්ම ලියන ලද ලියුමකින් ම මම ඔප්පු කරන්නද ? මෙතැන බොරු ප්‍රකාශ කරල—

**ගරු ඊරියගොල්ල**
*(கௌரவ ஈரியகொல்ல)*
(The Hon. Iriyagolle)

බොරු නොවෙයි ; ඇත්ත [බාධා කිරීමක්]

**ප්‍රින්ස් ගුණසේකර මයා.**
*(திரு. பிறின்ஸ் குணசேக்கர)*
(Mr. Prins Gunasekera)

ඒක ඇත්ත නම් ඇයි එදා රාජ්‍ය ඇමතිතුමා කථා කරද්දි "තමුන්නාන්සෙ බොරු කියන්නෙ ; වාඩි වෙන්න" කියා අධ්‍යාපන ඇමතිතුමා නොකිව්වෙ ? තමුන්නාන්සේ කිව්වෙ ඇත්ත නම්, ඇයි එදා ඒ විධියට තර්ක කරල ජය ගන්න රාජ්‍ය ඇමතිතුමාට ඉඩ ඇරියෙ ? එයා නැති අතර මෙතැන පාළු ගෙයි වළං බිඳින්න වගේ කියන්න එනව, උන්නැහේ බොරු කිව්ව කියා. ඇත්ත වශයෙන්ම වුණේ ඒක නොවෙයි නේද ? අධ්‍යාපන ඇමතිතුමාගේ අත් අකුරු මමත් අඳුණනව. [බාධාකිරීම්] දිනයකුත් නැතුවයි ලියල තියෙන්නේ. වගකියයුතු ඇමතිවරයෙක්—

**ගරු ඊරියගොල්ල**
*(கௌரவ ஈரியகொல்ல)*
(The Hon. Iriyagolle)

දිනය අධ්‍යාහාරයෙන් ගන්ට පුළුවන් [බාධාකිරීමක්]

**ප්‍රින්ස් ගුණසේකර මයා.**
*(திரு. பிறின்ஸ் குணசேக்கர)*
(Mr. Prins Gunasekera)

අධ්‍යාහාරයෙන් ගන්ට පුළුවන් නිසා තමයි, තමුන්නාන්සේ අහු වෙලා තිබෙන්නෙ. [බාධාකිරීමක්] ගරු අධ්‍යාපන ඇමතිතුමාගේ දිනය රහිත ලිපියෙන් පටන් ගන්නම්. ඒ ලිපිය මෙහෙමයි :

"ඇම්. ඒ. ජස්ටින් මහතා,
සභාපති,
විශ්ව විද්‍යාලයීය කලා පීඨය සහ ශිෂ්‍ය
බලමණ්ඩලය.
කොළඹ 3.

ප්‍රිය මහත්මයාණනි,

1967.11.2 දාතමින් මා වෙත එවන ලද ලිපිය ගැන ස්තුති කරමි. එහි සඳහන් පරිදි නීත්‍යානුකූලව කොළඹ විශ්ව විද්‍යාලය සර්වප්‍රකාරයෙන්ම නැවතත් පෙර පරිදි ලංකා විශ්ව විද්‍යාලයේ ශාඛාවක් බවට පත් කළහොත් ඒ තත්වය පිළිගැනීමට ඔබ සංගමය සතුට ප්‍රකාශ කර තිබෙන බව අද පැවති කැබිනට් මණ්ඩලයට මම හැඟ කෙළෙමි."

ඒ කියා තිබෙන්නෙ අගමැතිතුමා කියන දේ නොවෙයි ; සම්පූර්ණයෙන් වෙනස් දෙයක්.

"ඔබගේ පොරොන්දුව ඒවූ පරිද්දෙන් ක්‍රියාත්මක වුවහොත් ඔබගේ ඉල්ලීම ඉෂ්ට කිරීමට කැබිනට් මණ්ඩලය කැමැත්ත ප්‍රකාශ කළ බවද එය ඔබට දන්වීමට මට නියම කළ බවද මෙහිලා සඳහන් කරමි."

**ගරු ඊරියගොල්ල**
*(கௌரவ ஈரியகொல்ல)*
(The Hon. Iriyagolle)

ඒක ඇත්ත.

**ප්‍රින්ස් ගුණසේකර මයා.**
*(திரு. பிறின்ஸ் குணசேக்கர)*
(Mr. Prins Gunasekera)

මොකද වුණේ යන වග දැන් අප දන්නවා.

"තවද ඔබ කරන ලද අනෙක් ඉල්ලීම පරිදි හෙට (5 වැනි දින) ..."

ඔන්න ඔතැනින් තමයි දිනේ අහු වෙන්නේ. නැත්නම්, "මා මේක ලිව්වේ මීට බොහොම ඉස්සරය" යි ඇමතිතුමා කියයි. "හෙට" යනුවෙන් ඇමතිතුමා මෙහි දක්වා තිබෙන්නේ 5 වැනිදායි. ඒ අනුව

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ලියුම ලියා තිබෙන්නේ 4 වැනිදා යි. කැබිනට් මණ්ඩලයේ අනුමැතිය නැතිව මෙහිදී වැරදි ප්‍රකාශයක් කොට, ගරු රාජ්‍ය ඇමතිතුමා එය නැතැයි කියද්දී අධ්‍යාපන ඇමතිතුමා ගලේ මොකක්දෝ කළ බළලකු මෙන් මෙතැන නිශ්ශබ්දව ඉඳලා, රාත්‍රි තමන්ගේම අත් අකුරෙන් ශිෂ්‍යයින්ට ලියුමක් ලියා කැබිනට් අනුමැතිය ලැබුණායයි දැන්නුවා.

**ගරු ඊරියගොල්ල**
*(கௌரவ ஈரியகொல்ல)*
(The Hon. Iriyagolle)

ගලේ මොකවත් නොකර ඉක්මනට කථාව ඉවර කරන්න.

**ප්‍රින්ස් ගුණසේකර මයා.**
*(திரு. பிறின்ஸ் குணசேக்கர)*
(Mr. Prins Gunasekera)

ගරු කථානායකතුමනි, මේ පිළිබඳව දිගින් දිගට තර්ක කරන්නට මට වේලාවක් නැහැ. එම නිසා මා එක් ආයාචනයක් තමුන්නාන්සේගේ අවසරය ඇතිව ඉදිරිපත් කරනවා.

මේ පැනනැගී ඇති සමාජමය අර්බුදය හුදෙක් විශ්ව විද්‍යාලයක නම ගම හා ලිපිනය හෝ විද්‍යා පීඨය පිහිටීමේ භූමිභාගය හන්තානේ කඳුවැටිය විය යුතුද, එසේ නැතහොත් කොළඹ කුරුඳුවත්තේ අශ්ව රේස් පිටිය විය යුතුදැයි වැනි, එතරම් නොවැදගත් ප්‍රශ්නයක් ලෙස සැලකීම වැරදියි. වර්තමාන රජයට මේ අර්බුදයේ නියම ස්වභාවය, ස්වරූපය හා එහි ගම්භීරත්වය අවබෝධ කර ගැනීමට පවා නොහැකිව ඇති බැව් මේ රජයේ නායකයා මෙහිලා කර ඇති ප්‍රකාශවලින් හොඳින්ම පැහැදිලියි. අප රටේ බුද්ධිමත් තරුණ පරපුරේ කොටසකගෙන් අද පළවන විරෝධය හා ඔවුනතර ප්‍රකටවන්නාවූ අසීමිත අසහනය, යුග දෙකක් අතර සිදු වන්නට ළංවන සට්ටනයක සේයාවක් පමණකි. මෙය ලංකාවේ තරුණ පරපුරට පමණක් සීමා වූවක්ද නොවේ. දියුණුව කරා පා නඟන්නට—පරණ හණමිටි ඉවත දමා මිනිස් නිදහසේ නියම පළ ප්‍රයෝජන සාමකාමීව බුත්ති විඳීම සඳහා ඉදිරියට ගමන් කරන්නට—තැත් කරන හැම රටකම, හැම ජාතියකම, හැම සමාජයකම, මේ යුග හටන



නොයෙක් අයුරින් නොයෙක් ස්වරූපයෙන් නොයෙක් මුහුණුවරින් මතුපිටට පැන නැඟුනා. ලෝකයේ ප්‍රබලතම ජාතියක් ලෙස නුදුරු අනාගතයේදී හැමටම පිළිගැනීමට සිදුවන්නාවූ මහජන චීනයේ සංස්කෘතික විප්ලවය සමාජවාදී රටක සිදුවන්නාවූ ඒ තරුණ විප්ලවයේ බාහිර දර්ශනයයි. අමෙරිකාවේ වියට්නාම් යුද විරෝධීන් ලෙස මාස් පතා, සතිපතා, දිනපතා එරට දෙවනත් කරමින්, වරෙක චිකාගෝ හාලෙම් නගරබද මුඩුක්කුවල අග්නි පූජාව වශයෙන්ද, වරෙක ඩෙට්රෝයි නුවර කලු සුදු කලබැගෑණිය වශයෙන්ද අපට ඇසෙන ඒ ද්‍රෝංකාරය අධිරාජ්‍යවාදී ධනකාමී සමාජයකින් නිකුත් වන මරළතෝනියයි. නිදහස් අප්‍රිකාවේද, මැතදී නිදහස් වූ අනෙකුත් පැරණි යටත් විජිතයන්හි ද මේ යුගාන්ත යුද්ධය නොයෙක් වෙසින් නොයෙක් නමින් නොයෙක් ධජ පතාකයන් යටතේ සිදු වෙමින් පවතී.

ශ්‍රී ලංකා විශ්ව විද්‍යාල නාමය හා අභිදානයේ ස්වරූපයෙන් අද මේ කලඑලි බැස ඇත්තේ ද මේ රටේ අනුක්‍රමයෙන් මියයමින් පවත්නා මහලු පැරණි යුගය හා බිහි වන්නට කිති කවමින්, වෙර දරමින් වද විඳිමින් සිටින අනාගත තරුණ පරපුර අතර නොවැළැක්විය හැකි සංග්‍රාමයේ එක් අවස්ථාවකි. අධිරාජ්‍ය වාදයේ හා ධන කාමයේ මඩ ගොහොරුවෙහි ගිලුණු වර්තමාන රජයේ මහලු නායකයින්ට, මේ අභිත තාරුණ්‍ය බලවේගයේ මහිමය පවා මැනගන්නට බැරි වීම ඔවුන්ගේ මෙන්ම අපගේද අභාග්‍යයක් ලෙස සැලකිය හැකිය. අතීතය හා අනාගතය අතර ඇති වන්නට යන—දෙලොවක් අතර සිදු වන්නට යන—මේ අවි සට්ටනය නිසා වර්තමානය එක්තරා කලබල ස්වභාවයක් උසුලන්නීය. දියුණුවට, ප්‍රගතියට හා ආලෝකයට විරුද්ධව මේ සටන මෙහෙයවීමට පැරණි යුගයේ සෙන්පතිවරුන් වන වර්තමාන නායකවරු හා ඔවුන්ගේ අන්තේවාසික පිරිස දැන් කැසකවමින් සිටිති. මේ රජය තව තවත් බලයේ සිටියහොත් මේ යුගාන්ත යුද්ධය—මේ දෙලොවක් අතර සටන—මේ රටේදී මහත් බියකරු ස්වරූපයක් ගැනීමට ද ඉඩ නැත්තේ නොවේ. උතුරේ ධනවාදී මහලු නායකයින්ට විරුද්ධව—උතුරේ චෙල්වනායගම්ලාට තිරුචෙල්වම්ලාට නාගනාදන්ලාට හා පොන්නම්බලම්ලාට එරෙහිව—

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ප්‍රින්ස් ගුණසේකර මයා.]

නො ඉවසිලිමත් වූ බලාපොරොත්තු සුන් වූ, දෙමළ තරුණ පරපුර, රුවපීමේ හා ජාති භේද වාදයේ කඩවූ පොරොන්දුවල බැමි පුපුරවාගෙන ඉදිරියට එන්නට නගන කාහළ නාදය පසුගිය දා යාපාපටුනෙන් අපට ඇසිණි. දකුණේ සේනානායක වරුන්ට, ජයවර්ධනයින්ට හා ඔවුන්ගේ සුවච කීකරු හුරතලුන් බවට මැතදී පත්වූ ගුණවර්ධනලාටද, මේ පිරිසට ආවඩන කර දාසි කොටින්ටද එරෙහිව සමාජවාදී ආලෝකය කරා දිව යන්නාවූ තරුණයන් දැන් පෙළ ගැසී සිටිති. වර්තමාන රජයේ කූට උපක්‍රම නිසා, කවර අයුරකින් හෝ තමන්ගේ අධිරාජ්‍යවාදී, ධනකාමී, සුඛෝපභෝගී ජීවිත ක්‍රමය ආරක්ෂා කර ගැනීමට අධිරාජ්‍ය නියෝජිත චරපුරුෂයින්ගේ හෝ නියෝජිතයින්ගේ සියුම් උපාය මාර්ගයන් නිසා ඇතැම්විට මේ යුගාන්ත යුද්ධය, මේ රට ජාතිභේදවාදී ඝට්ඨනයක හා එමගින් ඇති වෙන ත්‍රාසජනක රුධිර පූජාවක ස්වරූපය ගැනීමටද ඉඩ ඇත්තේය. එම සටන එබඳු මුහුණුවරක් ගතහොත් ඒ ජාතික අපරාධය ගැන සම්පූර්ණ වගකීම් භාරය අදිරද ගැති වත්මන් රජයේ උර හිස් මත පැවරෙන්නේය. රටක් යහමග ගෙන යෑමේ භාරදූර කාර්යය පැවරී ඇති වතීමාන රජය හා එහි නායකයෝ තමන්ගේ දේශපාලන නිස්සාරත්වය, අකර්මන්‍ය භාවය හා ශූන්‍යත්වය පසුගිය අවුරුදු දෙක හමාරක් තිස්සේ හොඳින් මැනවින් පළ කර සිටියහ. ජාතික හා සමාජීය ප්‍රශ්න යහතින් විසඳනු තබා ඒවායේ ගම්භීරත්වය හා මහත්තත්වය හරි හැටි මැනගැනීමටත් ඔවුන් අපොහොසත්ව ඇති බැව් දැන් ඔප්පු වී හමාරය. එහෙයින්, ගරු කථානායකතුමනි, වර්තමාන වයෝවෘද්ධ දේශපාලන නායකත්වයේ නිස්සාරභාවය හා ශූන්‍යත්වය පැහැදිලි කරන මේ අර්බුද අවස්ථාවේදී වර්තමාන අගමැතිතුමා ප්‍රමුඛ ධනවාදී නායකත්වයෙන් එක් අයැදුමක් කිරීමට අවසර දුන මැනවි. ඔබතුමාද අදහන, ඔබතුමා උදේ හවස යාච්ඤා කරන සර්වබලධාරී දෙවියන්ගේ නාමයෙන්, මේ රටේ පොදු ජනතාවගේ හා විශෙෂයෙන්ම අභීත, අභිමානවත් තරුණ පරපුරේ ජාතික අපෙක්ෂාවන් සපුරාලිය නොහැකි වූ වර්තමාන රජය සාම්යෙන්, නම්බුවෙන් හා ව්‍යවස්ථානුකූලව, රාජ්‍ය පාලන තන්ත්‍රය හ ඔවුන්ගේ අනාගතය මේ තරුණ පරපුරටම පවරා නිහඬව අයින් වන ලෙස ඩඩ්ලි ෂෙල්ටන් සේනානායක අගමැතිතුමාගෙනුත්, එතුමාගේ මහලු සෙබල මුළුවෙනුත් ඉල්ලා සිටීමට අවසර දුන මැනවි.

**ගරු ඊරියගොල්ල**
*(கௌரவ ஈரியகொல்ல)*
(The Hon. Iriyagolle)

ආමෙන් !

අ. භා. 6.40

**ජී. ජී. පොන්නම්බලම් මයා.** (යාපනය)
*(திரு. ஜீ. ஜீ. பொன்னம்பலம்—யாழ்ப்பாணம்)*
(Mr. G. G. Ponnambalam—Jaffna)

Mr. Speaker, may I say, in fairness to the last speaker, that I did endeavour to follow precisely the thesis that he was trying to establish. He has taken the time of one of his Colleagues and spoken for over forty-five minutes.

Be that as it may, I did make a very earnest effort to try and follow precisely the point he was trying to make. I failed, maybe due to a lack of understanding on my part.

How Harlem Ghettos, the bombing of North Vietnam, and Mao's cultural revolution have anything to do with the problem, a very deep problem, with which the entire country is confronted, I must confess that, even in a flight of rhetoric, I am unable to comprehend.

I was deeply moved by the attitude and the utterances of the hon. Member for Colombo South (Mr. Bernard Soysa), and I was thinking that this present tragedy that is being enacted before this country, before this House, on this question of higher education would be a matter on which the attitude of mind displayed by the hon. Member for Colombo South would produce the best possible results.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

I admit that all of us cannot be infallible. In fact none of us can be infallible, not even the Minister of Education. But giving the Minister credit for good intentions, giving him credit for honesty of purpose, and giving him all the excuses for the mistakes that a man is likely to make whether in the Cabinet or outside it, cannot we put our heads together to try and see what is fundamentally wrong ?

May I say this : that we on either side of the House, individually or collectively, are not equipped to pronounce or to prescribe the precise medicines for a very deep-seated malaise in the realm of higher education in this country.

One point was made by the Hon. Prime Minister about which I was a bit surprised. He said—in fact that is correct—that by means of a regulation published in the Government Gazette the Colombo University was sought to be created by way of a Motion introduced by the Minister of Education.

I had objected to this method of introducing legislation in regard to the incorporation of universities contemplated in the Higher Education Act. I have said so in this House and I have said so elsewhere ; I have said so to the Government Group.

Here is an example, with all the goodwill and all the good intentions on both sides of the House, of what happens when a regulation is introduced by reference to a notification in the Government Gazette.

These regulations are carried on from day to day, from week to week, from one Order Book to another, and eventually they are taken up for discussion.

Some of us are culpable. I admit I am culpable. A very cursory contribution was made I believe by the hon. Member for Colombo South (Mr. Bernard Soysa) on that occasion, and there was hardly an explanation by the Minister of Education, and the Motion was passed almost without discussion.

Just because the Motion was passed in that way—the Motion in regard to the establishment of a university at Colombo or the Colombo University or the University of Ceylon in Colombo—it does not matter which—it does not mean that we have obtained the considered *imprimatur*, the considered sanction, and the considered approval of the representatives of the people, or for that matter that we have public opinion behind us. I would like the Minister and the Cabinet to consider this.

I must say this. I simply cannot, and will not, subscribe to every attempt to impute motives, to question one's veracity, and so on. I do not think that it does any honour either to the speaker from the Opposition or to this House.

I repeat, giving full marks for the good and honourable intentions of the Minister and the Cabinet, let us face the fact that we have obviously blundered, obviously taken a wrong step or, at least, shall I say, taken a hasty step, and in so doing we have created problems ; and in attempting to meet a problem we have come out with a hasty solution which has again created problems, and in this way from week to week it is really useless wasting one's time in trying to memorize and have a brief in regard to the various statements made. Actually, that is not the purpose in view.

I repeat that there is a very, very big problem, a deap-seated problem, in the matter of university education in this country. We have appointed commission after commission and apparently their reports have been pigeon-holed. The situation was getting out of hand and suddenly the situation was met by an improvisation, namely, the creation of a university in Colombo, whatever that may mean.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[පොන් නම්බලම් මයා.]

What was all this talk about status and name over which the hon. Member was emitting such a lot of hot air for half an hour? Surely, it is not a question of status or name! It is the question of what we have done about university education which has created such deep-seated discontent. It is not a struggle between the capitalists and the socialists. That is bunkum! He was talking utter gibberish! The fact of the matter is that we have not provided for an expanding population with a large number of students coming out of a large number of institutions asking for, pulsating for higer education, to enter the portals of a university.

I agree with the Hon. Prime Minister that nobody would want to change the name of a university that exists and has existed, namely, the University of Ceylon. I believe it is churlish and petty for us to change it; nobody would want to change it. Let the University of Ceylon continue. May I say this? It is not the continuance of the University of Ceylon that matters; nor is it the name or parity of status of what we are going to create in Colombo or elsewhere. What matters is the working out of a scheme with the assistance of people qualified to do so, of providing for the means of imparting university education to a growing population of students.

Now what happened was that a couple of months back you introduced this particular regulation and created overnight the University of Colombo. Apart from whether one agrees with it or not, do you not see that you created the problem by your own solution? Has it ever been considered that a large number of students residing in Colombo today entered the University of Ceylon and have spent one, two and three years—in some faculties four years, that is, the Medical Faculty—when there was no question of any separation of the status or being of these two bodies? Nobody ever thought what was to happen to them? Hey presto, you created the University of Colombo and then began to wonder what was to happen to those who had been students already! That question was never considered apparently at the time that this university came into being. Secondly, when it came to providing admission for students into the universities, were the students told at the time they sat their entrance examination, to which particular university, campus or place they would go? Surely they were right to feel dissatisfied if, after they had sat for an examination, suddenly and peremptorily they were told, "Now you belong to the University of Colombo and the other man belongs to the University of Peradeniya". What might have been done was this: to have either set higher standards or allotted particular faculties of learning to the two different seats. And, if I may say so with great respect, there is not the slightest doubt about it that Peradeniya would be the very best seat for certain of the faculties of the university in exactly the same way as Colombo would be the more admirable, more acceptable and the better seat of learning for certain other faculties. All these might have been considered before these rather ill-digested regulations were brought in, the consequences of which nobody seems to know. Nobody would bait this Government, except perhaps the last speaker, that the seat of the University of Ceylon is Peradeniya. We do not want a lot of learning, or references to the University Act or anything else either to concede or rebut it. There is no question about it, but that the framers of that Act and the sponsors of the university movement living at that time and in that age contemplated a residental university at Peradeniya. Those times have gone. The whole idea has been jettisoned. We have external students residing outside the campus trying to follow lectures. We had students in Colombo listening to or attending so-called lectures

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

the racecourse also belonging to the University of Ceylon, students who I believe cannot even espy the lecturers who lecture to them from the cubicles, lecturers who do not know the students who are attending their lectures, indeed lectures who do not know whether they are giving lectures at all or playing dominoes! These are the problems to be met.

I do not think we are moving forward by indulging in this kind of sterile criticism, making debating points for or against the Government. What we have got to do is to accept the incontrovertible position that in the realm of higher university education there is an unholy mess, absolute chaos.

My hon. Friend, the Member for Colombo South (Mr. Bernard Soysa) referred to the Needham Commission Report. I certainly agree with the main recommendations. At the moment I cannot recall all the specific and detailed recommendations. I believe the Needham Commission, comprised of Mr. Needham and one other from outside Ceylon, invited by Ceylon as experts in the realm of education, recommended the constitution of three campuses of the University of Ceylon. I do not say that that is the last word on the subject. I agree with that suggestion. I think it is one of the best suggestions that have been made—one university with three campuses. You can distribute the faculties if you like. There is no necessity for all faculties to be seated to be located, in every single campus or in every single town. These can be distributed.

Now, Sir, none of the considered recommendations of educational experts have been gone into, and we continue with a hand to mouth existence from day to day making various statements as and when problems arise. And I say it is unfair—unfair to the Government, unfair to this House, unfair to the country, and more than all unfair to the students. They just do not know where they are.

Where on earth, Mr. Speaker, if I may be allowed the colloquialism, have you heard of students going on strike except in recent years? They are boycotting lectures. For what? I should have thought it was considered punishment to send students away, to prevent them from attending lectures. Now we have students boycotting lectures. That is because their position is so uncertain. They do not know, and nobody seems to assure them in regard to their future. So may I say, Mr. Speaker, that the comforting illusion that under the Higher Education Act all wisdom can be concentrated in one place, in the Ministry, and that anything that goes out from there is the last word on the subject, is not going to solve problems, as we have seen now.

I say that it is not too late, even if it is already late, for us to go into this question, if necessary anew, by getting some experts of unquestioned ability, of unquestioned calibre, of international repute, to advise us on this subject.

With all the goodwil in the world —and I am not disparaging the Minister of Education—one cannot be the last word on a subject like higher education. I do not think anyone in this country has heard the last word on the subject. May I say that we cannot possibly solve this problem by going on making statements, trying to palliate, trying to assuage, the disturbed feelings of students. There is a much deeper malady that has got to be sought out and cured, and that cannot be done by making spasmodic utterances and statements. I say that the whole question will have to be considered and thought out anew in a spirit of service, of dedication, to the unfortunate students of this country.

අ. භා. 6.55

ගරු ඊරියගොල්ල

(கௌரவ ஈரியகொல்ல)

(The Hon. Iriyagolle)

ගරු කථානායකතුමනි, මා මීට පෙර දවසකදී කරන ලද ප්‍රකාශයක් උඩ විවාද කිරීමට අවස්ථාව ඉල්ලා සිටි විරුද්ධ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

කල් තැබීම:

[ගරු ඊරියගොල්ල]

පාර්ශවයට ඒ අවස්ථාව සැලසීමෙන් දැනට තිබෙන මේ විශ්ව විද්‍යාල ප්‍රශ්නය පිළිබඳව වැදගත් කරුණු ටිකක් අසන්නට මා බලාපොරොත්තු වුණා. දකුණු කොළඹ සම මන්ත්‍රීතුමාගෙනුත් (බර්නාඩ් සොයිසා මයා.) යාපනේ මන්ත්‍රීතුමාගෙනුත් (ජී. ජී. පොන්නම්බලම් මයා.) එවැනි වැදගත් අදහස් කිපයක් ලැබීම ගැන මා සන්තෝෂ වන අතර තමන් ආ තැනටම මුළු පාර්ලිමේන්තුවම අදින්නට උත්සාහ කරමින් ලෝකයේ නැති වල්බූත කතා කියමින් විශ්ව විද්‍යාල ආයතන පිළිබඳ ප්‍රශ්නය ඉතාම පහත් තැනකට ඇද දැමීමට උත්සාහ කළ හබරාදුවෙ අද්වකාත් මන්ත්‍රීතුමා (ප්‍රින්ස් ගුණසේකර මයා.) ගැන මා කණගාටු වෙනවා. මෙහෙම අය සිටින රට වත් ඉර පායන එකයි පුදුමය. මුළු රටටම කැක්කුමක් ඇති විය යුතු වැදගත් ප්‍රශ්නයක් පිළිබඳව රටේ උසස්ම ව්‍යවස්ථාදායක ආයතනයේ කෙරෙන විවාදයකදී තමන්ගේ අඩු ලුහුඬුකම් සැහෙන මිනිසුනට ගැරහීමෙන් සම්පූර්ණ කර ගැනීමට උත්සාහ කිරීම වැනි නින්දිත දෙයක් මේ පාර්ලිමේන්තුවේ සිදු වී නැහැ. ඒ ගැන එපමණයි.

වලපනේ ගරු මන්ත්‍රීතුමා (ටී. බී. එම්. හේරත් මයා.) තුණ්ඩුවක් ගැන කථා කළා. සමූපකාර තොග වෙළෙඳ ආයතනය පිළිබඳව පත් කළ කොමිෂන් සභාවේ වාර්තාව පැමිණියාට පසුව ඒ ගැන නැවත මතු කරනවා. තුණ්ඩු ගියේ කොහෙන්ද, තුණ්ඩුවලට වුණේ කුමක්ද, තුණ්ඩු නිසා මොන මොන අයථා ක්‍රම ඇති වී තිබෙනවාද, කියා ඒ අවස්ථාවේදී කතා වේවි. විශ්ව විද්‍යල ආයතන ගැන කථා කරන විට තුණ්ඩු ගැන කථා කරන්නට මා බලාපොරොත්තු වන්නේ නැහැ. පරිප්පු, සීනි, උම්බලකඩ ආදී දේවල් පිළිබඳ සාකච්ඡාවකදී එවැනි දේවල් ගැන කථා කිරීමට බලාපොරොත්තු වෙනවා.

**එකල්හි වේලාව අ. භා. 7 වූයෙන්, ප්‍රශ්නය නොවිමසන ලදුව මන්ත්‍රී මණ්ඩලය කල් තැබීමේ යෝජනාව අහෝසි විය.**

**යෝජනාව යළිත් ඉදිරිපත් කරන ලදින්, ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදි:**

**"මන්ත්‍රී මණ්ඩලය දැන් කල් තැබිය යුතුය."—[ගරු ඩඩ්ලි සේනානායක.]**



*அப்போது பி. ப. 7 மணியாகிவிடவே, சபையின் ஒத்திவைப்பிற்கான பிரேரணை, வினா விடுக்கப்படாமலே காலாவதியாயிற்று.*

*பிரேரணை பிரேரிக்கப்பட்டு, வினா எடுத்தியம்பப் பெற்றது.*

" சபை இப்பொழுது ஒத்திவைக்கப் பெறுமாக ".—[கௌரவ டட்லி சேனநாயக்க].

*It being 7 P.M., the Motion for the Adjournment of the House lapsed without Question put.*

*Motion made, and Question proposed,*

"That this House do now adjourn."—[*The Hon. Dudley Senanayake.*]

**ගරු ඊරියගොල්ල**

*(கௌரவ ஈரியகொல்ல)*

(The Hon. Iriyagolle)

ගරු කථානායකතුමනි, ගරු අගමැතිතුමා කීවාක් මෙන්ම විශ්ව විද්‍යාලයේ කොළඹ ශාඛාව පේරාදෙනියෙන් වෙන් කිරීම පාලනයට මෙන්ම දියුණුවටද, අදාල ඛන කරුණක් ලෙස පොදුවේ කවුරුන් විසිනුත් සලකන ලද හෙයින්, ජූලි මාසයේ දී පමණ කොළඹ ශාඛාව ලංකා විශ්ව විද්‍යාලයෙන් වෙන් කොට කොළඹ විශ්ව විද්‍යාලය නමින් ස්වාධිනව පවත්වා ගෙන යායුතු යයි මා කළ යෝජනාව—දකුණු කොළඹ සම මන්ත්‍රීතුමා ඒ පිළිබඳව ප්‍රශ්න කීපයක් මතු කළ නමුත්—මේ මුළු සභාවම ඒකඡන්දයෙන් සම්මත කළා. මෙහි ලොකු වරදක් හෝ බරපතල අපරාධයක් තිබෙනවා නම් ඒ සම්බන්ධව විරුද්ධකම් දැක්වීමට ඒ අවස්ථාවේ මේ සභාවට ඉඩ තිබුණා. ඒ වැඩේ හරි කියා ඒ අවස්ථාවේ අවබෝධ වුණා. විශ්ව විද්‍යාලයක සම තත්ත්වය හෝ අසම තත්ත්වය හෝ ඇති වන්නේ එහි නමින් නොව එහි වැඩ කරගෙන යාමේදී ලබන පරිහානිය හෝ දියුණුව හෝ උඩ බව කාගේත් වැටහීමවූ නිසා විය හැකියි, එසේ වූයේ. නම කුමක් වුවත් වැඩේ නරක නම් මේ රටේවත් ලෝකයේ වෙන රටකවත් එවැනි ආයතනයක් කීර්තියට පත් වන්නේ නැහැ. "කුමාරයා" යනුවෙන් කීවත් මිනිහාගේ වැඩේ බලු නම් ඔහු කුමාරයකු වන්නේ නැහැ; ඔහු බලු වෙනවා. "කපුරු හාමි" කීවත් කට ගඳ නම් මොකටද? සමහරුන් නම උසස් කර ගන්නට උත්සාහ කරන්නේ තමන්ගේ දුර්වලකම් මතු

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

වේය කියන භය නිසයි. අපේ බුදු හාමුදුරුවන් වහන්සේට, වෙනත් නම් තබා ගත්තේ නැහැ. උන් වහන්සේ "සර්වඥ බුදුන්" පමණයි. ඒ වාගේම අගසව්වන්ගේ නම් "සැරියුත්" සහ "මුගලන්". ආයතනයක හෝ පුද්ගලයකුගේ හෝ ක්‍රියාකාරිත්වය උඩයි, ඒ ආයතනයේ හෝ පුද්ගලයාගේ කීර්තිය පැතිර යන්නේ. එසේ හෙයින් "කොළඹ විශ්ව විද්‍යාලය" යනුවෙන් එම විශ්ව විද්‍යාලයට නම් දීම ගැන එහි ගුරුන් සහ සිසුන් කැමැති වෙතැයි මා අවංකවම කල්පනා කළා. ඒ නම ලබා ගන්නට ඒ අය ආඩම්බර වෙතැයි මා කල්පනා කළා. පේරාදෙණියේ ලංකා විශ්ව විද්‍යාලය සමග තරඟ කොට මතු අනාගතයේදී එම විශ්ව විද්‍යාලය යට කරගෙන නැඟී සිටීමේ ශක්තිය ඇති කර ගැනීමට උත්සාහ කරතැයි මා හිතුවා. මා අදත් ඒ විධියට කල්පනා කරනවා.

මෙහිදී තවත් වැදගත් දෙයක් මතක් කළ යුතුයි. "කොළඹ විශ්ව විද්‍යාලය" යන නමට අද එහි කථිකාචාර්ය ධුර දරන හෝ මහාචාර්ය ධුරය දරන හෝ අය එදා විරුද්ධ වුණේ නැහැ. ඔය මහාචාර්ය හුවර් හෝ අනෙක් අය හෝ එදා ඒ සඳහා කිසිම විරුද්ධත්වයක් පෑවේ නැහැ. කොළඹ නැවතීමට කැමැත්තන් හා පේරාදෙණී යන්නට කැමැත්තන් කවුරුන් කවුරුන් දැයි විමසූ අවස්ථාවේදී කොළඹ සිටි අය කොළඹම සිටින්නට කැමැති වූ අතර සමහරුන් පේරාදෙණියේ සිට කොළඹට පැමිණෙන්නටත් කැමැති වුණා. නම ගැන කරදර වන්නට පටන් ගත්තේ ඊට පසු වයි. ඔක්තෝබර් 18 වැනිදා වන තුරු නම පිළිබඳ ප්‍රශ්නයක් මතු වුණේ නැහැ; විරුද්ධත්වයක් මතු වුණේ නැහැ. වෛද්‍ය ශිෂ්‍යයන් කිසිම අරගලයක් නැතිව ඔක්තෝබර් මස 4 වනදා සිට 18 වැනිදා දක්වා පංක්තිවලට ගියා. විශ්ව විද්‍යාලය ස්වාධීන වී, නම ලැබී, කොළඹ විශ්ව විද්‍යාලයට බැඳෙන්නට කැමති ගුරුවරුන් පේරාදෙණියේ සිට කොළඹටත් පැමිණ, තත්ත්වය තහවුරු වුණාට පසුවයි, නම ගැන රාවයක් පැතිර යන්නට පටන් ගත්තේ. මේ ගැන මුලින්ම වෛද්‍ය ශිෂ්‍යයන් අතර සාකච්ඡාවක් පැතිරී ගියා. සමහර විට ඒ ගොල්ලන් මේ පිළිබඳව අවංක හැඟීමකින් යුක්තව ක්‍රියා කරන්නට ඇති. ඒ අය එක් අවස්ථාවකදී මා මුණ ගැසෙන්නට ආවා. හමු විය යුත්තේ මා නොව විශ්ව විද්‍යාලයේ මහාධිකාරී මණ්ඩලය හෝ උපකුලපති හෝ උසස් අධ්‍යාපන සභාවේ සභාපති හෝ වුවත්, ඇමතිවරයාට ඊට ඇඟිලි ගැසීමට බලයක් නැති වුවත්, ඇමතිවරයා අතගැසිය යුත්තේ විශ්ව විද්‍යාලයේ අධිකාරීනට ඒ විශ්ව විද්‍යාලය පාලනය කර ගන්නට බැරි අවස්ථාවකදී වුවත්, ශිෂ්‍යයන් කෙරෙහි තුබුණු කරුණාව නිසා මා ඔවුනට ඇහුම්කන් දුන්නා. තමන් මුලින් බැඳුණේ ලංකා විශ්ව විද්‍යාලයට බවත්, එහෙත් දැන් තමනට ලැබෙන්නට යන්නේ කොළඹ විශ්ව විද්‍යාලයේ උපාධි බවත්, ලංකා විශ්ව විද්‍යාලය ගැන ලෝකයේ හැම තැනම පිළිගැනීමක් ඇති බවත් ඒ අය මට සඳහන් කළා. උපාධි ලබා ගැනීමෙන් පසුව පර්යේෂණ ආදී වෙනත් ශාස්ත්‍රීය කටයුතුවලින් පශ්චාත් උපාධි ලබා ගැනීමට අවශ්‍ය වුණු විට ඒ සම්බන්ධයෙන් සැලකෙන්නේ ලංකා විශ්ව විද්‍යාලයේ උපාධිය බවත් ඒ අය කීවා. ඔව්, එය ඇත්ත වන්නට පුළුවනි. මා නම් එහෙම හිතුවේ නැහැ. එහෙත් එහෙම හිතන්නට ඉඩ තිබෙනවා. මක්නිසාද? ලංකා විශ්ව විද්‍යාලයත්, කොළඹ විශ්ව විද්‍යාලයත්, විද්‍යෝදය විශ්ව විද්‍යාලයත්, විද්‍යාලංකාර විශ්ව විද්‍යාලයත්, එකම උසස් අධ්‍යාපන මණ්ඩලයකින් පාලනය වන, එකම විභාගයකින් සමත් වී ඇතුළු වන ශිෂ්‍යයන්ගෙන් යුක්ත සමාන ආයතන 4 ක්. රජයේ සම්පූර්ණ වියදමින් නඩත්තු වන, රජය විසින් පිළිගන්නා ලද, සමාන ආයතන 4 කින් වෙන වෙනම ප්‍රදානය කරන උපාධිවල වෙනසක් ලෝකයේ කොතැනකවත් ඇති වේ යැයි මා නම් හිතන්නේ නැහැ; වෙනසක් ඇති වන්නේත් නැහැ. එහෙත් එවැනි වෙනසක් ඇති වේ යැයි කවුරුන් හෝ අවංකවම සැකයක් පහළ කළා.

එහිදී මා විසින් එම ශිෂ්‍යයන් උසස් අධ්‍යාපන මණ්ඩලය වෙත යැවිය යුතුව තිබුණ නමුත්, උසස් අධ්‍යාපන මණ්ඩලය සහ මහාධිකාරී මණ්ඩලය සමඟ සාකච්ඡා කර ඔවුනට අනුග්‍රහයක් ලබා දිය යුතු යැයි සිතා මා කීවා, "එහෙම නම් එකම විභාගයක් ගන්නට සලස්වා, 1967 ඔක්තෝබර් මාසයට පෙර ඇතුළු වුණු ශිෂ්‍යයන්ට ලංකා

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

කල් තැබීම:

[ගරු ඊරියගොල්ල]

විශ්ව විද්‍යාලයේ උපාධි ලබා ගන්නට සලස්වා දෙන්නම්; ඒ පිළිබඳව නීතියෙන් බාධාවක් තිබුණොත් නීතිය වෙනස් කළ හැකියි" කියා. එදා ඒ ළමයින් එයින්ම සතුටු වුණා. අසතුටු වුණා යැයි යමකු කියනවා නම් එය අමූලික බොරුවක්. එදා ඔවුනට වුවමනා කළේ ලංකා විශ්ව විද්‍යාලයේ උපාධි ලබා ගැනීමටයි. කොළඹ විශ්ව විද්‍යාලයීය උපාධිය අළුත් එකක් නිසා එය ඔවුන්ගේ දියුණුවට, අනාගත අධ්‍යාපනයට බාධාවක් වේ යැයි ඔවුන් සිතුවා. ඔවුන් එසේ සිතුවේ අවංකවම යැයි මා හිතනවා.

මේ පිළිබඳ එකින් එක විස්තර කරන්නට මට දැන් මතක නැහැ. කලින් කථාවේදී මා ඒ විස්තර හැමෙකක්ම කියන්නට ඇති. හැබැයි මා කීවා, "නම පිළිබඳව වෙනසක් කරන්නට පුළුවන් දැයි සොයා බලා, අගමැතිතුමා සමග, කැබිනට් මණ්ඩලය සමග සාකච්ඡා කර විස්තර කියන්නම්; බැරි වුණොත් අඩු තරමින් මෙහෙමවත් කරන්නම්" කියා. මගේ මතකයේ හැටියට විශ්ව විද්‍යාලයේ ශිෂ්‍ය බල මණ්ඩලයේ සභාපති ශිෂ්‍යයාත් එදා හිටියා. නැත්නම් වෙන දවසකවත් හිටියා. "නම පිළිබඳව වෙනසක් කරන්නට පුළුවන් නම් කරන්නම්; බැරි නම් අනෙක නම් සිදු කර දෙනවාමයි" මා කීවා. ඊට පසුව—මා හිතන්නේ උත්තර දෙන්නට පමා වුණු නිසා—විශ්ව විද්‍යාලයේ ගුරු භවතකු—මා හිතන හැටියට මහාචාර්යවරයකු—පත්තරවල ප්‍රකාශයක් ප්‍රසිද්ධ කර තිබුණා, "එසේ ඇමතිවරයා යෝජනා කර තිබෙතත්, එය නීති විරෝධීය" කියා. එවැනි අය තමයි, එතැන ඉන්නේ. ඒ අය සැහෙන මිනිස්සු. ඒ පුද්ගලයා එම ප්‍රකාශය කළේ හොඳ අදහසකින් නම්, ඇමතිවරයා කියා තිබූ දේ නීති විරෝධී නම් ඒ පිළිබඳව ඇමතිවරයා සමග සාකච්ඡා කළ යුතුව තිබුණා; ඇමතිවරයාට උපදෙස් දිය යුතුව තිබුණා. එය නීති විරෝධී නම්, මේ ගරු සභාව ඉදිරියේ කාරණය විස්තර කර දී එම විරෝධී නීතිය වෙනස් කරන්නට ඇමතිවරයාට පුළුවනි. ඒ ප්‍රකාශය කර තිබෙන්නේ එක්කෝ අහිංසක ශිෂ්‍යයන් නොමග යවන අදහසින්; නැත්නම් මේ පිළිබඳව සමථයකට පැමිණෙන්නට දරන උත්සාහය ව්‍යර්ථ කරන අදහසින්; එහෙමත් නැත්නම් විශ්ව විද්‍යාලවල පවතින නොසන්සුන් තත්ත්වය නොදැනුවත්කමින්. මේ තුනෙන් එකක් අනුවයි, එම ප්‍රකාශය කර තිබෙන්නේ. එය නොදැනුවත්කමින් කළ ප්‍රකාශයක් නම්, ඔහු මහාචාර්ය ධුරයට සුදුසු නැහැ.

අනෙක් පුදුමය නම් මෙයයි: මහාධිකාරි මණ්ඩලය මා පත් කළේ කොළඹ විශ්ව විද්‍යාලය සඳහායි. අවාසනාවකට මෙන් එම මණ්ඩලයට නීතිඥයන් කීප දෙනකු වැඩිපුර පත් වී තිබෙනවා. කොළඹ විශ්ව විද්‍යාලයට පත් කරනු ලැබූ ඒ උදවිය මහාධිකාරි මණ්ඩලයේ පත්වීම් භාර ගෙන ඉන් පසු එයින් අස් නොවීම, නම ගැන කථා කරන සැටි ඇසීමෙන් මා පුදුමයෙනුත් පුදුමයට පත් වුණා. පත්වීම් භාර ගැනීමෙන් පසු ඒ උදවියටත් නම හොඳ නැති බව පෙනී ගොස් තිබෙනවා. ඒ නම හොඳ නැත්නම් ඒ සම්බන්ධයෙන් මට උපදෙස් දීම වෙනුවට මේ අය කර තිබෙන්නේ නම ගැන පුවත්පත්වලට නිවේදන පිටත් කිරීමයි. මෙවැනි දේ සිදු වෙතොත් මේ රටේ වැඩ කිරීම අමාරුයි. උගතුන් සමග වැඩ කරද්දී මෙවැනි දේ සිදු වන මේ රටේ දේශපාලනයේ නිරත අප සාමාන්‍ය මහජනයා සමග මේ තරමින්වත් වැඩ කරගෙන යෑම ආශ්චර්යයක් නොවෙයිද?

ශිෂ්‍ය ශිෂ්‍යාවනට නොයෙක් අදහස් දෙමින් ඔවුන් කුල්මත් කර මේ ප්‍රශ්නයට දේශපාලකයින් ඇතුළු වුණා. විශ්ව විද්‍යාලයීය ශිෂ්‍ය සටනට චීන පෙළේ නායකයාත්, සී. එම්. යූ. සංගමයේ නායකයාත් පැමිණ සිටිනු මා දුටුවා. ශිෂ්‍යයන් අවංක නම්—සමහර විට වැඩි දෙනා අවංකයි—අනුන්ගේ දේශපාලන අතකොළු බවට පත් වන්නට වුවමනා නැහැ. ශිෂ්‍යයන් නොමග යවා තමන්ගේ දේශපාලන පරමාර්ථයන් ඉටු කර ගැනීමට සූදානම් වන දේශපාලන නායකයන් ගැන මා අනුකම්පා කරනවා. කෙසේ හෝ අපේ ළමයින් නොමග යැවීම ගැන මා කනගාටු වෙනවා. මේ අය අන්තිමේදී වැඩ වර්ජනය කළා. ඉන් පසු පිටස්තර විශ්ව විද්‍යාලයකට සම්බන්ධ බල මණ්ඩලයක සභාපතිවරයකු වශයෙන් පෙනී සිටින, විශ්ව විද්‍යාලයීය ශිෂ්‍යයන්ගෙනුත් යුක්ත සමිතියක ස්වාමීන්වහන්සේ නමක් තවත් ශිෂ්‍යයන් කිහිප දෙනකු සමග මා හමු වී කියා සිටියේ මේ ළමයින්ට ආපසු පංක්ති

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

වලට යෑමට විධියක් තිබෙනවා නම් හොඳ
බවයි; ස්වල්ප දෙනකු විසින් විශාල පිරි
සක් අනාථ භාවයට පත් කරනු ලැබ සිටින
බව කියා සිටියා; පාඩම් හැදෑරීමට පිළිවෙ
ළක් නැති නිසා ආපසු යෑමට පිළිවෙළක්
සලසා දෙන්නැයි ඉල්ලා සිටියා. එය මට
අයිති දෙයක් නොවන බව මා කියා සිටියා.
මලලසේකර මහත්මයාට නැත්නම් මහාධි
කාරි මණ්ඩලයට එය අයිති වැඩකැයි මා
කියා සිටියා. ඉන් පසු මගෙන් කරන ලද
ඉල්ලීම කුමක්ද? ගරු ඇමතිතුමා එහාට
දන්නුවොත් උන්නැහේලා වැඩ පිළිවෙ
ළක් සලසනු ඇතැයි, මා සමග කිව්වා. එය
ඇසීමෙන් ළමයින් කෙරෙහි ඇති වූ අනු
කම්පාව නිසා, ඔවුනට පිහිට වීමේ බලාපො
රොත්තුවෙන් මා කළේ මවිසින් අත නො
ගැසිය යුතු ප්‍රශ්නයකට අත ගසන්නට
යාමයි.

එසේ ගොස් වූ දේ බලන්න, කථා
නායකතුමනි. හැම විද්‍යා පීඨයකටම අයත්
ශිෂ්‍ය නායකයින් එතොත් සාකච්ඡා කරන්
නෙමැයි මා ඉන් පසු ප්‍රකාශ කළා. ඒ අය
ආවා. ශිෂ්‍ය සංවිධානයේ නායකයා වශ
යෙන් එක් ළමයෙක් ආවා. තවත්, වෛද්‍ය
සංගමයේ සභාපති හා උප සභාපතිත්
ආවා. ඔය විධියට සියලුම පීඨවලින් නියෝ
ජිතයින් ආවා. ඒ සියලු දෙනාම බොහෝම
ආදරයෙන් පිළිගෙන සාකච්ඡා කළා. ඉන්
පසු මා ඒ අයට මෙසේ කියා සිටියා.
"හොඳයි, දැන් තිබෙන ප්‍රශ්නය මේ නම
පිළිබඳ ප්‍රශ්නය නොවැ? බාධාවකට
තිබෙන්නේ නම නම්, මේ ඔක්කොම
විපත්වලට හේතුව මේ නම වෙනස් කිරීම
නම්, මේ විශ්ව විද්‍යාලය ස්වාධීන විශ්ව
විද්‍යාලයක් කිරීමේ ප්‍රශ්නය මින් පසු
වෙලාවක, මේවා සතුටුදායක වන පරිදි පිළි
යෙළ කළාට පසු—සංසිඳුණාට පසු,
සමථයකට පැමිණි පසු—කල්පනා කර
බලමු. ඒ අනුව නැවතත් කොළඹ
විශ්ව විද්‍යාලය ලංකා විශ්ව විද්‍යාලයේ
ශාඛාව වශයෙන් තිබුණු තැනටම ආපසු
ගෙනාවොත් ළමයින් මොකද කියන්නේ?
කියා මා ඇසුවා. විරුද්ධ වන්නට බැහැ
නොවැ. විරුද්ධත්වයට හේතු වූ කාරණය
නැති කිරීම ගැන විරුද්ධ නොවිය
හැකියි. නීත්‍යානුකූලව එසේ කළ හැකි
බවට උත්තර දෙන්නැයි ඔවුන් කිව්වා.

දේශපාලකයන් කොපමණ දුරට එපා
වෙලා තිබෙනවාදැයි කියතොත්, දේශපාල
කයන් කියන වචනයක්වත් පිළිගන්නට
මේ රටේ අය සූදානම් නැහැ. ඒ තරමට
වන්නේ මෙතන කියන මිථ්‍යා කථා,
අරවා මේවා නිසයි. මා කිව්වා, "ඔව්, මා ඒ
ගැන කථා කරන්නම්" ය කියා. එය කැබි
නට් මණ්ඩලයට දමා කැබිනට් මණ්ඩලය
කැමති වුණොත් ඒ විධියට කටයුතු
යොදන්නම්ය කියා මා කිව්වා. මා එය කැබි
නට් මණ්ඩලයට ඉදිරිපත් කළා. හබරාදූවේ
ගරු මන්ත්‍රීතුමා දැන් මොනවාදෝ කිව්වා.
නමුත් කැබිනට් මණ්ඩලයෙන් මට සම්
පූර්ණ නිදහස දී තිබුණා. සමථයකට පත්
වන පරිද්දෙන් මෙය හැකි තරම් ඉක්ම
නින් නිරවුල් කරන්නට මට කැබිනට්
මණ්ඩලයෙන් අණ නැත්නම් බලය දී
තිබුණා. ඒ බලය ඇතිවයි මා කථා කළේ.
පසුව මා එය කැබිනට් මණ්ඩලයට ඉදිරි
පත් කළා. ඒ අවස්ථාවේදී කැබිනට් මණ්
ඩලය, "ඔව්, ඒ විධියට නම් ශිෂ්‍යයින්
එය පිළි අරගෙන පන්ති වර්ජනය අත්හැ
රියොත් අපත් එය අනුමත කරනවාය"
කිව්වා. වෙන කවුරු කුමක් කීවාද කියා මා
දන්නේ නැහැ.

පසුව මා ලියුමකුත් යැව්වා. ඒ ගැන මා
කණගාටු වෙනවා. විශ්ව විද්‍යාලයේ ශිෂ්‍ය
බල මණ්ඩලයත් අධ්‍යාපන අමාත්‍යවරයාත්
අතර ඇති වූ සාකච්ඡාවේ ප්‍රතිඵලයක් වශ
යෙන් කැබිනට් මණ්ඩලයේත් අනුදැනුම
ඇතිව කලින් ලත් බලයද ඇතිව මා යැවූ
ඒ ලියුමත් ආණ්ඩුවටත් ආණ්ඩුවේ නායක
යනටත් නිතරම මඩ ගසන්නට සූදානම් වී
සිටින පුද්ගලයකු අතට ගියේ කෙසේද
කියා මා දැන් දන්නවා. මට කණගාටුයි මේ
විශ්ව විද්‍යාල ගැන. මේවා සකස් කළ යුතු
බව ඇත්තයි. එහෙම කළොත් වර්ජනය
අත හරිනවාය කී නමුත් ඒ වචනයෙහි
පිහිටියේ නැහැ. වර්ජනය තව දුරටත්
ගෙන ගියා. සමහර විට ලියුම සමච්චලයට
භාජන කරන්නට ඇති. ඒ වැඩේ සිදු වී
තිබෙන හැටි මට දැන් පෙනෙනවා. ඊට
පසුව තමයි මා අගමැතිතුමා හමුවට ආවේ.
ඒක පිළිගත්තේ නැහැ, වර්ජනය ගෙන
යනවා, එම නිසා අගමැතිතුමා ඉදිරිපත්
වී මෙය සමථයකට පත් කරන්නට උත්
සාහ කරන්නය කියා මා අගමැතිතුමාට
කිව්වා. එතැන සිට කථාව තමුන්නාන්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ගරු ඊරියගොල්ල]

සේලා දන්නවා. අගමැතිතුමාගේ වචන හැන්සාඩ් වාර්තාවේ තිබෙනවා. හබරාදූවේ මන්ත්‍රීතුමා ඒ වචනත් වෙනස් විධියකට විස්තර කරන්නට උත්සාහ කිරීම ගැන මා කණගාටු වෙනවා. රටේ ස්ථිර පුද්ගලයා තමන්ගේ මිම්මෙන් මණින්නට එපා. තත්ත්වය ඒකයි. ඊට පසු අගමැතිතුමා ඉදිරිපත් කළ විසඳුම තමයි ඒ. එය හැන්සාඩ් වාර්තාවේ තිබෙනවා. එම නිසා මා ඒ ගැන කථා කරන්නට අදහස් කරන්නේ නැහැ. උප කුලපති, උසස් අධ්‍යාපන මණ්ඩලයේ සභාපති ඇතුළු සියලු දෙනාම සමග සාකච්ඡා කර එම තීරණයට බැස්සා.

මේ වෛද්‍ය ශිෂ්‍යයන් වෙනමම විශ්ව විද්‍යාලයක් ඉල්ලන්නට පටන් ගත්තේ හුඟක් පසු වෙලයි. කලින් වුවමනා කළේ ශ්‍රී ලංකා විශ්ව විද්‍යාලයේ උපාධියයි. දවසින් දවස සතියෙන් සතිය මේ අයගේ අදහස් මොන මොන විධියට වෙනස් වෙන වාද කියා මා දන්නේ නැහැ. අනාගතය ගැන මා කණගාටුයි.

අර්බුද ගැන දැන් කථා කරනවා. අප බලයට පත් වී තවම අවුරුදු දෙකකුත් මාස අටක් පමණයි. කොයි කාලයේ ඉගෙන ගත් අයද මේ? කොයි කාලයේ ඇති වූ අර්බුදද මේ? විද්‍යාලංකාර විශ්ව විද්‍යාලයේ දූෂණ ගැන කථා කරනවා. මේවා කොයි කාලයේදී ඇති වූ දූෂණද? මේවා විසඳන්නට අපට කෝ කාලයක්? සමහර විට ළඟ දීම ඔඩිට් වාර්තා පිට වෙනවා ඇති. උසස් අධ්‍යාපන මණ්ඩලය ඒවා පිළිබඳව කටයුතු කරනවා ඇති. දකුණු කොළඹ ගරු මන්ත්‍රීතුමා (බර්නාඩ් සොයිසා මයා.) මේ කරුණු ගැන හොඳට දන්නවා. සමහර විට ඒ අයගේ වැඩ තවම පටන් ගෙන නැතිව ඇති. "ඔටොනොමි" එක ඉල්ලා කෑගැසූ නිසා අප "ඔටොනොමි" එක දී තිබෙනවා. අධ්‍යාපන ඇමතිතුමා ඒ "ඔටොනොමි" එකට ඇඟිලි ගසන්නට යන්නේ නැහැ. උසස් අධ්‍යාපන මණ්ඩලය පත් කර තිබෙනවා. ඒ පත්වීම් හරිද වැරදිද කියා මා දන්නේ නැහැ. ඒ වැඩේ තවමත් නොකෙරුණා නම් මා කණගාටු වෙනවා. උසස් අධ්‍යාපන මණ්ඩලයට මා ඒ ගැන මතක් කරනවා. මේ කරුණු තිබෙනවා නම් ඒවා උසස් අධ්‍යාපන මණ්ඩලයට මතක් කර



සුදුසු වැඩ පිළිවෙළක් යෙදිය යුතුය කියා අගමැතිතුමා දැන් මට කියා සිටියා. උප කුලපති හැඳීමටත්, විශ්ව විද්‍යාල හැඳීමටත්, ඇමතිවරුන් හැඳීමටත් පෙර තමන්ගේ කටයුතු සාමකාමීව තර්ජනයෙන් තොරව කර ගැනීමට ශිෂ්‍යයන් සකස් කිරීමටයි අප බලාපොරොත්තු වන්නේ. අලුත් අධ්‍යාපන පනත ක්‍රියාත්මක වුණාට පසුව අපට ඒ කාර්යය ඉටු කිරීමට පුළුවන් වනවා ඇති.

මෙලෙස ගියොත් අපට අනාගතයක් නැහැ. අපේ සමාජයේ උසස්ම දක්ෂම පිරිස වශයෙන් තෝරා කෝටි ගණනක් වියදම් කර, මේ ආණ්ඩුව හෝ වේවා ගිය ආණ්ඩුව හෝ වේවා, එන ආණ්ඩුව හෝ වේවා කරන වියදමෙන් තමන්ට මෙන්ම සමාජයටත් පිරිමැස්මක් ඇති වන ලෙසත්, ආදර්ශයක් වන ලෙසත් කටයුතු කිරීම ඒ උසස් දක්ෂ පිරිසගේ යුතුකමයි. එහෙත් එක එක දේශපාලකයන් සහ දේශපාලන පක්ෂ තර කිරීමේ යෙදෙන්නට ගියහොත් අපට රටේ නායකත්වයක් නැතිව යනවා. මේ පසුගිය අවුරුදු 25ක් තිස්සේම නායකයකු බිහි කරන්න විශ්ව විද්‍යාලයට බැරි වුණා. 1942 දී පටන් ගත්තා. අද 1967 යි. කොහොමද නායකයන් බිහි කරන්නේ? නායකත්වයට සුදුසු, ඇතුළේ සිටින අය පිටස්තර දේශපාලකයන්ගේ අතකොලු බවට පත් වනවා නම් කොහොමද නායකයන් බිහි කරන්නේ? අප බලාපොරොත්තු වන්නේ, විශ්ව විද්‍යාලයට එන උසස්ම දක්ෂම අය නිදහස්ව තමන්ගේ දියුණුව පමණක් තකා නොව ජාතියේ අනාගතයද තකා ජාතියේ නායකත්වය ගන්නට සුදුස්සන් වීම මිසක් චීන පිළට හෝ වෙන පිළකට හෝ කත් අදින අනුගාමිකයන් වීම නොවෙයි. මා අදහස් කරනවා, විශ්ව විද්‍යාල ශිෂ්‍යයන් එය සලකා බැලුවොත් මෙයින් තම ජාතියට කරන්නා වූද තමන්ටම කර ගන්නට යන්නා වූද විපතෙන් මිදෙන්නට ඒ තරම් වෙලාවක් ගත නොවේය කියා.

සභාපතිතුමනි, මෙහි තවත් කාරණයක් තිබෙනවා. අගමැතිතුමා කිව්වා, 1967 ට කලින් බැඳුණු අයට පමණක් නොව, 1967 දී බැඳුණු අයට වුණත් ලංකා විශ්ව විද්‍යාල උපාධිය ගන්නට කැමති නම් එය

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ගන්නට ඉඩ සලසා දෙනවාය කියා. ගුරුවරුන් කියනවලු එහෙම බැරිය කියා. ගුරුවරුයැ නීතිය හදන්නෙ? ගුරුවරුන් නොවෙයි, නීති සාදනු ලබන්නේ අප විසිනුයි. අමාත්‍යයා කියනවා නම් පුළුවන් කියා කොහොමද ගුරුවරුන් ඊට උඩින් බැහැ කියන්නේ. එක එක පත්තරේ දානවා එක එක ඒවා කියනව කියා. ගුරුවරුන් ඔපමණ හොඳනම්—මා කනගාටුවෙන් සඳහන් කරන්න කැමතියි, ළමයින් සියයක් හසුරුවා ගන්නට පුළුවන් එකම ගුරුවරයකු නැති බව. ඒ නිසා මේ ළමයින්ගෙන් අප අනාගතයේදී හොඳ ගුරුවරුන් හදන්න බලාපොරොත්තු වනවා. ගුරුවරුන්ට පුළුවන්කම තිබිය යුත්තේ ළමයින් පෙළඹවීම නොවෙයි; ළමයින් ආණ්ඩුවට විරුද්ධව වැඩ කරන දාමරික පිරිසක් කිරීම නොවෙයි; සාමකාමී මධ්‍යස්ථ මතධාරී හරි වැරදි තේරෙන ජාතියේ අනාගත පරම්පරාවට ආදර්ශයක් දක්වන නායකයන් බවට පත් කිරීමයි. එසේ වේවාය කියා මා ප්‍රාර්ථනා කරනවා.

දැන් කථා කරනවා, කොළඹ විශ්ව විද්‍යාලයට 5 ලක්ෂයයි, පේරාදෙනි විශ්ව විද්‍යාලයට 11 ලක්ෂයයි කියා; දූන් ක්‍රමයේ හැටියට 16 දෙකට බෙදෙන්නේ 11 සහ 5 වශයෙනුයි කියා මෙයින් පෙනෙනවා නොවේද සමහර ළමයින් නොමඟ යවා තිබෙන තරම? පේරාදෙනියේ ළමයින්ගේ නේවාසික ස්ථාන 9ක් තිබෙනවා. ශාලා ගණනාවක් තිබෙනවා. වත්තත් සමග අක්කර 500කට වැඩි ප්‍රදේශයක් තිබෙනවා. ඒ සියල්ලම පරිපාලනය කළ යුතුයි. ඒ ඇරුණු විට රෙජිස්ට්‍රාර්ට, උපකුලපතිට ගාස්තු ගෙවිය යුතුයි. ඒ විධියේ නොයෙක් වියදම් තිබෙනවා. මෙහාට වඩා ගුරුවරුන් ඉන්නවා. මීට වඩා විද්‍යා පීඨ තිබෙනවා. කොළඹ තත්ත්වය ඊට වෙනසි. එසේ වුණත් කොළඹ ඉඩකඩ අතින් දුර්වල බව අප දන්නවා. ශාලා ආදිය හරි හැටි නැහැ. බලාපොරොත්තු රහිතව එක විටම ළමයින් 3,000ක් බඳවාගන්නට සිදු වුණා. මේවා හරියට අප කළ වැරදි හැටියටයි පණ්ඩිතවරුන් වාගේ විරුද්ධ පක්ෂයේ ඉඳගෙන අපූරුවට කථා කරන්නේ. කවුරු කළ ඒවාද මේ? කවුද මේ අපරාධය කෙළේ? අපේ ආණ්ඩුවද? එසේ නැත් නම් ඊට කලින් සිටි ආණ්ඩුවද? දූනගෙන හෝ නොදූන හෝ මේ විපත සිදු වී තිබෙනවා. මෙය ජාතික විපතක්. දකුණු කොළඹ මන්ත්‍රීතුමා කිව්වා වාගේ අප කවුරුත් එකතු වී මේ ජාතික විපතෙන් මේ රටත් ළමයිණුත් අනාගත පරම්පරාවත් ආරක්ෂා කළ යුතුයි. එයට අනුබල දෙනවා වෙනුවට මේ ලෝකෙ නැති වල් භූත දොඩවමින් පටියට පල්ලයහින් ගහන්න උත්සාහ කරමින්, ඉස්සරහින් හෝ පස්සෙන් හෝ ඕනෑ තැනකින් —[බාධාකිරීම්] මේ තර්කයෙන් දිනන්නය ආවෙ. සත්‍යය තර්කය නොවෙයි. තර්කයට සත්‍යය අසු වන්නෙ නැහැ. ඕනෑම දෙයක් ගැන තර්ක කරන්නට පුළුවන්. තර්කයෙන් සත්‍යය යටපත් කරන්නට බැහැ. ඒ නිසා මේ අපරාධය කර ගන්නට එපාය කියා මා ඉල්ලා සිටිනවා. පාඩුව තමන්ටමයි. ආණ්ඩුවට විරුද්ධව රැස්වීම් ටිකක් තබන්නට පුළුවන්. ශාලා සම්බන්ධයෙන් හෝ කථිකාචාර්යවරුන් හිඟ වීම නිසා හෝ යම්කිසි කරදරයක් හෝ අපහසුවක් හෝ සිදු වී තිබෙනවා නම් ඒ පිළිබඳව කටයුතු කිරීමට අගමැතිතුමා නියම කර තිබෙනවා. ඒක කරන්නට දෙන්නෙ නැහැ. තර්ජනය කරනවාය කියා හිතන්නට එපා. ළමයින්ගෙ අනාගතය නැති කරන්නට අප බලාපොරොත්තු වන්නේ නැහැ. අවුරුදු විසි ගණනකට අපට නායකයකු බිහි කර ගන්නට බැරි වුණා. පරණ නායකයන් නැති වුණාම ඉන්නෙ කව්ද? හබරාදුවේ මන්ත්‍රීතුමා (ප්‍රින්ස් ගුණසේකර මයා.) කීවා නායකයන්ගේ නාකිකම් ගැන. නාකි ටික ඉවර වුණාම මොක්කුද, උන්ගෙ තැන ගන්නෙ? ඒ නිසා මේ ළමයින්ගෙන්වත් අනාගත නායකයන් සකස් වේවායි අප ප්‍රාර්ථනා කරනවා.

ලෝකයේ වෙන තැන්වල විකාර කළාට අප විකාර කරන්නට වුවමනා නැහැ. එංගලන්තයේ හෝ කැලිෆෝර්නියාවේ හෝ ස්ට්‍රයික් කළාට අප ස්ට්‍රයික් කරන්නෙ මොකටද? ඒ අයගේ වනචරකම්, අශීලාචාරකම්, අප අනුගමනය කරන්නෙ ඇයි? ලෝකයේ ඉතාම උදාර ධර්මයක් උඩ ගොඩනැගුණු සංස්කෘතියක් යටතේ සකස් වුණු අපේ ජාතිය දැන් නැති වේගෙන යනවා. ඒ ජාතිය යථා තත්ත්වයට ගෙන ඒමේ ශක්තිය විශ්ව විද්‍යාල

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ගරු ඊරියගොල්ල]

ශිෂ්‍යයන්ට ලැබේවායි මා ප්‍රාර්ථනා කරන වා. ඔවුන්ගේ අඩුපාඩු තියෙනවා නම් ඒවා නියම විධියට හරිගස්සවා ගන්නට ඕනෑ. එක් එක්කෙනා කියන විධියට කරන්නට බැහැ. එක එක තැන්වල රැස්වීම් තබනවා. රැස්වීම් තබා මේවා කාටද කියන්නෙ? උඩුබද්දාවේ රැස්වීමට 37 දෙනකු සිටියලු. ඒ 37 දෙනාද මේවා හදන්නෙ? හොඳ වෙලාවට කුලියාපිටියට ගියේ නැහැ. ගියා නම් මා කණගාටු වෙනවා. අපට විරුද්ධව යම් යම් ප්‍රකාශ කිරීමෙන් සමහර දේශපාලන පක්ෂවලට වාසි වන්නට පුළුවන්. ඒවාට නොරැවටෙන ලෙස ළමයින්ගෙන් මා ඉල්ලා සිටිනවා.

ව්‍යවස්ථා අනුව සකස් වුණු ශිෂ්‍ය බල මණ්ඩලයක් කොළඹ විශ්ව විද්‍යාලයට නැහැ. එහෙම බල මණ්ඩලයක් නැතිව තියෙද්දී පරණ බල මණ්ඩලයට අප ඇහුම් කන් දුන්නා. ඇහුම්කන් දීමේ ප්‍රතිඵලය තමයි, මේ. හොඳ අදහසින් දුන් ඒ පොරොන්දුව සඳහන් ලිපිය, ශිෂ්‍ය බල මණ්ඩලයේ නායකයා කියන පුද්ගලයා, අපට හෙළා තළා කථා කරවන්නට වෙන මිනිසුන් අතට භාර දුන්නා. ඒ ගැන කනගාටුයි. එවැනි දේ මීට පසු නොකෙරේ යයි මා බලාපොරොත්තු වෙනවා. අපේ උදාර ජාතික සභ්‍යත්වය ආරක්ෂා කර ගෙන හොඳ මග ගොස් අනාගතයේදී ඇති විය හැකි නායකත්වය දැරීමට සුදුසු ස්වාධීන අදහස් ඇති උදාර පුද්ගලයන් වීමේ මහඟු චේතනාව ඔවුන්ගේ හදපත්වල මතු වේවායි මා ප්‍රාර්ථනා කරනවා.

අපට කරන්නට පුළුවන් හැම දෙයක්ම කරන බව අවසාන වශයෙන් මා ප්‍රකාශ කරනවා. සාකච්ඡා කර ඒ කටයුතු කරන්නට අප බලාපොරොත්තු වෙනවා. පන්ති වර්ජනයෙන් අපට පාඩුවක් නැහැ. හෙට සිට පන්ති වර්ජනය අත්හරින ලෙස මා ඉල්ලා සිටිනවා. අත්නොහරිනවා නම් මට කරන්නට දෙයක් නැහැ.

**එකල්හි වේලාව අ. භා. 7.30 වූයෙන්, කථානායකතුමා විසින් ප්‍රශ්නය නොවිමසා මන්ත්‍රී මණ්ඩලය කල් තබන ලදී.**

**මන්ත්‍රී මණ්ඩලය ඊට අනුකූලව 1967 නොවැම්බර් 21 වන අඟහරුවාදා පූ. භා. 10 වන තෙක් කල් ගියේය.**

*அப்போது பி. ப. 7.30 மணியாகிவிடவே கௌரவ சபாநாயகர் அவர்கள் வினு விடுக்காமலேயே சபையை ஒத்திவைத்தார்கள்.*

*அதன்படி, சபை 1967 நவம்பர் 21, செவ்வாய்க்கிழமை மு.ப. 10 மணிவரை ஒத்திவைக்கப்பெற்றது.*

*And it being 7.30* P.M., MR. SPEAKER *adjourned the House without Question put.*

*Adjourned accordingly until 10* A.M. *on Tuesday, 21st November 1967.*

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

දායක මුදල් : මුදල් ගෙවන දිනෙන් පසුව ඇරඹෙන මාසයේ සිට මාස 12ක් සඳහා රු. 32.00යි. අශෝධිත පිටපත් සඳහා නම් රු. 35.00යි. මාස 6කට ගාස්තුවෙන් අඩකි. පිටපතක් ශත 30යි. තැපෑලෙන් ශත 45යි. මුදල්, කොළඹ ගාලු මුවදොර, මහලේකම් කාර්යාලයේ රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත කලින් එවිය යුතුය.

சந்தா : பணம் கொடுத்த தேதியை யடுத்துவரும் மாதம் தொடக்கம் 12 மாதத்துக்கு ரூபா 32.00 (திருத்தப்படாத பிரதிகள் ரூபா 35.00). 6 மாதத்துக்கு அரைக்கட்டணம்; தனிப்பிரதி சதம் 30, தபால்மூலம் 45 சதம், முற்பணமாக அரசாங்க வெளியீட்டு அலுவலக அத்தியட்சரிடம் (த. பெ. 500, அரசாங்க கருமகம், கொழும்பு 1) செலுத்தலாம்

Subscriptions : 12 months commencing from month following date of payment Rs. 32.00 (uncorrected copies Rs. 35.00). Half rates for 6 months, each part 30 cents, by post 45 cents, payable in advance to the SUPERINTENDENT, GOVERNMENT PUBLICATIONS BUREAU, P. O. Box 500, Colombo 1

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org